# සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය

# 2016

තුන්වන වෙළුම, පළමුවන කලාපය

# Social Statistics

# 2016

## Journal of Social Statistics

Volume 03, Issue 01

ප්‍රකාශනය

සමාජ සංඛ්‍යානය ශිෂ්‍ය සංගමය

ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය

කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව

සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය 2016 - ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය ශිෂ්‍ය සංගම් වාර්ෂික ප්‍රකාශනය

මුද්‍රණය 2016 නොවැම්බර්

ISSN-2420-7381

සංස්කාරක : තාවකාලික කථිකාචාර්ය අපේක්ෂා ඇඹුල්දෙනිය

සහාය සංස්කාරකවරු : ඩී. එස්. කොඩිතුවක්කු
ඒ. කේ. එම් ද සිල්වා

පරිගණක පිටු සැකසුම :

කවර නිර්මාණය : එල්. ජී. ඩී. පෙරේරා

තෙවන වෙළුම, පළමුවන කලාපය

කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය ශිෂ්‍ය සංගමය විසින් ප්‍රකාශයට පත් කරන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි දෙවන කලාපය ප්‍රකාශන අනුග්‍රහය

# සඟරා ලිපි විමර්ශන මණ්ඩලය


- මහාචාර්ය උපාලි හෙට්ටිආරච්චි මයා (අංශාධිපති)
  *B.A.(Perad'ya), M.A.(Kel'ya)*

- ආචාර්ය එච්. ආර්. අනුලාවතී මැණිකේ මිය
  *B.A. (Kel’ya), M.A. (S.J’pura), Ph.D (Pune)*

- ආචාර්ය මංජුල ගුණරත්න මයා
  *B.A. (Kel’ya), MSSc (Kel’ya), Ph.D (UMS)*

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නාමල් බාලසූරිය මයා
  *B.A. (Kel’ya), M.A. (Kel’ya), M.Phil (Kel’ya)*

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සී. ඩී. චතුරංග මයා
  *B.A. (Kel’ya), M.A. (Kel’ya)*

# සංස්කාරක පෙරවදන

කැලණිය විශ්වවිද්‍යාලයේ, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ, සමාජ සංඛ්‍යානය ශිෂ්‍ය සංගමය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය මඟින් සමාජ සංඛ්‍යානය විෂයය හදාරණ විද්‍යාර්ථීන්ගේ ශාස්ත්‍රීය ලේඛන කුසලතා වර්ධනය කිරීම සඳහා මෙම වසරේ දී එහි තුන්වන වෙළුම එළි දැක්වේ. නව දැනුම ගවේෂණය කිරීම තුලින් ශාස්ත්‍රීය අවබෝධය වර්ධනය කරගැනීම සහ එහි විවිධ පැතිකඩයන් ඔස්සේ විශ්වවිද්‍යාල කාලපරිච්ඡේදය තුළ ගවේෂණයන් සිදුකිරීමට විද්‍යාර්ථීන් උනන්දු කරවීම මෙහි අරමුණ වී ඇත. එලෙස රැස්කරගත් දැනුම් සම්භාරය ඒකරාශී කර මෙම ශාස්ත්‍රීය සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමට ගත් උත්සාහය අගයකොට සැලකිය යුතුය. කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය ශිෂ්‍ය සංගමයේ තවත් එක් පියවරක් ඉදිරියට තබමින් තුන්වන වරටත් 2016 වර්ෂය සඳහා සමාජ සංඛ්‍යානය සඟරාව ප්‍රකාශයට පත් කරනු ලබයි.

මෙම සඟරාව ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය මූලික මඟපෙන්වීම සිදුකළ ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති මහාචාර්ය උපාලි හෙට්ටිආරච්චි මහතාත්, සඟරාව එළි දැක්වීමේ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නාමල් බාලසූරිය මහතාත් කෘතඥතාවයෙන් යුතුව සිහිපත් කරමි. එමෙන්ම ලිපි විමර්ශනයෙන් දායක වූ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ සියලුම ආචාර්ය මණ්ඩලයටත්, ලිපි ලබාදුන් සමාජ සංඛ්‍යානය විශේෂවේදී උපාධිය හදාරණ විද්‍යාර්ථීන් සියලු දෙනාටත්, ශාස්ත්‍රීය සංග්‍රහය මුද්‍රණය කිරීමට සහයෝගය ලබාදුන් සැමටත් මාගේ හෘදයාංගම කෘතඥතාව පළකර සිටිමි. එමෙන්ම ඉදිරි වර්ෂවලදී ත් මෙම සඟරාව අඛණ්ඩව සිදුකිරීම සඳහා සුභාශිංසන පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගනිමි.

අපේක්ෂා ඇඹුල්දෙනිය

තාවකාලික කථිකාචාර්ය,

ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය,

කැලණිය විශ්වවිද්‍යාලය.

# පටුන


Sri Lankan youth and their disclosure to computer literacy: Review………1

වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපන කුසලතා සහ ආර්ථිකමය බලපෑම………...9

ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැර යාමට බලපානු ලබන සාධක පිළිබඳ විමසුමක් …………………………………………………………………………..17

Ethical Issues in Social Science Research: A Review……...……………..26

ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය…………………………………………...34

Workplace stress in nursing: a literature review…………………………..…47

විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන සාර්ථකත්වය කෙරෙහි සේවානියුක්තියේ බලපෑම (කැලණිය විශ්ව විද්‍යාලය ඇසුරින්)………………………………..…54

ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජීය, ආර්ථික සාධකඃ ආනුභාවික අධ්‍යයනයක් ඇසුරින්……………………………60

A review of socio-economic factors affecting for diabetes……………….73

A review of Socio Economic Factors impact on Cancer incidence………82

ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම් සදහා බලපාන සාධක පිලිබඳ ආනුභවික අධ්‍යයනයක්……………………………………………………………..…..91

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ වත්මන් ප්‍රවණතා හඳුනා ගැනීම…………….100

# Sri Lankan youth and their disclosure to computer literacy: Review

U.R.G.D.A.K Moragolla[1]


## Abstract

Computer literacy is essential for success in the developing world (Hindi et al., 2016). The global acceptance of Information and Communication Technology (ICT) has majorly captured the area of education, as it plays a predominant role in creating well qualified generation (Godamanna et al. 2013). Furthermore, computer literacy is an important variable in economic growth and promoting development in 21st century (Tharanganie et al., 2011). The objective is to study is to explicate the degree of computer literacy and exposure to the internet among Sri Lankan youth. Qualitative data analyzing models was mostly used in data analyzing in prior surveys. There are some findings derived from prior surveys. The highest proportion age group of computer literacy is students when consider about age and economic activity of youth. Among them, highest proportion belongs to 18-24 years age group. In considering about sex and age group, percentage of male respondents with computer knowledge is higher than the female respondents. Approximately 60% of the male respondents were computer literate when compared to the 55% of computer literate females. The computer literacy among unemployed population, the highest proportion represents by age group 25-29 among other youth agers. In conclusion, computer literacy of youth in Sri Lanka mainly distributed among male population than female population. Further 25-29 age group has well qualified computer literacy than other youth agers. Improving skills of computer literacy is necessary step that must be taken due to effect of globalization at present.


**Key Words:** Computer literacy, Youth, Information Technology

[1] Department of Economics, University of Kelaniya. dilini.moragolla@gmail.com

## Introduction

The global acceptance of Information and Communication Technology (ICT) has majorly captured the area of education, as it is an important method to create a technology equipped generation (Godamanna et al. 2013). Computer capabilities are essential for success in the developing world (Hindi et al., 2016). Computer literacy is essential in present world and especially youth are expected to possess adequate knowledge and skills in using information and communication technologies (ICT) (Kozina et al., 2012). Furthermore, some researchers states that the computer is essential for quality education. Thus having good computer knowledge improves the quality of their study programs (Tharanganie et al., 2011). Furthermore, information technology plays a predominant role in economic growth and promoting development and nothing to do during the second half of the 21st century that has touched so many lives, than the computer (Tharanganie et al., 2011).

Some researchers state that many higher educational institutes consider computer literacy a top educational goal such as improving work ability of youth generation. Computer literacy can be defined in many ways (Kozina et al., 2012). Reynolds and Fletcher-Janzen points out those thedifferent educational levels have differing computer needs. Computer literacy is a mixture of awareness such as knowledge of what computers are and how they work and ability to interact with computers (Tharanganie et al., 2011). It means computer literacy involves conceptual knowledge related to basic terminology like as social, ethical, legal, and global issues and skills necessary to perform tasks in word processing, database, spreadsheets, presentation, graphics, and basic operating system functions (Tharanganie et al., 2011). Mason and Mc Morrow (2006) suggested there are two distinct components to computer literacy, awareness and competence. Awareness means that a person has understanding of how computers affect their day today life and competence requires that a person be able to exhibit a hands-on expertise with a software application. Both of these components should be evaluated when looking at computer literacy (Jenkins, 2008).

Hence the computer literacy is important qualification especially in job market and many fields.

As a developing country like Sri Lanka it is important to have a strong foundation of information technology in order to take opportunities offered by globalization (Silva et al., 2013). Therefore, during the past, all governments attempted to improve computer literacy among Sri Lankan youth through various policies and programmers (Silva et al., 2013). As a result of it, computer literacy developing programs launched regional wise such as Nenasala, Vidatha Resources Centre for the purpose of improving computer literacy skills especially among youth (Kapadia, 2005). Improving skills of computer literacy is urgent step that must be taken due to effect of globalization at present.

**Results**

A survey in 2009 with random sample of 3000 households distributed in 22 accessible districts. Household members aged 15-29 years were taken as youth in this study. Only one eligible youth in a selected household was interviewed, selecting randomly. The survey derived some results about Sri Lankan youth and their exposure to computer literacy.

Table 1: Percentage of youth with computer literacy by age and economic activity (2009)

| Economic activity | 15-17 Years(%) | 18-24 Years (%) | 25-29 Years (%) |
|---|---|---|---|
| Student | 62.4 | 88.6 | 68.8 |
| Employed | 25 | 47.5 | 45.6 |
| Unemployed | 41.3 | 61.6 | 49.4 |
| Household Work | 50 | 31.5 | 28.8 |

Source: Sri Lankan Youth and their Exposure to Computer Literacy (2013)

Figure 1: Percentage of youth with computer literacy by age and economic activity (2009)




Source: Sri Lankan Youth and their Exposure to Computer Literacy (2013)

According to the figure highest proportion age group of computer literacy is students. Among them, highest proportion belongs to 18-24 years age group. The lowest proportion represented by employed and most of them belong to 15-17 years age group. When consider about percentage of them, computer Literacy youth group aged 15-29, concerning occupation was that the highest proportion of youth 34% was students, while 23% claimed to be unemployed and 11% were engaged in household activities.

Table 2: Percentage of youth with computer literacy by age and sex

| Age Group | Male | Female |
|---|---|---|
| 15-17 | 58.7 | 56.4 |
| 18-24 | 66.4 | 62.4 |
| 25-29 | 42.2 | 42.8 |

Source: Sri Lankan Youth and their Exposure to Computer Literacy (2013)

Figure 2: Percentage of youth with computer literacy by age and sex




Source - Sri Lankan Youth and their Exposure to Computer Literacy (2013)

According to the above graph, percentage of male respondents with computer knowledge is higher than the female respondents. Approximately 60% of the male respondents were computer literate when compared to the 55% of computer literate females and this pattern is recurrent in all the age-groups except the 25–29 age group.

The survey Department of Census and Statistics Sri Lanka in 2014 derived some results about computer literacy of youth. The Department of Censes and Statistic of Sri Lanka [DCSSL] conducted surveys on computer literacy in 2004, and 2006/2007. In 2009, a third Computer Literacy Survey (CLS) was conducted for further results. A nationally distributed sample of 10,150 households with 31,302 persons aged 5 – 69 years were enumerated for this issue of the CLS and all the districts were covered other than those in the Northern Province.

Table 3: Computer literacy among unemployed population (Aged 15 – 69 years) by age group – 2014

| Age group (Years) | Computer literate population ( %) |
|---|---|
| 15-19 | 64.8 |
| 20-24 | 73.7 |
| 25-29 | 75.9 |
| 30-39 | 61.3 |
| 40-69 | 43.5 |

Source: Department of Census and Statistics – 2014

The unemployed youths (15 – 29) have high proportion of computer literacy. Further, Sri Lanka Quarterly Labor Force Survey reports higher unemployment rates among youth (aged 15 – 29 years). The computer literacy results reveal that among unemployed many have at least some ICT skills. For example among aged 25-29 unemployed group, every three out of four are computer literate.

## Conclusion

Computer literacy of youth in Sri Lanka mainly distributed among male population than female population. Further 25-29 age group has well qualified computer literacy than other youth agers. The highest proportion age group of computer literacy is students when consider about age and economic activity of youth. Among them, highest proportion belongs to 18-24 years age group. The computer literacy among unemployed population, the highest proportion represents by age group 25-29 among other youth agers.

**List of References**

Dawatawaththa, V.N. Jayawardena S.K.R. Kallora K.M.U.K. Kandegedara A.P. Wanigasekara W.S.M.B.S. Ekanayake T.M.S.S.K.Y. (2012). A case study to explore whether teachers use their computer literacy to enhance the effectiveness of teaching in secondary level classes, *Book of Abstracts of the Peradeniya University Research Sessions*, Sri Lanka, Vol. (17).

Department of Census and Statistics Sri Lanka. (2014). *Computer Literacy Statistics*, January - June – 2014

Godamanna E.H. & Jayamaha A**.** Information and Communication Technology Facilitated Education in National Universities of Sri Lanka. (2013). *Journal of Emerging Trends in Educational Research and Policy Studies (JETERAPS)*, 4(5): Scholarlink Research Institute Journals, 2013 Retrieved from jeteraps.scholarlinkresearch.org

Hindi N.M. Miller D. & Wenger j. (2004). Computer Literacy: Implications for Teaching a College-Level Course, *Journal of Information Systems Education*, Vol. 13(2) 143

Jenkins D.R. (2008). *Computer literacy, access and use of technology in the family and consumer sciences classroom*, University of Kentucky Master's Theses Paper 515. Retrived from http://uknowledge.uky.edu/gradschool_theses/515

Kapadia K. (2005). *Developing information technology, Information technology for development: A study of ICT and rural development in Sri Lanka.*

Kozina G., Dukić G., & Dukić D. (2012). A study of computer literacy among Croatian students as support in planning the higher education development, *Technical Gazette* 19, 4, 735-742

Ranasinghe P., Wickramasinghe S.A., Pieris W.A.R., Karunathilake I., Constantine G.R., & (2012). Computer literacy among first year medical students in a developing country: A cross sectional study, *BMC Research Notes* 2012**5**:504

Silva W.I.D., Kodikara p., Somarathne R., & (2013). Sri Lankan Youth and their Exposure to Computer Literacy, *Sri Lanka Journal of Advanced Social Studies* Vol. 3 - No. 1

Tharanganie T.H., Wickremasinghe W.N., & Lakraj G.P., (2011). An Assessment of Computer Awareness and Literacy among Entry-Level University of Colombo Undergraduates: A Case Study, *International Journal on Advances in ICT for Emerging Regions* 2011 04 (01): 15 - 25

# වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපන කුසලතා සහ ආර්ථිකමය බලපෑම

එච්. පී. එන්. නිමාලි රත්නායක[1]


## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ජන සමාජයේ වතු අංශයේ සංවර්ධනය මට්ටම අඩු සංවර්ධන තත්ත්වයක් දක්නට ලැබුණද ශ්‍රී ලංකාවේ දළ දේශිය නිෂ්පාදනයට වතු කම්කරු දායකත්වය සුවිශේෂි වේ. වතුකරයේ අධ්‍යාපනය තත්ත්වය සැලකිමේදි වතු පාසල්හි අනිවාර්යය අධ්‍යාපනය ස්ථාපිත වීමත් සමග අධ්‍යාපනයට යොමු වුවද අධ්‍යාපනයේ සාර්ථකත්වය සැලකිය යුතු තරම් ඉහල මට්ටමක නොපැවතුණි. එබැවින් මෙම අධ්‍යනයේ ගැටලුව ලෙස වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යයාපන කුසලතා කෙරෙහි බලපානු ලබන ආර්ථිකමය සාධක මොනවාද යන්න හදුනාගැනිමට යොමු විය. එම ආර්ථිකමය සාධක අතරින් ප්‍රබලතම බලපෑමක් සහිත ආර්ථිකමය සාධකය වෙන් කර ගැනිම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය ආනුභාවික අධ්‍යයනයක් ලෙස සිදු කරන ලදි. එහිදි ද්විතීක දත්ත මූලාශ්‍ර ලෙස වතු අධ්‍යාපනය ආශ්‍රයෙන් කරන ලද සමීක්ෂණ 7 ක් අධ්‍යයනය කර නිගමන ලබා ගන්නා ලදී. ඒ අනුව ලැබුණ නිගමන වන්නේ වතු අංශයේ අධ්‍යාපනය අනෙකුත් අංශ වලට වඩා පහල මට්ටමක පවතින බවත්, ඔවුන්ගේ සාක්ෂරතා මට්ටමත් අධ්‍යාපන සහභාගීත්වයත් අවම මට්ටමක පවතින බවකි. මෙලෙස වතු අංශයේ දරුවන්ගේ අධ්‍යාපනය පහල බැසිමට බලපානු ලබන සාධක අතරින් ආර්ථිකමය සාධකයන්ගේ බලපෑම මුලික වී ඇත. එනම් පවුලේ ආදායම් තත්ත්වය අඩු විමත්, පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි නිසා වියදම් වැඩි විමත්, නිසා දරුවන්ගේ අධ්‍යාපනයට වැය කිරිමට තරම් ආර්ථිකය සවිමත් නොවිම හේතු වි ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේතය තුළ වතු අධ්‍යාපනය යම් මට්ටමක පහල බැසිමකට හේතු වී ඇති ආර්ථිකමය සාධක අතර පවුලේ ආදායම් තත්ත්වය අඩු විම ප්‍රබල ලෙස බලපා ඇති බව මින් පැහැදිලි විය.


මුඛ්‍ය පද- අධ්‍යාපනය, ආර්ථිකමය සාධක, වතු අංශයේ, කුසලතා

## හැදින්වීම

ශ්‍රී ලංකාවේ ජන සමාජය ග්‍රාමීය ,නාගරික හා වතු ලෙස කොටස් තුනකට බෙදිය හැකිය. එහිදී මධ්‍යස්ථ ප්‍රමාණයේ අඩු සංවර්ධන තත්ත්වයක් වතු ආශ්‍රිතව දක්නට ලැබුණද ශ්‍රී ලංකාවේ දළ දේශිය නිෂ්පාදනයට වතු කම්කරු දායකත්වය සුවිශේෂි වේ. වතු කම්කරුවන්ගේ සම්භවය ආරම්භ වන්නේ බ්‍රිතාන්‍යය පාලන සමය තුළ වැවිලි බෝග වගාව මෙරට ආරම්භ කිරිමත් සමගය. "යටත් විජිත සමයේ වතු

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. harshanirathnayake9@gmail.com

වල විවිධාකාරයේ රැකියාවන් සඳහා මෙරටට ගෙනෙනු ලැබූ ද්‍රවිඩ ජනතාවගේ ජීවන රටාවන්ද මේ වන විට වෙනස් වෙමින් පවති. "(පියරත්න,ඒ.2005. )

අතීතයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවට විදේශ විනිමයක් අත්කරදුන් වතු කම්කරුවන්ගේ වතුකරය තුළ වරින්වර ක්‍රියාත්මක වූ ව්‍යුහාත්මක වෙනස්කම් නිසා ඒවායේ හිමිකාරිත්වය මෙන්ම කළමනාකාරිත්වයේද වෙනස්කම් ඇති විය. මෙම වෙනස්කම් වතුකරයේ පරම්පරා ගණනාවකටම බලපාන ලදි.

"වතු කම්කරුවන් යම් ආකාරයකට පීඩාවකට ලක්කරමින් මුල් කාලයේ තිබූ ආර්ථික ක්‍රමය වෙනස් කිරීමට වතු ජන සතුකරණය,ඉඩම් ප්‍රතිසංස්කරණය මෙන්ම 1977 දි හඳුන්වාදුන් විවෘත්ත ආර්ථික ක්‍රමයද හේතු විය "(හේමන්ත,එන්.1980.)ඉඩම් ප්‍රතිසංස්කරණ වලට පෙර වතුවල පාලකයන් වූයේ බ්‍රිතාන්‍යය ජාතිකයෝය. නමුත් අනතුරුව සිංහලයන් වතුවල ප්‍රධානින් විමත් සමඟ වතු කම්කරු අධ්‍යාපනය ,සෞඛ්‍ය හා සුභසාධන කටයුතු කෙරෙහි රජය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානද අවදානය යොමු කරන ලදි. එහිදී වතුකරයේ අධ්‍යාපනය යම් ප්‍රමිතියකට සිදු වූ අතර 1977 දි හඳුන්වා දුන් විවෘත්ත ආර්ථිකයක් නිසා වතු කම්කරුවන්ගේ දෙවැනි පරම්පරාවට නව රැකියා සඳහා යොමු වීමට නිදහස ලැබිණි.

මෙරට සිදුවූ ඉඩම් ප්‍රතිසංස්කරණයන්ට පෙරාතුව වතු කම්කරුවන්ගේ නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය යනාදි පහසුකම් පිළිබඳව කිසිවෙක් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණත් ප්‍රතිසංස්කරණ වලින් පසුව වතු කම්කරුවන්ගේ මූලික පහසුකම් වර්ධනය කිරීමට කටයුතු යොදන ලදි. (පියරත්න,ඒ.2005.)

කෙසේ නමුත් වතු ප්‍රජාව වතුකරයේ අධ්‍යාපනික ඉඩප්‍රස්තා වර්ධනය කර ගැනීමටත් සාක්ෂරතාවය ප්‍රවර්ධනය කර ගැනීමටත් උනන්දු වී ඇත. "වතුකරයේ අධ්‍යාපන ප්‍රභවය සහ සංවර්ධනය පිළිබඳ සැලකීමේදි 19 වන සියවසේදි අධ්‍යාපනයේ දැඩි අවශ්‍යතාව මත වතුකරයේ යම් මට්ටමකින් අධ්‍යාපනය ක්‍රියාත්මක විය 20 වන සියවසේදි අධ්‍යාපන ප්‍රතිපාදන වර්ධනය විය." (ලිට්ල්, 2002.)

මෙලෙස ක්‍රියාත්මක වූ වතුකරයේ මුල්කාලිනව කන්කානින්හුන්ගේ [1] මූලිකත්වයෙන් අධ්‍යාපන කටයුතු සිදු වූ අතර ඉන් පසුව මිෂණාරිහු විසින් වතුකරයේ අධ්‍යාපන කටයුතුකරගෙන ගිය අතර ක්‍රිස්තියානි මිෂණාරින් විසින් ආගම ව්‍යාප්ත කරමින් වතුකරයේ දෙමළ ජනයා ක්‍රිස්තියානි දහමට යොමුකරගන්නා ලදී. වත්ත තුළ දැකිය හැකි උසස් තනතුරක් (Filed officer)

ශ්‍රී ලංකාවේ 1920 ආඥා පනතින් වතු පාසල්හි අනිවාර්යය අධ්‍යාපනය ස්තාපිත විය. නමුත් ග්‍රාමීය පාසල් වලින් වෙන්ව පැවැත්වීමට නියම විය. වතු පාසල් වල

අධ්‍යාපනය අනිවාර්ය විමත් සමග වයස 6 ත් 10 ත් අතර ළමුන්ගෙන් උදෑසන 10 ට පෙර සේවය ලබා ගැනීම නීති විරෝධී විය.

මෙලෙස වතුකරයේ අධ්‍යාපනය ආරම්භ වූ අතර වර්තමානය වන විට වතු අධ්‍යාපනය යම් මට්ටමකට පැමිණ තිබේ.එනම් වතු ප්‍රජාවේ දරුවන්ට අධ්‍යාපනික ඉඩප්‍රස්තා වර්ධනයට අඩිතාලම ලැබී ඇත.

මැලේසියාවේ වතුකර ජනතාවගේ දරුවන්ට රාජ්‍යය අනුග්‍රහයෙන් ලබා දෙන අධ්‍යාපනය නිසා වතු සේවාවේ සමාජීය පහසුකම් සංචලතාවය සහ සේවාවේ සාර්ථකත්වය ඉහල මට්ටමක පවතී.(ලිට්ල් ,ඩබ්ලිව්.2002.)

තවද ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය මත ඉන්දියාවේ අධ්‍යාපන ප්‍රගතියේ අඩුපාඩු ඉදිරිපත් කරයි. ශ්‍රි ලංකාවේ මිෂණාරි ක්‍රියාකාරිත්වයත් අනිවාර්යය අධ්‍යාපනයත් නිසා යම් ඉහල මට්ටමකට පැමිණ ඇති බව පැහැදිලි වේ. (වෙයිනර්,එම්.1991.)

නමුත් ශ්‍රී ලංකාව තුළ වතු අධ්‍යාපනය තුළ වර්ධනයක් දක්නට ලැබුනද සමස්තයක් ලෙස සෑම වතු දරුවකුගේම අධ්‍යාපන මට්ටම ඒ තරම් ඉහල වර්ධනයක නොපවතී යන්න හඳුනාගෙන ඇත.

ශ්‍රි ලංකාවේ අංශ අනුව සාක්ෂරතා අනුපාතය 2015

| අංශය | සාක්ෂරතා අනුපාතය(%) |
|---|---|
| ශ්‍රි ලංකාව | 95.7 |
| නාගරික | 97.7 |
| ග්‍රාමීය | 95.7 |
| වතු | 86.1 |

මූලාශ්‍රයඃ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, (2015 )

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වාර්ෂික වාර්තාවට අනුව සාක්ෂරතා අනුපාතය මගින් පැහැදිලි වන්නේ වතුකරයේ අධ්‍යාපන ප්‍රගතිය අනෙකුත් ප්‍රදේශයන්ට වඩා බෙහෙවින් පසුපසින් මන්දගාමීව පවතින බවකි. වතුකරයේ අධ්‍යාපන ප්‍රගතිය පහල මට්ටමක පැවතීමට විවිධ සාධක බලපානු ලබයි. එනම් ආර්ථිකමය, සමාජීය, මනෝ විද්‍යාත්මක, හා සංස්කෘතික සාධක ලෙස වර්ග කල හැක. ආර්ථිකමය සාධක ලෙස ඔවුන්ගේ එදිනෙදා කටයුතු හා සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශය මූල්‍යයම සාධකත්, මනෝ විද්‍යාත්මක සාධක ලෙස ඔවුන්ගේ ආකල්ප එක මට්ටමක පැවතීමත් එක් සීමාවකට කොටු විමත් අතර අධ්‍යාපන පසුගාමීත්වයත්, සංස්කෘතික සාධක ලෙස එක් ජාතියක් ලෙස අනෙකුත් සංස්කෘතික සමාජ වලින් වෙන්ව කටයුතු කිරීමත් මත සිදුවන

අධ්‍යාපන තත්ත්වයත් පැහැදිලි වේ. ඒ අතරින් වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි බලපානු ලබන ආර්ථිකමය සාධක හඳුනාගැනිමේදී වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යයාපන කුසලතා සහ ඒ කෙරෙහි බලපානු ලබන සාධක පිළිබඳ කරන ලද පර්යේෂණයන් කිහිපයක් සසම්භාවිව තෝරා ගෙන අපේක්ෂිත නිගමනයකට යොමු විමට මෙතුළින් අපේක්ෂා කෙරෙයි.

"වතු පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳ මිනිසුන්ගේ අදහස් හා අත්දැකීම් පිළිබඳ(පස්සර ප්‍රදේශයෙන්) සකස් කරන ලද වාර්තාවකට" අනුව වතු ජනගහනය ඓතිහාසිකව සමාජීය හා ආර්ථිකමය වශයෙන් දුර්වල වන අතර එම තත්ත්වයෙන් නැගී සිටිමටනම් අධ්‍යාපනය මෙවලමක් කර ගත යුතු වේ. කෙසේ වෙතත් වැවිලි පාසල් වල සිසුන් අධ්‍යාපන ප්‍රයෝජන ගැනිමට එතරම් උනන්දුවක් නොදක්වයි. (Transparency International Sri lanka,2010)

මෙම සමීක්ෂණය ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාමනිලධාරි කොට්ඨාස 41 න් පස්සර ග්‍රාමනිලධාරි කොට්ඨාසය තෝරා ගෙන තේ වතු ආශ්‍රිතව සම්මුක සාකච්ඡා මගින් දත්ත රැස් කරමින් ප්‍රදේශයේ පිහිටි වතු පාසල් වල යටිතල පහසුකම් හා සම්පත් යෙදවීම මෙන්ම දරිද්‍රතාවයේ බලපෑම පරික්ෂා කර ඇත.

අධ්‍යාපන ගුණාත්මකභාවය වැඩි කිරිම සඳහා දෙමාපියන්ගේ කැමැත්ත සහයෝගය නොමැති කම මූලික හේතුව බවට පත්ව ඇත. එනම් ගෘහ සේවිකාවන් ලෙස මැද පෙරදිග රැකියා සඳහා මව්වරුන් යාමත් පියාගේ මත්පැන් භාවිතයත් නිසා මුදල් නාස්ති විමත් නිසා පවුලේ ආර්ථිකමය ගැටලු වලට මුහුණ දිමට සිදුව ඇත. මෙම සමීක්ෂණයේ හෙළි වන ආකාරයට වතු ක්ෂේත්‍රයේ මව රැකියාවේ නියුක්ත විමත් යන කරුණු හේතු කොටගෙන ගුණාත්මක අධ්‍යාපනයකට දෙමාපිය සහයෝගය නොලැබිම හෙවත් ආර්ථිකමය බලපෑම නිසා දරුවන්ට පාසල් පැමිණිම හා කාර්ය සාධනය සඳහා ප්‍රධාන බාධාවක් ලෙස දැක තිබේ.

වතු පාසල්හි අධ්‍යාපනික ඉඩප්‍රස්තා වර්ධනය පිළිබඳ නිදර්ශනය අනෙකුත් වතු කම්කරු ජනයා අතර අධ්‍යාපන ව්‍යාප්තිය නිරීක්ෂණය කර බැලිමේ දි වඩාත් පොදු ආදර්ශයක් වන්නේ කෙසේද සහ වතුකරයේ දරුවන් අතර විධිමත් අධ්‍යාපනික ඉඩප්‍රස්තාවන්හි මහා පරිමාණ වෙනස්කම් පිළිබඳ සාක්ෂ්‍ය එකිනෙකට බොහෝ සෙයින් වෙනස් විම හා එම තත්ත්වයන් මූලයන් දෙකක දත්ත ආශ්‍රයන් එනම් පාසල්වල ඇතුලු විමේ සංඛ්‍යා සහ ජනගහන සාක්ෂරතා අනුපාතය මගින් ලබා ගත හැක. (ලිට්ල්, ඩබ්ලිව්.2002. ) "ශ්‍රි ලංකාවේ වැවිලි කර්මාන්තය එහි ජනතාව සහ අධ්‍යාපනය පිළිබඳ දේශපාලනමය ආර්ථිකමය එළඹුමක් " යන පර්යේෂණයේදි නුවර-නුවරඑළිය උඩරට කඳුකරයේ තේ වත්තක් කේන්ද්‍ර කර ගනිමින් පවුල් 368 ක් මූලික කර ගනිමින් ශ්‍රි ලංකාවේ වතුකරයේ අධ්‍යාපනික ව්‍යාප්තිය හඳුන්වා දිමට උත්සහ දරා ඇත.

වැවිලි ආර්ථිකයන් සහ වතු ප්‍රජාව ප්‍රමාණයෙන් විශාල ලෙස ව්‍යාප්තව තිබියදීත් වතුකරයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික වෙනස් වීම පිළිබඳ අවදානය යොමු වීම අවම මට්ටමක පවතින බව ප්‍රකාශ කරන ඇන්ජලෝ ලිට්ල් මෙම සමීක්ෂණයෙන් වැවිලි ආර්ථිකයෙහි අධ්‍යාපන වෙනස් වීම සහ අධ්‍යාපන ක්‍රමයෙන් පරිබාහිරව මුල්බැස ගත්තා වූ ව්‍යුහගත විස්තර කිරීම්වලට වඩා අවධානය යොමු කර ඇත්තේ වතුකරයේ අධ්‍යාපනයේ එක තැන රැඳී සිටීම හෝ අඛණ්ඩ ව පවත්වා ගෙන යාම පිළිබඳවය.

කෙසේ වෙතත් මෙම සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ වතු අධ්‍යාපනය 1997 වන විට සම්පත් පාලනය ජාතික සහ පළාත් ඇමතිවරුන්ගේ හෝ ධනවත් මධ්‍යම පාන්තික දෙමාපියන්ගේ වගකීම පමණක් නොව ප්‍රමාණවත් අයුරින් වතු කම්කරුවන් තමන් කෙරෙහිද පවරාගෙන ඇති බවක් දක්නට ලැබුනත් වතු කම්කරු දෙමාපියන් විධිමත් අධ්‍යාපනයක් ලබා දීමට සරිලන ආර්ථිකමය පසුබිමක් නොමැති බව සනාථ වෙයි. වතු කම්කරු වැටුපෙහි ප්‍රමාණය,පවුලේ සමාජික සංඛ්‍යාවේ ප්‍රමාණය, පවුලේ වියදම අධික වීමත් හේතු ලෙස දක්වයි.

‘Out Of School Children In Srilanka-Country Study’ මාතෘකාව මුල් කර ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට සහභාගි වීම සම්බන්ධව විග්‍රහ කර ඇත. ප්‍රාථමික අධ්‍යාපනයට සහභාගි වීම යටතේදී වතු අංශයේ 79.8% ග්‍රාමීය අංශයේ 93.3% නාගරික අංශයේ 95.2% ලෙස හදුනාගෙන ඇත.අඩුම සහභාගිත්වයක් වතු අංශයේ බවත් කාන්තා දරුවන්ගේ සහභාගිත්වයද සාපේක්ෂව අවම මට්ටමක පවත්නා බවත් එය 71.5% ක් වන අතර වතු අංශයේ පිරිමි දරුවන්ගේ සහභාගිත්වය 88.5% වන බැවින් එය වඩාත් මින් පැහැදිලි වෙයි. (UNICEF Srilanka,2013 )

මෙම සමීක්ෂණය ශ්‍රී ලංකාවේ පලාත් 09 නියෝජනය වන පරිදි ග්‍රාමීය, නාගරික, වතු, කෘෂි, ධීවර ,යන සමාජ ස්තර යටතේ කණ්ඩායම් ගත සම්මුක සාකච්ඡා ක්‍රමය මගින් දත්ත ලබා ගෙන සිදු කර ඇති අතර දරුවාගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි ආර්ථිකමය බාධාවන් බලපාන බවත් පවුලේ ආදායම ග්‍රාමීය,සහ වතු,ප්‍රදේශ වල අවම වීමත් වතු කම්කරු සේවක වැටුප් හි විෂමතාවයනුත් හදුනාගෙන ඇති අතර මේ නිසා පාසල් හැරයාමට පෙළඹීමත් ළමා ශ්‍රමිකයින් බිහිවීමත් සිදු වන අතර ඔවුන්ගේ අධ්‍යාපන කුසලතාවයන් ශූන්‍ය වීමක් සදහන් කරයි. මේ අනුව පැහැදිලි වන්නේ සමාජ ස්තරායනය යටතේ වෙන් වන කම්කරු පන්තිය ධනපති පන්තියට සාපේක්ෂව ආර්ථිකමය මට්ටම මත පහල තත්ත්වයක පවතින නිසාවෙන් ඔවුන් අධ්‍යාපනය කෙරෙහි අඩු අවදානයක් යොමු කරන බවයි. ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය පසුබිම මත ඔවුන්ගේ සංවර්ධන මට්ටම තිරණය වන බව මින් පැහැදිලි කෙරෙයි.

“ශ්‍රී ලංකාවේ ජ්‍යේෂ්ඨ ද්විතියික සිසුන්ගේ සංකල්ප සාධනය” යන මාතෘකාව යටතේ කරන ලද අධ්‍යානයකදී නාගරික පන්තියට සාපේක්ෂව ග්‍රාමීය හා වතු

අංශ වල පවුල් වල සංඛ්‍යාව වැඩි අතර එම පවුල් වල දරුවන්ට සැලසිය හැකි අධ්‍යාපන පහසුකම් අඩු බවද මෙම අධ්‍යානයෙන් අනාවරණය වී ඇත.එමෙන්ම දෙමාපිය ආර්ථික තත්ත්වය අනුව ශිෂ්‍යයාට ඉගනුම සදහා ලැබෙන පාසල තිරණය වන බවද නිගමනය කර ඇත. (චන්ද්‍රලතා.1983.)

"Children Of Plantation Communities In Srilanka" මාතෘකාව යටතේ වැවිලි ග්‍රාමීය අධ්‍යාපනය පිළිබද අධ්‍යයනය කර ඇත. ශ්‍රි ලංකාවේ සංවර්ධනය හා සහයෝගිතාවය සදහා SWISS නියෝජිත ආයතනය මගින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ බොගවන්තලාව ප්‍රදේශය ආශ්‍රයෙන් සිදු කර ඇත. ශ්‍රි ලංකාවේ සාක්ෂරතාවය 94% වුවද සාපේක්ෂව වතු දරුවන්ගේ සාක්ෂරතාවය 0.1% පමණ වේ.හොද පාසල් නොමැති කම,දැඩි ගුරු හිගය, දෙමාපියන්ගේ නොදැනුවත්භාවය, දුර්වල ප්‍රවාහන පහසුකම්, ආර්ථිකමය අපහසුතා, කම්කරු වැටුපේ ප්‍රමාණවත් නොවිම, වතු දරුවන්ගේ සාක්ෂරතාවය පහල බැසිමට හේතු ලෙස හදුනාගෙන ඇත.ඊට අමතරව වතු දරුවන් බලපාන බැඳිරුම් ගැටලු අතර ඔවුන් රටේ බොහෝ ප්‍රදේශ වල දේශිය කම්කරුවන් හා සුලු සේවකයින් ලෙස සේවය කරමින් සිටින අතර ඔවුන් සම්පූර්ණ අධ්‍යාපනයම අහිමි කරගෙන ඇති බවත්ය. නුවරඑළිය දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් කරන ලද මෙම සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස 2009 දි වතු දරුවන් සදහා පෙර පාසල් ස්ථාපිත විය.

වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යයාපන කුසලතා සහ ඒ කෙරෙහි බලපානු ලබන සාධක පිළිබද කරන ලද පර්යේෂණයන් කිහිපයක් සසම්භාවිව තෝරා ගෙන සිදු කරන ලද අධ්‍යයනයට අනුව ලබා ගත හැකි නිගමනයන් මෙසේය.

**සාරාංශය**

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ වතු වැවිලි වගාව ස්ථාපිත විමත් සමග වතු කම්කරුවන්ද මෙරටට පැමිනෙණ ලදි.එලෙස බිහි වු වතු ප්‍රජාව මෙරට වැදගත් ජන කොට්ඨාසයක් බවට පත් විය.වතු කම්කරුවන්ගේ අධ්‍යාපනය ,සෞඛ්‍ය, සුභසාධන, ආර්ථිකය යන සාධකයන් ඔවුන්ගේ පිවිකාව තුළ වැදගත් අංගයන් බවට පත්ව ඇත.මෙහිදි අධ්‍යයනය කරන ලද පර්යේෂණ වලට අනුව වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යයාපනය කෙරෙහි අවධානය යොමු කර බැලිමේදි පැහැදිලි වන්නේ ශ්‍රි ලංකාවේ ග්‍රාමීය ,නාගරික හා වතු යන ක්ෂේත්‍ර අතරින් වතු අංශයේ අධ්‍යාපනය අනෙකුත් අංශ වලට වඩා පහල මට්ටමක පවතින බවකි. එනම් ඔවුන්ගේ සාක්ෂරතා මට්ටමත් අධ්‍යාපන සහභාගීත්වයත් අවම මට්ටමක පවති.

මෙලෙස වතු අංශයේ දරුවන්ගේ අධ්‍යාපනය පහල බැසිමට බලපානු ලබන සාධක කවරේදැයි යන්න විමසා බැලිමට ඉහත අධ්‍යයනය කරන ලද පර්යේෂණ අනුව ආර්ථිකමය සාධකයන්ගේ බලපෑම මුලික වී ඇත. එනම් පවුලේ ආදායම් තත්ත්වය අඩු විමත් පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි නිසා වියදම් වැඩි විමත්

නිසා දරුවන්ගේ අධ්‍යාපනයට වැය කිරිමට තරම් ආර්ථීකය සවිමත් නොවිමද හේතු වි ඇත.

ප්‍රමාණවත් ආදායම් තත්ත්වයක් නොමැති කම හේතුවෙන් වතු පවුල් වල මව්වරුන් විදේශිය ගෘහ සේවිකාවන් ලෙස විදෙස් ගත විමත් නිසා දරුවන්ගේ අධ්‍යයාපනයට අවදානය යොමු කිරිමට අවස්ථාවක් නොලැබිම නිසා ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම පහල බැස ඇති බව හදුනාගෙන ඇත.

වතු දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය හදුනාගැනිමේදි පැහැදිලි වී ඇත්තේ කම්කරු පංතියේ දෙමාපියන් තම දරුවන්ගේ අධ්‍යාපනය අඩු තක්සේරුවකින් සලකන අතර ඔවුන් තුළ ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි අඩු අපේක්ෂණ පවතින බවකි.තවදුරටත් පැහැදිලි වන්නේ වතු කම්කරු පංතියේ දෙමාපියන්ගේ ආදායම් රැදී පවත්නා රැකියාවෙන් ලැබෙන අවම වේතනයන් හේතු කොට ගෙන දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි වැය කිරිමට තරම් ප්‍රමාණවත් මුදලක් නොලැබෙන බැවින් අධ්‍යාපනය ඔවුන්ට අත්‍යවශ්‍ය නොවන බව සිතිම මත අධ්‍යාපනය පහල බැසිමට ලක්ව ඇති බවයි.

ශ්‍රි ලංකාවේ අධ්‍යාපන කේෂතය තුළ වතු අධ්‍යාපනය යම් මට්ටමක පහල බැසිමකට හේතු වී ඇති ආර්ථීකමය සාධක අතර පවුලේ ආදායම් තත්ත්වය අඩු විම ප්‍රබල ලෙස බලපා ඇති බව මේ අනුව පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Arunathilaka, N. (2001).Education Participation in srilanka.

David E,B., & Thomas,G.J. (2000). *Economic factors that influence educational performance in rural school*.

Weiner,M. (1991). *The Child and the state in india*. Princeton university press.

UNICEF SRI LANKA. (2013). *Out Of School Children In Srilanka:Country Study*.

Sri Lanka: Swiss assistance. (2010). *children of plantation communities*.

Transparency International Sri lanka. (2010). *A report on people's views and experiences on the quality of education in the plantation schools of Passara.* First Published in Sri Lanka.

පියරත්න, ඒ. (2005). *වතුකරය කම්කරුවා සහ වෙනස්වන ජීවන රටාව.* විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

රුබේරු, ආර්. (1971). *ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය 1796-1947.* සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම.

ලිට්ල්, ඩබ්. ඒ. (2002). *ඉගෙනීමට ගන්නා වෙර.* සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ.

සිරිසේන, එච්. (1999). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු.* ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස්.

හේමන්ත, එන්. වී. (1980 මාර්තු). වතු කම්කරුවෝ, *ආර්ථික විමසුම*, 12 කලාපය.

# ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැර යාමට බලපානු ලබන සාධක පිළිබඳ විමසුමක්

එම්. එල්. සී. යසින්තා[1]

**සංක්ෂේපය**

අධ්‍යයන පසුබිම මුළු මහත් සමාජ දේහයම පෝෂණය වන්නා වූ මූල බීජය වන්නේ අධ්‍යාපනයයි. පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානම මාධ්‍යය ලෙස පිළිගැනෙන්නේ අධ්‍යාපනයයි. එසේ පවතින දැනුම බෙදා දීමේ ප්‍රධානතම ආයතනය වන්නේ පාසලයි. පාසල යනු විවිධ මට්ටම්වල දරුවන් ඒකරාශී වන ස්ථානයකි. ඒ අතර විවිධ අධ්‍යාපන මට්ටම් වලදී අධ්‍යාපනය හැර යන්නන් මේ සියලු කොටස් නියෝජනය කරයි. මෙසේ ළමුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීම වර්තමානය වන විට ලෝකයම මුහුණ දී ඇති ගැටළුවකි. අරමුණ: ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැරයාම සම්බන්ධයෙන් බලපානු ලබන හේතු සාධක කවරේදැයි හඳුනාගැනීම මෙම පර්යේෂණය මගින් සිදුවේ. ක්‍රමවේදය: සිසුන් අතරමග පාසල් අධ්‍යාපනය හැරයාම පිළිබඳ විවිධ රටවල පර්යේෂකයින් හා ශ්‍රී ලංකාවේ පර්යේෂකයින් විසින් කරනු ලැබූ පර්යේෂණ අධ්‍යයනය කිරීම මගින් ඔවුන් විසින් සොයාගන්නා ලද පාසල් හැරයාම සඳහා බලපානු ලබන සාධක ඇසුරෙන් සමස්තයක් ලෙස මෙම ගැටළු කෙරෙහි බලපෑම් කරන්නා වූ සාධක පිළිබඳ විමසීමක් මෙමගින් සිදු කර ඇත. ප්‍රතිඵල: මෙම අධ්‍යනය මගින් පාසල් හැරයාම සඳහා බලපාන ප්‍රධානතම සාධක ලෙස ආර්ථික හා සමාජ සාධකය හඳුනාගත් අතර. ඒ අනුව පවුලේ ආර්ථික පසුබිම, දෙමාපියන්ගේ ආදායම් මට්ටම හා රැකියාව ද ඊට අමතරව සාමජ පසුබිම, පවුලේ ප්‍රමාණය, සමාජ පන්තිය, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, දෙමාපිය අපේක්ෂණය යන සාධකද බලපානා බව හෙළිවිය. නිගමනය : මේ අනුව පාසල් හරුයාම හා ආර්ථික සාධක අතර ධන සම්බන්ධතාවක් පවතින බවත් වයස අවුරුදු 14-16 අතර පිරිමි ළමුන් වැඩි ප්‍රතිශතයක් පාසල්හැර ගොස් ඇති බව හෙළිවිය. වයසින් මුහුපුරායත්ම පිරිමි ළමුන් අධ්‍යාපනයට සමුදී රැකියා කෙරේ යොමුවී ඇති බව හඳුනාගත හැකි විය. එසේම පවුලේ සංඛ්‍යාව ඉහළයාම හා දෙමාපිය අධ්‍යාපන මට්ටම අඩුවීම මේ කෙරේ බලපානු ලබයි. ඒ අනුව පාසල් සිසුන්ගේ අධ්‍යාපනය අතරමග නතරවීමට ඔවුන්ගේ පවුලේ ආර්ථික මට්ටම හා පවුල් පසුබිම යන සාධක සෘජුවම බලපානු ලබන බව හඳුනාගත හැකිවිය.

**මුඛ්‍ය පද :** අධ්‍යාපනය, පාසල් හැරයාම, අධ්‍යාපන සාධනය, අධ්‍යාපන ගැටළු.

---

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. chathuyasintha@gmail.com

**හැඳින්වීම**

මුළු මහත් සමාජ දේහයම පෝෂණය වන්නා වූ මූල බීජය වන්නේ අධ්‍යාපනයයි. අධ්‍යාපනය මනුෂ්‍යයාගේ සමාජ ජීවිතය හා සම්බන්ධ වූ ක්‍රියා පද්ධතියකි (සෝමරත්න 1961). අධ්‍යාපනය පිළිබඳ බොහෝ විද්වතුන් විවිධ නිරූපනයන් සිදු කොට ඇත. "අධ්‍යාපනය යනු මිනිස් ජීවිතය මුළුල්ලේ ක්‍රියාත්මක වන අනාගත සංවර්ධනයන් අපේක්ෂාවෙන් ඉගෙනීම අතින් ස්වයංපෝෂිත වීමකි. මෙය ජීවත්වීම සඳහා කරන ප්‍රයත්නයක් ද වේ"(මහත්මා ගාන්ධි). "අධ්‍යාපනය යනු හිස් කලයක් පිරවීමක් වැනි ක්‍රියාවක් නොවේ. එය පහන් දල්වන්නාක් බඳු ක්‍රියාවකි"(ප්ලේටෝ). "අධ්‍යාපනය යනු මිනිසා සම්පූර්ණ ජීවිතයක් සඳහා සූදානම් කිරීමකි"(හර්බට් ස්පෙන්සර්). "අධ්‍යාපනය යනු ජීවත්වීමේ ක්‍රියාවලියයි"(ජෝන් ඩිවී). "අධ්‍යාපනය යනු සමාජ ජීවිතය සඳහා ඉදිරියට නොපැමිණි නවකයන් පිරිසක් උදෙසා වැඩිහිටියන් විසින් ගනු ලබන ක්‍රියාදාමයකි"(එමිල් ඩර්ක් හයිම්). (වීරතුංග,1981). මෙසේ අධ්‍යාපනය යන්න මූලික කුසලතා පුහුණු කිරීමක්, චරිත සංවර්ධනය කිරීමක්, වෘත්තීයට පෙර සූදානම් කිරීමක් ලෙස විවිධ ස්වරූපයෙන් අර්ථ දැක්විය හැක. අධ්‍යාපනය මානව චර්යාව හා සම්බන්ධව පවතින ක්‍රියාදාමයක් බැවින් ඒ පිළිබඳ පැහැදිලි එක් අර්ථයක් සැපයිය නොහැක.

මනුෂ්‍ය සමාජය පෝෂණය වන්නේ අධ්‍යාපනයෙන් සේම සමාජය දියුණුවීම ද අධ්‍යාපනය හරහා සිදු වේ. සමාජ ජීවිතය හා අධ්‍යාපනය ක්‍රියාවලිය අතර ඉතා වැදගත් වන්නා වූ අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවතී. එබැවින් සමාජයක සංවර්ධනය හෝ පිරිහීම එම සමාජයේ අධ්‍යාපනය නිසාම සිදු වේ (සෝමරත්න 1961). රටේ අනාගතය වර්තමාන දරු පරපුර බව හැඳිනගන්නා ලෝකයේ සෑම රටක් මෙන්ම ශ්‍රී ලංකාවේ ද අධ්‍යාපනය සඳහා විශාල පිරිවැයක් දරන්නේ එය අනාගතය වෙනුවෙන් කරන ආයෝජනයක් ලෙස සලකමිනි. 2014 වසරේ ශ්‍රී ලංකාව අධ්‍යාපනය සඳහා දරණ ලද මුළු වියදම රු.බිලියන 190.2 ක් වේ (මහ බැංකු වාර්තාව, 2015). අධ්‍යාපනය මෙතරම් වැදගත් ක්‍රියාදාමයක් වන්නේ එය සමස්ත ප්‍රජාවටම බලපාන සංකල්පයක් වන බැවිනි. මන්ද අධ්‍යාපනය රටක මෙන්ම සමාජයක ද ඉදිරි ගමන තීරණය කරන්නා වූ ප්‍රධාන සාධකයක් වන බැවිනි.

පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානම මාධ්‍යය ලෙස පිළිගැනෙන්නේ අධ්‍යාපනයයි. එසේ පවතින දැනුම බෙදා දීමටත්, නව දැනුම ගොඩ නැංවීමටත්, ඉවහල් වන උපකාරී වන ප්‍රධානතම මාධ්‍යය ලෙස පාසලට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. සමාජයේ පහත් මට්ටමක සිටින ජනතාව ඉහළ මට්ටමකට පා එසවීමට උපකාරී වන ප්‍රධානතම ආයතනයක් ලෙස පාසල පිළිගැනේ. අධ්‍යාපනය ලබාදෙන ප්‍රධාන ආයතනය වන්නේ පාසල වන බැවින් පාසල කෙරෙහි සියලු දෙනා පූර්ණ විශ්වාසය තබා ඇත. නමුත් දරුවකුගේ අධ්‍යාපනය ලැබීම හෝ නොලැබීම තීරණය වන්නේ පාසල තුළ සිදුවන ඉගෙනුම් ඉගැවීම් ක්‍රියාවලිය තුළින් පමණක්ම දැයි නැවත සිතා බැලිය යුතු ගැටළුවකි.

පාසල යනු සුභග හා සෙමින් ඉගෙන ගන්නා දරුවන්, විශේෂ අවධානයක් යොමු විය යුතු දරුවන් යන විවිධ මට්ටම්වල දරුවන් ඒකරාශී වන ස්ථානයකි. මෙවැනි පද්ධතියක් තුළ දරුවා අධ්‍යාපනය සඳහා බද්ධ වන ප්‍රමාණයේ වෙනසක් පවතී. විශිෂ්ඨ ගණයේ දරුවන් පමණක් නොව විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ද ඒ අතරමැද පිරිසක් ද පාසල තුළ ඒකරාශී වන අතර විවිධ අධ්‍යාපන මට්ටම් වලදී අධ්‍යාපනය හැර යන්නන් මේ සියලු කොටස් නියෝජනය කරයි. මෙසේ ළමුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීම වර්තමානය වන විට මුළු මහත් ලෝකයම මුහුණ පා ඇති ප්‍රධාන ගැටළුවක් බවට පත්වී හමාරය. අධ්‍යාපනය කෙරෙහි බලපාන තීරණාත්මක සාධක රාශියක් අතරින් සමාජ අර්ථික සංස්කෘතික හා දේශපාලන සාධක ප්‍රධාන වශයෙන් හඳුනාගත හැක.

අධ්‍යාපනය සර්ව සාධාරණ ලෙස බෙදීයාම පිළබඳ විෂමතා, භෞතික හා මානව සම්පත් බෙදීයාමේ විෂමතා, අධ්‍යාපනය කෙරෙහි යොමුවන්නන්ගේ විෂමතා පිළබඳ විමසා බැලීමට බොහෝ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට සිදු වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948.12.10 දින සම්මත කරන ලද මානව අයිතිවාසිකම් සම්මුතියේ 26 වන වගන්තියේ සියලු දෙනා හට ලැබිය යුතු අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය දක්වා ඇත. එහි සඳහන් වන්නේ "සෑම කෙනෙකුම අධ්‍යාපනය ලැබීමේ අයිතිය හිමිවෙයි. යටත් පිරිසෙයින් මූලික අධ්‍යාපනයවත් නොමිලේ ලැබිය යුතුය. මූලික අධ්‍යාපනය අනිවාර්ය විය යුතුය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සාමාන්‍යයෙන් හැම දෙනාටම ලබා දිය යුතු අතර උසස් අධ්‍යාපනය දස්කම් අනුව ලැබීමට සියලු දෙනාටම අයිතිවාසිකම් තිබිය යුතුය"(වන්නිආරච්චි, 2004, 11). තවද 1989.11.20 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය ළමා පරපුර මිනිස් සංහතියේ විශේෂ ගණයක් ලෙස සලකා, ළමුන් සතු අයිතිවාසිකම් වෙනම ලේඛණ ගත කල අතර එය ළමා අයිතිවාසිකම් සම්මුතිය නම් වේ. එහි 28 හා 29 දරණ වගන්ති මගින් ළමුන් බුක්ති විඳිය යුතු අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය දක්වා ඇත. එය මෙසේය "සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත. මෙම අයිතිය බුක්ති විඳීම සහතික කරනු සඳහා රාජ්‍යයන් ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු අතර නොමිලේ සැපයිය යුතුය. සාමාන්‍යය හා වෘත්තීය අධ්‍යාපනය ඇතුළුව ද්විතීක අධ්‍යාපනයේ විවිධත්වය වර්ධනය කළ යුතුය. පාසල් අධ්‍යාපනය ලැබීම සඳහා දිරි ගැන්වීමට සහ අතරමඟදී පාසල් හැර යාම වැලැක්වීමට පියවර ගත යුතුය"(වන්නිආරච්චි, 2004, 12). එසේම වයස අවුː 5-14 අතර දරුවන්ගේ අධ්‍යාපනය අනිවාර්ය විය යුතු බව ළමා අයිතිවාසිකම් පිළබඳ ප්‍රඥප්තියෙන් ද තහවුරු කර ඇත. වර්තමානය වන විට ලොව බොහෝමයක් රටවල් එම අයිතිය පිළිගෙන ක්‍රියාත්මක කරනු ලබන අතර බොහෝ දෙමාපියන් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද දරුවන්ගේ අධ්‍යාපනය කෙසේ හෝ සම්පූර්ණ කිරීමට උත්සාහ දරති. නමුත් එම වයසේ දරුවන් පාසල් අධ්‍යාපනය අතරමඟ නවතා දැමීම හා පාසල් හැර යාම සමාජ ගැටළුවක් බවට පත්ව ඇත. විවිධ පර්යේෂණ හා සමීක්ෂණ තුළින් ශ්‍රී ලංකාවේ ද මෙම තත්වය වඩාත් බරපතල සංසිද්ධියක් ලෙස හඳුනාගෙන ඇත. මෙවැනි තත්වයක් ඇතිවීමට බලපාන හේතු සාධක ලෙස සමාජ, අර්ථික,

සංස්කෘතික හා දේශපාලන සාධක පවතින බව එම පර්යේෂණ හා සමීක්ෂණ මගින් හෙලවී ඇත.

1967 බ්‍රිතාන්‍යයේ ප්ලව්ඩන් වාර්තාවේ දක්වා ඇති ආකාරයට අඩු ආදායම, දෙමාපිය රැකියාව, දෙමාපිය බුද්ධි මට්ටම, පවුලේ සංඛ්‍යාව අධික වීම, දුප්පත්කම ආදී සාධක දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන බව දක්වා ඇත(ප්ලව්ඩන් වාර්තාව,1967). තවද 1971 ඔලිව්බෑන්ක්ස් කරන ලද අධ්‍යනයකින් පවුලේ පසුබිම එනම් අඩු චේතන, රැකියා විරහිත බව, විශාල පවුල්, ප්‍රධාන නිපැයුම්කරු නැති වීම වැනි හේතු නිසා හටගත් දුප්පත්කම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන බව දක්වා ඇත( ඔලිව්බෑන්ක්ස්,1971). එපමණක් නොව 1978 ලංකාවේ මහර අධ්‍යාපනය මණ්ඩලයේ පාසල් හැර යන්නන් පිළිබඳ කරන ලද අධ්‍යනයකින් පෙන්වා දෙන්නේ පවුලේ සමාජ හා අර්ථික පසුබිම දරුවන් පාසල් හැරයාමට බලපාන බවයි(වික්‍රමරත්න,1978). තවද 1978 ගාල්ල අධ්‍යාපනය දිස්ත්‍රික්කයේ ද්විතියික අධ්‍යාපන අවස්ථා පිළබඳ අධ්‍යනයකින් දෙමාපිය රැකියාව, මාසික ආදායම, දෙමාපිය අධ්‍යාපන මට්ටම, පවුලේ ප්‍රමාණය, සමාජ පරිසරය, දෙමාපිය අනුබලය, දෙමාපිය වෘත්තීය අපේක්ෂාව ආදී සාධක දරුවන්ගේ අධ්‍යාපනය මට්ටම කෙරෙහි බලපාන බව දක්වයි(රූබසිංහ,1978). එමෙන්ම පවුල් පසුබිම අධ්‍යාපනයට බලපා ඇති ආකාරය පිළිබඳ චීනය කරන ලද අධ්‍යනයකින් හෙලි වී ඇත්තේ ජීවත් වන ප්‍රදේශය අනුව ද පවුලේ බලපෑම අධ්‍යාපනය සඳහා බලපානු ලබන බවයි. ඉන් හෙළි වී ඇත්තේ සංවර්ධනය අඩු ප්‍රදේශයන්හි අධ්‍යාපනය සඳහා පවුලේ බලපෑම වැඩි බවයි. එහිදී අධ්‍යාපනයට බලපාන වැදගත්ම සාධක ලෙස දක්වා ඇත්තේ ළමයා හා සම්බන්ධ දෙමාපිය අපේක්ෂණය හා මවගේ අධ්‍යාපන මට්ටමයි(Poston,Zhai,Albo,1994). මේ ආකාරයෙන් විවිධ පර්යේෂණ හා සමීක්ෂණ මගින් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම, දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක, දරුවන් පාසල් හැරයාමට බලපාන සාධක පිළිබඳ පර්යේෂකයින් කරුණු දක්වා ඇත. නමුත් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසල් සිසුන් පාසල් අධ්‍යාපනය අතරමඟ නවතා දැමීමට (පාසල් හැරයාමට) බලපාන සමාජ හා අර්ථික සාධක පිළිබඳ සවිස්තරාත්මකව සිදු වූ පර්යේෂණ පිළිබඳ දත්ත හා වාර්තා පවතින්නේ ඉතා අල්ප ප්‍රමාණයකි. එබැවින් ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් පාසල් පාසල් හැර යාමට බලපාන සමාජ හා අර්ථික සාධක පිළිබඳ විමසා බැලීමක් මෙමගින් සිදු වේ.

සිසුන් පාසල් පාසල් හැර යාම පිළිබඳ අධ්‍යනය කිරීමට ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන සාධක කවරේදැයි හඳුනාගැනීම වැදගත් වේ. මෙරට පමණක් නොව වෙනත් රටවල ද බොහෝ පර්යේෂකයින් විසින් ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන සාධක පිළිබඳ අධ්‍යනයන් සිදුකර ඇත. එම විවිධ වූ පර්යේෂණ මගින් ඔවුන් හෙළි කරගත් දෑ මෙසේ දැක්විය හැක.

**පවුල් පසුබිම හා ළමයාගේ අධ්‍යාපනය අතර සම්බන්ධය**

1967 දී බ්‍රිතාන්‍යයේ ප්ලව්ඩන් වාර්තාව මගින් පවුල් පසුබිම නියෝජනය කරන සාධක රාශියක් සමග දරුවාගේ අධ්‍යාපනය සම්බන්ධ වන බව දක්වයි. ඔවුන් පෙන්වා දෙන අන්දමට අඩු ආදායම, දෙමාපිය රැකියාව, පවුලේ සංඛ්‍යාව අධික වීම, දුප්පත්කම හා ගෙදර ජීවිතය දුක් සහිත වීම, පියාගේ හෝ මවගේ මරණය, ගෙදර අය නිතර අසනීප වීම, අයහපත් භෞතික වාතාවරණය, දෙමාපිය නූගත්කම, දෙමාපිය ආදාරය, අනුබලය, මගපෙන්වීම නොලැබීම යන සාධක උසස් බුද්ධියට මෙන්ම යහපත් චිත්තවේග ඇති නොවීමටත් බලපා ඇත. එසේම ඔවුන් මෙම තත්වය විශේෂයෙන්ම පාසල් කාර්ය සාධනය අසාර්ථක වීමට හේතු වන බවද දක්වයි. ඒ අනුව ආදරය පරිසරය පවුල යන විචල්‍යයන් ළමයාගේ බුද්ධි වර්ධනයට කෙරෙහි මෙන්ම පාසල් සාධනය කෙරෙහිත් බලපාන බව ඔවුන් පිළිගෙන ඇත.

1994 දී ඩී. එල්. පෝස්ටන් එන්. සහි ටී ඇල්බෝ ය නඅය චීන මහජන සමූහාණ්ඩුවේ ප්‍රථමික පාසල් 200ක සිසුන් 40000ක නියැදියක් මගින් පවුල් පසුබිම අධ්‍යාපනයට බලපා ඇති ආකාරය අධ්‍යනය කර ඇත.ඒ අනුව පවුලේ බලපෑම ප්‍රදේශ අනුව වෙනස් වන බව පෙනී ගොස් ඇත. සංවර්ධනය අඩු ප්‍රදේශවල පවුලේ බලපෑම වැඩිබවත්. පවුල ආශ්‍රිත සාධක අතරින් අධ්‍යාපනයට බලපාන වැදගත්ම සාධකය වන්නේ ළමයා සම්බන්ධ දෙමාපිය අපේක්ෂණය සහ මවගේ අධ්‍යාපන මට්ටම බව ඔවුන්ගේ අධ්‍යනයෙන් හෙළිවිය. එම අධ්‍යනයට අනුව පවුලේ ආර්ථිකය එතරම් වැදගත් සාධකයක් ලෙස දරුවන්ගේ අධ්‍යාපනයට බලනොපාන අතර කුඩා පවුල් විශාල පවුල්වලට වඩා ඉහළ සාධනයක් පෙන්වයි. ග්‍රාමීය පාසල්වල සිසුන්ට වඩා නාගරික ළමුන් ඉහළ ළකුණු ලබාගන්නා බවක් පෙනෙන්නට නැති බවද අනාවරණය කොට ගෙන ඇත.

1996 දී ශ්‍රී ලංකා සමාජයේ පවුල් සංස්ථාවේ වෙනස්කම් ගැන විමර්ශනයක යෙදෙන ටෙනිසන් පෙරේරා වෙනස්කම් සමග අධ්‍යාපනයේ ඇති සම්බන්ධයද ඉදිරිපත් කර ඇත. නූතන පවුල් සංස්ථාව තුළ ශ්‍රම විභජනය පැහැදිලි ලෙස නොමැති නිසා පුරුෂයින්ගේ රැකියාවල කාන්තාවන් ද නිරත වේ. මේ නිසා අවශ්‍ය සුදුසුකම් උපයා ගැනීමට පවුලක කාන්තාවන් ද පිරිමින් මෙන්ම තරගකාරී අධ්‍යාපනයට යොමු වී ඇත. විවෘත ආර්ථිකය නිසා පවුලේ අය තනි තනිව ආර්ථික අතින් නැගී සිටීමට උත්සාහ දැරීම ද කැපීපෙනේ. පාසල් යන වයසේ ළමුන්ට ද උපයන මාර්ග විවෘත වී තිබීම නිසා අතරමග අධ්‍යාපනය නතර කිරීමට හේතු වන ආර්ථික පරිසරයක් ගොඩනැගී ඇත. විශේෂයෙන් දිළිඳු පවුල්වල අඛණ්ඩ අධ්‍යාපනයට එයබ බාධාවක් වී ඇත.

1994 දී අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයට බලපාන විවිධ සාධක අතර පවුල් පසුබිම අයහපත් වීම ප්‍රබල සාධකයක් බව ආනන්ද ජයවර්ධන විසින් පෙන්වා දී ඇත. මෙහිදී ළමුන්ගේ සමාජ ආර්ථික ස්වභාවය, වාසය කරන ප්‍රදේශය පවුල් පසුබිමට සම්බන්ධ බාධක ලෙස හඳුනාගෙන ඇත. අධ්‍යාපනයේ සම අවස්ථා

සැපයීමේදී ඉහළ සමාජ ආර්ථික පසුබිමක් ඇති නාගරික දෙමාපියන්ට ද්විතීයික අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමේ දී ග්‍රාමීය කෘෂි රැකියාවල නිරත දෙමාපියන්ගේ දරාවන්ට වඩා වැඩි වරප්‍රසාද සහ වාසිසහගතබවක් පවතින බව හෙළි වී ඇත.

**සමාජ පන්තිය හා ළමුන්ගේ අධ්‍යාපනය අතර සම්බන්ධය.**

1971 දී විලියම් එච් සෙවෙල් ගේ මූලිකත්වයෙන් ඇමරිකාවේ විස්කන්සින් සරසවියේ ආචාර්යවරුන් පිරිසක් සමඟ සමාජ පන්තිය හා අධ්‍යාපනය පිළිබඳ ශිෂ්‍යයන් 900ක නියදියක් මගින් අන්වායම අධ්‍යනයක් සිදු කර ඇත. දෙමාපිය ආදායම, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, පියාගේ රැකියාව යන සාධක පරීක්ෂා කරනවිට විවිද ආර්ථික කණ්ඩායම්වලට විවෘත වූ අධ්‍යාපන අවස්ථා අසමාන බව හෙළි වී ඇත. පහළ සමාජ තත්වයක් ඇති සිසුවෙකුට වඩා ඉහළ තත්වයක් ඇති සිසුවෙකුට පශ්චාත් අධ්‍යාපනයක් ලබා ගැනීමට 2 1/2 ගුණයකින් වැඩි අවස්ථා ඇති බව මින් තහවුරු විය. එසේම ඇමරිකා එක්සත් ජනපදය තුළ මධ්‍යම පන්තිය තුළ අධ්‍යාපනය පිළිබඳ ඉහළ අපේක්ෂණ ඇති බවත් පහළ සමාජ පන්තිය පහළ මට්ටමේ අපේක්ෂණ ඇති බවත් දක්වයි.

1971 දී ඩග්ලස්, රෝස්, සහ සිම්ප්සන් විසින් සිසුන් 4720 ගේ නියදියක් අධ්‍යනය කළ අතර ඔවුන් දුටුවේ සමාන දක්ෂතා ඇතත් විවිධ සමාජ පන්ති වලින් එන සිසුන්ගේ අධ්‍යාපන ප්‍රාප්ති මට්ටම් අසමාන බවයි. එසෙම කම්කරු පන්තියේ දෙමාපියන්ට වඩා වැඩි අවධානයක් මධ්‍යම පාන්තික දෙමාපියන් තම ළමුන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් දක්වන අතර ඔවුන්ගේ ළමුන් ක්‍රමයෙන් වැඩෙන විට මෙම උනන්දුව ද ක්‍රමයෙන් වැඩිවන බව පෙනේ.

1991 දී සමාජ පන්තිය හා අධ්‍යාපන අවස්ථා අතර සම්බන්ධයක් ඇති බව ඩබ්. ඒ. සිල්වා විසින් කරන ලද අධ්‍යනයක දී සොයා ගන්නා ලදී. පාසල් අධ්‍යාපනයෙන් ගිලිහී විපතිත වන්නන් අතර පහළ සමාජ ආර්ථික මට්ටමේ අනුපාතය ඉහළ වේ. මෙම ළමුන්ගේ නිවෙස්වල සම්පත් හිඟකම අධ්‍යාපනය හා එහි එල පිළිබඳ අවබෝධය අඩු වීම ගිලිහීයාම අසමත්වීම යන දුර්වලතා දැකිය හැකි විය.

මේ ආකාරයෙන් සාමජ ආර්ථික පසුබිම, සමාජ පන්තිය යන සාධක පමණක් නොව දෙමාපියන්ගේ ආදායම් මට්ටම. දෙමාපියන්ගේ රැකියාව. දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, නිවසේ පරිසරය, පවුලේ සංඛ්‍යාව ආදී බොහෝ සාධකයන් ළමුන්ගේ අධ්‍යාපනය සඳහා බලපානු ලබන බව විවිධ පර්යේෂණ මගින් හෙළි වී ඇත.

මෙම සියලු සාධකයන්හි ඍජු බලපෑම පාසල් සිසුන් පාසල් හැරයාමට බලපාන බව පෙන්වාදිය හැක. 1978 දී ලංකාවේ මහර අධ්‍යාපන මණ්ඩලයේ පාසල් හැර යන්නන් පිළිබඳ වික්‍රමරත්න කරන ලද අධ්‍යනයකින් පවුලේ සමාජ ආර්ථික පසුබිම හා සම්බන්ධ සාධක අනාවරණය කොට ගෙන ඇත. පවුලේ ආදායම

අඩුවන විට පාසල් හැරයාම වැඩිවන බව ඉන් එක් සාධකයකි. පියාගේ හා මවගේ රැකියාව සමගද පාසල් හැරයාම සම්බන්ධ බව හෙළි වී ඇත. අඩු ආදායම් ලබන හෝ රැකියාවක් නොකරන මව්වරුන් සිටින පවුල්වල පාසල් හැර ගොස් ඇති ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. එසේම පවුලේ ප්‍රමාණය වැඩි වන විටද පාසල් හැර ගොස් ඇති ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. මේ අයුරින් පාසල් සිසුන් පාසල් හැරයාමට සාමජ ආර්ථික පසුබිම, සමාජ පන්තිය යන සාධක පමණක් නොව දෙමාපියන්ගේ ආදායම් මට්ටම. දෙමාපියන්ගේ රැකියාව. දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, නිවසේ පරිසරය, පවුලේ සංඛ්‍යාව යන කාරණා රාශියක් බලපානු ලබන බව දැක්විය හැක.

**සාරාංශය**

මේ අයුරින් ශ්‍රී ලංකාවේ සිසුන් පාසල් හැර යාමට බලපානු ලබන සාධක පිළිබඳ විමසා බැලීමේ පෙනීයන ප්‍රධාන සාධක ලෙස සාමජ ආර්ථික පසුබිම, සමාජ පන්තිය, දෙමාපියන්ගේ ආදායම් මට්ටම, දෙමාපියන්ගේ රැකියාව, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, මව විදේශගත වීම, දෙමාපිය අපේක්ෂණය, ආදී සාධක රැසක් බලපානු ලබන බව දැක්විය හැක. ළමුන් ගේ සාමජ ආර්ථික පසුබිම පිළිබඳ සලකා බැලීමේ දී ළමුන්ට අහිතකර සමාජ පරිසරයක් පැවතීමත් දුප්පත්කම පැවතීම ආදී සාධක සෘජුවම හෝ වක්‍රාකාරයෙන් පාසල් හැර යාමට බලපානු ලබන බව දැක්විය හැක. එසේම සමාජ පන්තියද පාසල් හැරයාම සම්බන්ධයෙන් බලපානු ලබයි. පහළ සමාජ පන්තිවල ළමුන් ඉහළ සමාජ පන්තිවල ළමුන්ට සාපේක්ෂව පාසල් හැරයාමේ ප්‍රතිශතය ඉහළබව පර්යේෂණ මගින් හෙළිවී ඇත. පහළ සමාජ පන්තිවල ළමුන් මුහුණ දෙනු ලබන තාඩනපීඩන හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන අතරමග අඩාල වේ. දෙමාපියන්ගේ ආදායම් මට්ටම පහළයාම හේතුවෙන් ළමුන්ගේ අධ්‍යාපනය අතරමග නතර කර දමා ඔවුන් ද පවුලේ ආර්ථිකයට උරදීම හේතුවෙන් පාසල් හැරයාමට ඔවුන්ට සිදු වී ඇත. අධ්‍යාපනයට අවශ්‍ය මුදල් නොමැතිකම ද මේ සඳහා බලපානු ලබයි. දෙමාපියන්ගේ රැකියාව යන සාධකයද පාසල් හැරයාමට බලපානු ලබයි. ඉහළ රැකියාවල නිරත වන දෙමාපියන් තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දැක්වුව ද පහළ රැකියාවල නිරත වන දෙමපියන් තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්වන උනන්දුව අඩුකම ද ළමුන් පාසල් හැරයාමට බලපානු ලබයි. දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සැලකීමේදී ද අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්වන උනන්දුව අඩුකම ද ළමුන් පාසල් හැරයාමට බලපානු ලබයි. එසේම මව විදේශගත වීම හෝ මව හෝ පියා මිය යෑම ද දරුවන්ගේ අධ්‍යාපනය අඩාලවීමට බලපානු ලබයි.දෙමාපිය අපේක්ෂණය ද ළමුන්ගේ අධ්‍යාපනය අඩාලවීමට සේම පාසල් හැරයාමට ද බලපානු ලබයි. ළමුන් පිළිබඳ දෙමාපියන් තුළ පවතින අපේක්ෂණය. දරුවන් කෙරෙහි තබනා විශ්වාසය. දෙමාපිය ආදරය හා කරුණාව යන මේ සියලුම දෑ ළමුන්ගේ අධ්‍යාපනය සඳහා බලපානු ලබයි. මේ අනුව

පාසල් ළමුන් පාසල් හැරයාම සම්බන්ධයෙන් ආර්ථික හා සමාජීය සාධක සෘජුවම හෝ වක්‍රාකාරයෙන් බලපානු ලබන බව දැක්විය හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අතුකෝරළ, ඩී, ආර්., අතුකෝරළ, එච්, එන්. (1991). *අධ්‍යාපන මූලධර්ම ලිපි.* 305,ලියෝ මාවත,සිංහාරමුල්ල,කැලණිය, ශීලා ප්‍රන්ටින් වර්ක්ස්.

ජයවර්ධන ආනන්ද, එස්. (2000).ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ගැටළු. *අධ්‍යාපන විමර්ශන.* 1 කලාපය, 1-2.

ගලගමගේ,එස්. (2006). පවුලේ රැකියා පසුබිම හා දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා. *අධ්‍යාපන.* අංක 36 කලාපය, 78-85.

ගුණසේකර, එස්., බුත්පිටිය, ජේ. (1994). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අර්බුදය.* 94/1 ,අතුරුගිරිය පාර කොට්ටාව, සාර ප්‍රකාශන.

බණ්ඩා තිලකරත්න, ඩී, එම්. (1994). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ලිපි සරණිය.* 162/40, පැලවත්ත, පන්නිපිටිය, එඩ්නේ එන්ටප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්.

රුබේරු රංජිත්, ටී. (1964). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිණාමය (1 කොටස).* එම් ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.

වන්නිආරච්චි, ජේ, පී. (2004). *C.W.W.කන්නන්ගර චින්තනය හා අධ්‍යාපන කතා පුවත.* 2 පී/1,පහළයාගොඩ,ඉඹුල්ගොඩ, සෙනරත් ප්‍රකාශන.

වීරතුංග,එන්. (1981). *අධ්‍යාපන මූලධර්ම,අධ්‍යාපන නීතිය හා පරිපාලනය.* 142,අවිස්සාවේල්ල පාර,වැල්ලම්පිටිය, චරක මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශනයේ.

සිරිසේන,එච්. (1999). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු.* නූතන භාෂා අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.

රූපසිංහ,පී. (1978) ගාල්ල අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ද්විතීයික අධ්‍යාපන අවස්ථා පිළිබඳ අධ්‍යනයක්. අප්‍රකාශිත අධ්‍යාපනපති නිබන්ධනය. කොළඹ විශ්ව විද්‍යාලය.

Douglas,J.W.B.,Rose , J.M. and Simpson,H.R.,(1971).All our future. London;Peter Davies,Énther.

Plowden Repoet(1967),Grade Britain Children and Their Primary Schools, Dep of Education and Science,Central AdvisoryConcil for Educational Research and Surveyes,London.

Sewell William,H.(1971),Inequality of Opportunity for higher Education , American Sociological Review.

Central Bank Of Sri Lanka. (2016.06.11) Retrieved from https://www.googel.lk/search?q=central+bank+report+2015&oq =central+bank+report+2015&qs

# Ethical Issues in Social Science Research: A Review

H. D. P. Madushani[1]


## Abstract

Research is a systematic, socially organized quest for new and better insight. 'Research ethics' refers to a complex set of values, standards and institutional schemes that help constitute and regulate scientific activity. Ethical issues are becoming a crucial element in social research. It is compulsory for a social researcher conducting research involving humans to apply for ethical clearance. The aims of this study were to Ethical Issues in Social Science Research in Developing Countries discussed in the literature. This review used 20 various research efforts from 1982 to 2014, using key words research, ethics, social sciences, developing countries. 60% of them mostly concerned of research ethics and ethical issues of social science research. First, significant issues regarding of research ethics were identified. Then, as a result of a literature review and case studies, it was also found that ethical issues are mostly occurred in the countries which are still developing. The research findings indicated that Complex ethical issues in such countries need careful justification by social science researchers.


**Keywords:** Ethics, Issues, Social Science, Research

## Introduction

As a concept, 'research ethics' refers to a complex set of values, standards and institutional schemes that help constitute and regulate scientific activity. Ultimately, research ethics is a codification of ethics of science in practice. In other words, it is based on general ethics of science, just as general ethics is based on commonsense morality. Research is often intertwined with other specialist activities. The ethical responsibilities

[1] Department of Economics, University of Keloaniya. pavithra.hdm@gmail.com

inherent in research are partly associated with standards related to the research process, including relationships between researchers, and partly with respect for the individuals and institutions being studied, including responsibility for the use and dissemination of the research. Many standards must be weighed against other considerations and modified in the light of them when making specific assessments in individual cases.

Social science research has long been concerned with ethical issues. Social science investigates complex issues which involve cultural, legal, economic, and political phenomena (Freed-Taylor, 1994). This complexity means that social science research must concern itself with "moral integrity" to ensure that research process and findings are "trustworthy" and valid (Biber, 2005). Research involving human subjects is required to show respect for ethical issues by obtaining approval from the institution's Human Research Ethics Committee (HREC) prior to commencement. University policies on research ethics state that all research involving human subjects must comply with the 2007 National Statement on Ethical Conduct in Human Research. This policy applies to all researchers. In developing countries, where societies are often pluralistic, cultural background and security become important issues for social researchers in conducting fieldwork. This state of affairs can lead to the researchers finding it difficult to get letters of permission from the local authorities, and may lead to delays in conducting research.

## The value of research and research ethics

Research is a systematic, socially organized quest for new and better insight. Scientific knowledge is of value in and of itself. Many research results can also be useful for improving social conditions. The ultimate responsibility of research is to seek the truth. Accordingly, scientific integrity is a key aspect of research ethics. Cultural and social studies deal with human choices, actions and relations, standards and institutions, beliefs and historical developments, works and traditions, language, thought and communication. Empathy and interpretation are prerequisites for the research process. This can open the door to different, yet reasonable

interpretations of the same factors. However, the fallibility and inconclusiveness attached to research do not relieve researchers from the obligation to shun arbitrary views and to strive for coherence and clarity in their reasoning. In many disciplines, there is disagreement over fundamental questions of scientific theory. However, honest documentation and consistent reasoning are absolute requirements, regardless of scholars' position with a view to theory. In the humanities and social sciences, research is distinguished by researchers' views on society and humanity, a factor that is usually enriching. However, this requires that researchers consider how their own attitudes can colour their choice of topics, data sources and the balance between possible interpretations. At an overall level, all disciplines are subject to the same research ethics obligations, e.g. requirements for interesting and relevant research issues, verifiable documentation, impartial discussion of conflicting opinions, and insight into one's own fallibility. The requirements for professional independence and peer review are also universal. The basic research ethics standards are based on the general moral standards of society (Walton, 2013).

## The Nature of Ethics as Fundamental Basis for Social Sciences Research

Ethical issues are becoming a crucial element in social research. It is compulsory for a social researcher conducting research involving humans to apply for ethical clearance. The ethical principles set out in the National Statement state that all research involving human subjects should be conducted in accordance with the following : people must be respected, benefits must be maximized and harms minimized, harm shall not be done, and subjects in studies must be treated equally (Akpabio & Esikot, 2014). Clearly, ethical behavior in social science research should be required of all researchers, including international students conducting research at universities in developed countries such as Australia. In Australia, the implementation of ethical standards should be based on the 2007 National Statement on Ethical Conduct in Human Research Therefor Australia's ethical standards put considerable emphasis on protecting the privacy of research participants. Almost all research guarantees the participant's

confidentiality. This means they are assured identifying information will not be made available to anyone who is not directly involved in the study.
The effective administration of these ethical rules means that there needs to be a procedure which ensures researchers will consider all relevant ethical issues, including guaranteeing respondents' privacy, when formulating research plan (Mollet, 2011). To address such needs, most institutions and organizations have established one or more Human Research Ethics Committees (HREC), a panel that reviews research proposals with respect to ethical implications, and decides whether additional actions need to be taken to ensure the safety and rights of participants. In practice, the Ethics Committee at a number of universities has seen its task as including helping to protect both the organization and the researcher against potential litigation with respect to failure to address important ethical considerations on behalf of participants.

**Debate of Ethical Issues in Social Research**

Several difficult issues have arisen in the application of ethical principles to social research. The first issue is associated with covert research. It is still questionable whether or not it is ethical for social science research scholars to covert research. According to Hesse-Biber & Nagy (2011), covert research is appropriate where it is necessary to achieve a better understanding of certain social phenomena. An example of this kind of research is the investigation of the social life of drug dealers and drug users. As pointed out by (Hesse-Biber & Leavy, 2011), it is impossible to ask for informed consent from members of such communities, because they do not want to be investigated. It has also been argued that the very act of seeking informed consent from some research participant can lead to a change in the attitude of the research participant towards giving information to the researchers. Other authorities, however, have argued against the covert research, stating that it is unnecessary in social research. Homan (1991) argues, moreover, that covert research may have a negative impact for the researchers. He believes that as long as the respondents 'trust' the researcher, there is no need to conduct covert research. Homan claims that covert research is likely to invade the privacy of the respondent

to an unacceptable degree and he argues that using covert research makes social science research no different from journalism.

A second issue relates to the role of researcher as participant- observer. The main concern here is that the researcher should be neutral in order to maintain their aim of 'objectivity' in their research project (Gans, 1982). In research experience where the researcher also acts as a participant, he or she must normally develop and maintain close relationships with other community members. Some ethnographers have argued that a closer relationship between the researchers and participants of this kind can lead to conflict and deception (Hesse-Biber & Nagy 2011). Researchers may find it difficult to make objective judgments in their research if they are personally connected with their respondents.

A third issue concerns the nature of ethical regulation. With universities setting up Ethics Committees to review research proposals through a process of ethical review, and with academics under pressure to obtain for research grants (Hesse-Biber & Nagy (2011), researchers have raised concerns that increased ethical review is circumscribing their ability to make their own decisions about ethical issues relating to their specific projects. Ethical regulation has produced a formulaic approach to research ethics, in which researchers may feel constrained to tick the right boxes, rather than to think through ethical principles themselves. There is also a problem that basic ethical principles may lead to different and conflicting prescriptions. (Social Research Association, 2003). Haggerty (2004) expresses her point by using term 'ethics creep' to characterize the change in social science research that has taken place 'in the name of ethics.

A further issue relates to 'vulnerable groups'. In most ethical clearance processes, the social science research category "vulnerable group" refers to children and young people, people with mental health problems and people with learning disabilities. In considering applications for ethics clearance, Ethics Committees ask for special consideration to be given to 'vulnerable groups', because they have difficulties in providing initial and continued informed consent to conduct research. This concern has led to an insistence on more complicated procedures to protect the interests of such groups. Moreover, Some social researchers, however, have argued strongly

against defining such groups as ‘vulnerable’ and ‘incompetent’ on the grounds that it makes researchers more likely to exclude from research and thus to deprive them of the benefits of research. These researchers insist that it is unethical to exclude people from research on this basis. Researchers have argued, particularly in the area of child research, that interpreting groups as vulnerable has had a negative impact on the focus of research and the ways in which it is conducted. It has been argued that the onus is on researchers to find ways of obtaining consent from individuals that is meaningful to them, regardless of their abilities.

The final issue relates to informed consent. Increased bureaucratization of social science research resulting from the broad changes taking place in research governance and regulation means that social researchers increasingly have to have their research projects assessed by Ethics Committees. One of the results of this increased bureaucratization has been the expectation that researchers will proved that they have obtained informed consent by providing forms signed by research participants. The main reasons that Ethics Committees insist on informed consent are i) to ensure that participants understand what participation will involve and that they know their rights in relation to participation and issues of confidentiality and anonymity, ii) to protect researchers from later accusations by study participants. Some social researchers argue that the use of informed consent is not appropriate in all types of research. This concern is that respect for confidentiality and anonymity may contribute to secrecy in matters of public interest. The objections to signed consent forms have been raised particularly by researchers working in the area of criminology.

## Conclusion

This article provides an insight into the debate concerning ethical issues in social science research. Debate within social science relating to issues such as covert research, regulation, vulnerable group, letter of consent has become important. There are numerous concerns for social science researchers when conducting fieldwork in developing countries. These

include the lack of experience in dealing with bureaucratized ethics procedures, the need for cultural sensitivity, security concerns and the consequences of administrative and political practices in developing countries. Therefore, careful consideration is needed in the application of ethical approval which often cannot be applied universally in developing countries. Complex ethical issues in such countries need careful justification by social science researchers.

**List of References**

Akpabio, E.M & Esikot, I. S. (2014). Social sciences and research ethics in developing countries: The perspective from Nigeria. *African Journal of Science, Technology, Innovation and Development*. 6(4). Retrived from http://www.tandfonline.com/doi/abs/10.1080/20421338.2014.902562

Freed-Taylor, M. (1994), 'Ethical considerations in European cross-national research' *International Social Science Journal*, (142). Retrieved from https://books.google.lk/books

Gans, H. (1982). 'The Participant of Observation as a Human Being: Observation on the Personal Aspect of Fieldwork'. In Burgess, R.C., *Field Research: A Sourcebook and Field Manual* London, George Allen and Unwin.

Haggerty, K.D. (Winter 2004), 'Ethics Creep: Governing Social Sciences Research in the Name of Ethics', *Qualitative Sociology*, 27(4).

Hesse-Biber, S.N & Leavy, P. (2011). *The Practice of Qualitative Research*. Retrived from *https://books.google.lk/books*

Hesse-Biber, S.N & Nagy, S. (2011). *The Handbook of Emergent Technologies in Social Research. Retrived from*

*https://books.google.lk/books?id=Q9HlpMF7GgkC&printsec=frontcover#v=onepage&q&f=false*

Homan, R. (1991). *The Ethics of Social Research*, London, Longman.

Mollet, J. A. (2011). Ethical Issues in Social Science Research in Developing Countries: Useful or Symbolic. Retrieved from http://www.austneth.net/transmission_proceedings/papers/Mollet.pdf

Social Research Association (2003) *Ethical Guidelines*, London, Social Research Association.

Walton, N. (2013, May 4). What Is Research Ethics? [Research ethics.ca]. Retrived from https://researchethics.ca/what-is-research-ethics/

# ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය

එල්.ජී.ඩී. පෙරේරා[1]

**සංක්ෂේපය**

සාමාන්‍යය ජන ජීවිතය තුළ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් මෙම යුගය වනවිට රැකියා, කලා, විනෝදාංශ, ක්‍රීඩා සහ අධ්‍යාපනය වැනි බොහොමයක් ක්ෂේත්‍රයන් සඳහා පරිගණකය නැතිවම බැරි මෙවලමක් බවට පතව තිබේ. වර්තමාන ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 26.8%ක් වේ. 2010 වන විට ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය 20%ක පමණ පහළ අගයක් සංඛ්‍යාත්මකව මෙසේ දැක්විය හැකි වෙතත් ප්‍රායෝගික මට්ටමින් සලකා බැලීමේදී පරිගණක භාවිතය මෙන්ම පරිගණක අධ්‍යාපනයද නාගරික ප්‍රදේශ වලටම සිමාවී ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකිය. විදේශාධාර ව්‍යාපෘතීන් යටතේ, බොහෝ පාසල් වලට පරිගණක හෝ පරිගණක විද්‍යාගාර ලබාදී තිබුණත් එමගින් සාධනීය සේවයක් ඉටු වන්නේද? එම පරිගණකාගාර මගින් සාධනීය සේවයක් ලබා ගැනීමට නම් ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදයන් කවරේද? යන්න විමසාබැලිය යුතුය. මෙම අධ්‍යයනය සඳහා ද්විතීක දත්ත භාවිතා කළ අතර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබාගන්නා ලදි. එමෙන්ම ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම දත්ත විශ්ලේෂණ සඳහා භාවිතා කරන ලදී.

පරිගණක සාක්ෂරතාවය හා පරිගණක දැනුම ගැන සැලකීමේදී පාසැල් සිසුන්ගේ පරිගණක අධ්‍යාපනය, උසස් අධ්‍යාපනයේදී, රැකියා කටයුතු සඳහා මෙන්ම වැඩිහිටි අධ්‍යාපනය තුළ පරිගණක භාවිතය වැනි ක්ෂේත්‍ර සමුදායක් සැලකිය යතු වන අතර මෙම ලිපියෙන් ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය පිළිබඳව අවධානය යොමු කෙරිණි.

**මුඛ්‍ය පද** :පරිගණක සාක්ෂරතාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ශ්‍රී ලංකාව

## හැඳින්වීම

පරිගණක සාක්ෂරතාව යනු පරිගණක හා තාක්ෂණය පිළිබඳ දැනුම හා ඒවා කාර්යක්ෂමව භාවිතා කිරීමේ හැකියාවයි. පරිගණක ක්‍රමයට හෝ පරිගණක හා සම්බන්ධ වෙනත් මෘදුකාංග (Aplication) භාවිතා කිරීමේදී පුද්ගලයෙකුට එම කාර්‍යය කරරීමේ හැකියා මට්ටම් ලෙසද මෙය හඳුන්වයි. පරිගණක සාක්ෂරතාවයේ තවත් වැදගත් අංශයක් වන්නේ පරිගණක ක්‍රියාත්මක වන්නේ

[1]ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. gdinusha.perera@gmail.com

කෙසේ ද යන්න දැන සිටීමයි. 2005 දී මූලික පරිගණක හැකියාව පැවතීම දියුණු රටවල සැළකිය යුතු ලක්ෂණයක් වූ අතර 2005 වසරේදී පරිගණක අධ්‍යාපනය දියුණු කිරීමට වැදගත් පියවර කිහිපයක් ගන්නා ලදී. සෑම පාසලකටම පරිගණක විද්‍යාගාරයක් ලබාදීම සඳහා ආණ්ඩුව පියවර ගත්තේ මීට වසර කිහිපයකට පෙර ය. ඉංග්‍රිසි අධ්‍යාපනය හා පරිගණක අධ්‍යාපනය අනාගත ලෝකය ජයගත හැකි ප්‍රධාන මෙවලම් දෙක වේ. ඒ අනුව විදේශ ආධාර හා විදේශීය උපදේශන ද යොදා ගනිමින් මේ අංශ දෙක දියුණු කිරීමට පියවර ගෙන ඇත. අද වන විට ගුරුවරුන් විදේශවලට යවා ඒ සම්බන්ධයෙන් පුහුණුව ද ලබා දී තිබේ. මේ අයුරින් පරිගණක අධ්‍යාපනයේ හා ඉංග්‍රිසි අධ්‍යාපනයේ විශාල දියුණුවක් දක්නට ලැබී තිබේ.

ශ්‍රී ලංකාවේ පරිගණක අධ්‍යාපනය ඉතා ශීඝ්‍ර දියුණුවක් ලබයි. එය රටේ සංවර්ධනය පිළිබඳ කදිම සාක්ෂියක් ලෙස පවතී. මෙරට ග්‍රාමීය ප්‍රදේශ කරා පරිගණක තාක්ෂණය වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මේ වෙනස ඇති වූයේ 2005 පටන් ය. එදා රටේ පරිගණක සාක්ෂරතාව 4%ක් වූ අතර අද වන විට එය 26.8%දක්වා ඉහළ ගොස් තිබේ. මෙය ඉතා යහපත් තත්ත්වයකි.

පරිගණක උපාධිධාරීන් සඳහා විදේශීය රැකියා වෙළෙඳ පොළ හැම විටම විවෘත ය. ඉන්දියාවේ ඇතැම් ප්‍රාන්ත පරිගණක අධ්‍යාපනයෙන් නිසි ප්‍රයෝජන ගන්නා බව ඉතා පැහැදිලි ය. ශ්‍රී ලංකාවට ද එම තත්වය කරා පැමිණිය හැකිය. පරිගණක ක්ෂේත්‍රයේ නිර්මාණාත්මක හැකියාවන් ඉහළින් ම දක්වන දරුවෝ සෑම පළාතකම සිටිති. ඇතැම් ජාත්‍යන්තර තරගවලදී ලෝකයේ පළමු තැනට පත්වීමට තරම් දක්ෂ දරුවෝද අපේ රටේ සිටිති. ඔවුන් විධිමත් වැඩසටහන් ඔස්සේ ඉදිරියට ගතහොත් අන්තර්ජාතික වශයෙන් අපට ලබා ගතහැකි කීර්තිය ඉමහත් ය. එලෙසම අපට දිනාගත හැකි වෙළෙඳපොළද සුවිශාල ය.

මේ වන විට සෑම පාසලකටම පරිගණක විද්‍යාගාරයක් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක ය. තොරතුරු තාක්ෂණය පිළිබඳ විෂයය උගන්වන පාසල් ද තිබේ. අ.පො.ස. සාමාන්‍ය පෙළ, උසස් පෙළ පමණක් නොව උපාධි, පශ්චාද් උපාධි සඳහා ද පරිගණක විෂය ඇතුළත් කර තිබේ. මේ විෂයයෙන් උපාධි ලබාගැනීම සඳහා විශාල පිරිසක් ඉදිරිපත් වන බවද මෙරට විශ්වවිද්‍යාල දෙස බලන විට පෙනී යයි. එය මෑතක සිට ශ්‍රී ලංකාව ලබන විශාල දියුණුවක් සේ සැලැකිය හැකිය.

**පාසැල් සිසුන් පරිගණක සාක්ෂරතාවය**

අද වන විට පරිගණකාගාර සහිත පාසැල් විශාල සංඛ්‍යාවක් ඇතත්, බොහොමයක් පාසැල් වලට පරිගණකාගාරයක් දැකිය නොහැක. දිවයින පුරා එක ලෙසට පරිගණක සාක්ෂරතාවයක් පවත්වා ගෙන යාමට නම් දිවයිනේ සෑම ප්‍රදේශයකම පාසැල් වලට පරිගණකාගාර ලබා දිය යුතුය. එසේම දැනට පවත්නා පරිගණකාගාර වලින්ද උපරිම ඵල නෙලා ගැනීමට කටයුතු කළ යුතුය.

පවතින පරිගණකාගාර වල උවද අධ්‍යාපනය සඳහා සුදුසු විෂය නිර්දේශයන්, එම විෂය නිර්දේශයන් ඉගැන්වීමට අවශ්‍යය මෘදුකාංග, පරිගණක භාෂා යනාදී හා අන්තර්ජාල පහසුකම් නිසි පරිදි ඇති බවක් දැකිය නොහැකිය. පරිගණක සාක්ෂරතාවය යටතට ගැනෙන්නේද මූලිකව පරිගණකයක් භාවිතා කිරීමේ හැකියාවය. එයට සරලව Ms office හා අන්තර්ජාලය භාවිතා කිරීමේ හැකියාව වුවද සැලකේ. එහෙත් පාසල් අධ්‍යාපනය තුළ පරිගණක ඉගැන්වීම මෙම මූලික දැනුමට පමණක් සීමා නොවිය යුතුමය.

අද වැඩිහිටියන්ට සාපේක්ෂව, තරුණ පරපුර මෙන්ම පාසැල් සිසුන් පවා සිතන්නේ තමන් පරිගණක දැනුම ඇත්තන් ලෙසින්ය. එහෙත් මදක් පරීක්ෂාකරිව විමසා බැලු විට පෙනී යන්නේ අන්තර්ජාලයේ විද්‍යුත් ලිපි, සමාජ ජාල (Facebook, Twitter), Ms word, Ms excel, Ms powerpoint හැරුණු විට ඇත්තේ ඉතා මද දැනුමක් බවය. එම දැනුම උවද මැනවින් නිරීක්ෂණය කිරීමේදී, විධිමත් ආකාරයට ලැබී ඇති බවක් හෝ ලබා ගෙන ඇති බවක් නොපෙනේ. ලිපියක පේළි කිහිපයක් යතුරුලියනය කිරීමේදී පවා යතුරුපුවරුවේ අකුරු ඇති තැන් සොයනුද දැකිය හැකිවේ. බොහෝ විට ජංගම දුරකථන වල ස්පර්ශයෙන් යතුරු ලියනය කිරීමට පුරුදුවී සිටීමද මෙයට එක හේතුවක් වේ. පාසැල් පරිගණකාගාර අතුරින් අන්තර්ජාල පහසුකම් ඇති ප්‍රමාණයද 7%ක් පමණය. තොරතුරු තාක්ෂණය ඉගැන්වීමට නම් අන්තර්ජාල පහසුකම් තිබිය යුතු වෙනවා මෙන්ම, අන්තර්ජාල භාවිතයේ අනිටු බලපෑම් වැලැක්වීමට ද පියවර ගත යුතුවෙයි. අන්තර්ජාල භාවිතයේ හොඳ මෙන්ම නරක ප්‍රතිඵල පිළිබඳවද පාඩම් මාලා තුළින්ම සිසුන් දැනුවත් කරවීමේ හැකියාව තිබේ. ජාල කරණය කළ පරිගණක පද්ධති තුළ සිසුන්ට වෙන් වෙන් වශයෙන් භාවිත නාම ලබාදීමෙන් පාසැල් කාල පරිච්ඡේද තුළදී අන්තර්ජාලය සිසුන් විසින් අනිසි ලෙස භාවිතා කිරීමේ පියවර ගත හැකිය.

පසු ගිය කල වකවානුවේ තොරතුරු තාක්ෂණය ශ්‍රී ලංකාව තුළ පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට තරමක බාධාවක් වූයේ සාමාන්‍යය ජනයාගේ මෙන්ම සිසුන්ගේද භාෂා දැනුමයි. බොහෝ විට ඉංග්‍රිසි භාෂා ගුරුවරුන් පරිගණක ගුරුවරුන් ලෙස කටයුතු කිරීමටද මෙය හේතුවක් වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. මේ වන විට යුනිකේත ක්‍රමයෙන් සිංහල මෙන්ම දෙමළ භාෂාවන්ද අන්තර්ජාලයට එක්වී ඇති නමුත් තවමත් සිංහල පරිගණක අක්ෂර මෙන්ම සිංහල යුනිකේත භාවිතා කරන්නේද අඩු ප්‍රමාණයකි. මේ පිළිබඳ දැනුමද පාඩම් මාලාවන්ට එක් කළ යුතුමය.

මේ කරුණු පිළිබඳව සලකා බැලීමේදී පරිගණක අධ්‍යාපනයේදී සාධනීය සේවයක් ඉටු කළ හැකි ගුරුවරුන්ගේ සේවය අත්‍යවශ්‍ය වේ. බොහෝවිට පාසැල් වල පරිගණක අධ්‍යාපනයෙහි නිරත වන්නේ විධිමත් පරිගණක අධ්‍යාපනයක් ලැබූ ගුරුවරුන්ද නොවේ. බොහෝ විට වෙනත් විෂයක් සඳහා සුදුසු කම් ලැබූ ගුරුවරයෙකි. විටෙක ඉංග්‍රිසි භාෂාව සඳහා සුදුසුකම් ගුරුවරයෙකි. නියමිත විෂය

නිර්දේශයන් ඉගැන්වීම සඳහා මනාව පුහුණුව ලැබූ, එසේම අන්තරජාල හා ජාල පද්ධති පිළිබඳවද අවබෝධයක් ඇති ගුරුවරුන් අවශ්‍යයම වේ.

පාසල් සිසු සිසුවියන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම සඳහා පාර්ශවයන් තුනක් දායක විය යුතුවේ. එනම් ළමයා, දෙමව්පියන් සහ පාසල් ගුරුභවතුන් ය. මෙම පාර්ශ්වයන්ගේ අන්නෝන්‍ය සම්බන්ධය මගින් ළමයාගේ පරිගණක දැනුම ඉදිරියට ගෙනයාමට මහත් අත්වැලක් වනු ඇත. එනම් ළමයාගේ පරිගණක දැනුම වර්ධනය වන්නට නම් දෙමව්පියන්ගේ සහ ගුරුවරයාගේ නොමඳ දායකත්වය අත්‍යවශ්‍යය වේ. මෙහිදී දෙමව්පියන් සහ පාසල් ගුරුවරුන් ළමයාට සේවා සපයන්නන් ලෙස හැසිරිය යුතුවේ. එම සේවාවන් ප්‍රයෝජනයට ගෙන ළමයා පාසලේ දී සිදු කරනු ලබන ඉගෙනුම් ක්‍රියාවලියට දායක විය හැකිය. තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ සිසු පිරිසක් බිහි කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ගයන් නම්, ළමයා පරිගණක ප්‍රදර්ශන වලට සහ වැඩමුළු වලට සහභාගි කරවීම, පරිගණක භාවිතා කරන රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන වලට ක්ෂේත්‍ර චාරිකා රැගෙන යාම සහ පරිගණක තාක්ෂණය පිළිබඳව ක්‍රමානුකූලව ඉගෙන්වීමයි. එනම් පාසල් වල 6 ශ්‍රේණියේ සිට 13 වසර දක්වා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉගෙන්වීම් කටයුතු සිදු කිරීමයි. මෙහිදී ලබන දැනුම උසස් අධ්‍යාපනයට අඩිතාලමක් වේ. පරිගණක තාක්ෂණයෙන් ලියවුණු පොත්පත්/සඟරා පරිශීලනයට අවස්ථාව සැලසීම මෙන්ම එමගින් පරිගණක මගින් කළ හැකි දෑ පිළිබඳව සිතීමටත් ඒ ඔස්සේ විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීමටත් අවස්ථාව සැලසෙයි.

**උසස් පෙළ විෂය මාලාවට තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම**

වර්තමානයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සාමාන්‍යය පෙළ විභාගය සඳහා වෛකල්පිත විෂයක් ලෙස පවතියි. ඇතැම් සිසුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වෙනුවට වෙනත් විෂයයන් සඳහා පෙනී සිටියි. නමුත් උසස් පෙළ විෂය මාලාවට සාමාන්‍ය තොරතුරු තාක්ෂණය විෂය හඳුන්වා දීමෙන් සෑම සිසු සිසුවියකටම පරිගණක දැනුම ලබා දීම අපේක්ෂා කෙරේ. ඇතැම් පාසල් වල මෙම විෂය ඉගෙන්වීමේ කටයුතු තවමත් අරඹා නැත. වර්තමානයේ උසස් වැටුපක් සහිත රැකියාවක් ලබා ගැනීමට පරිගණක දැනුම අත්‍යවශ්‍යය වන බව නොරහසකි.

**පරිගණක පිළිබඳව දෙමව්පියන්ගේ අල්ප දැනුම**

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල්වල දෙමව්පියන්ගේ පරිගණක දැනුම දුර්වල තත්වයේ පැවතීම නිසා ළමුන් ඉන් අයුතු ප්‍රයෝජන ගැනීම මෑත කාලීනව දැකිය හැකි මහත් වූ ඛේදවාචකයකි. මින් මිදීම සඳහා කළයුතු වන්නේ වැඩිහිටියන් සහ දෙමව්පියන් දැනුවත් කිරීම සහ පරිගණකයෙන් ගත හැකි ඉගෙනුම් කටයුතු පිළිබඳව ළමයා දැනුවත් කිරීමයි. එවිට ළමුන්ට පරිගණකය භාවිතයෙන් විවිධ අකටයුතුකම් කිරීම සඳහා අවස්ථාවක් නොලැබෙන අතරම

පරිගණකය භාවිතයෙන් කළහැකි කාර්යයන්/ක්‍රියාකාරකම් පිළිබඳව ළමයාට තේරුම් යනු ඇත.

**රැකියාවන් සඳහා අමතර සුදුසුකමක් ලෙස පරිගණක දැනුම**

මෑත කාලීනව රැකියා ක්ෂේත්‍රයේ සෑම රැකියාවක් සඳහාම අමතර සුදුසුකමක් ලෙස පරිගණක දැනුම අත්‍යවශ්‍යය වන අතරම පාසලේදී ලබා දෙන අධ්‍යාපනයට අමතරව ප්‍රායෝගික දැනුමෙන් පිරිපුන් පුද්ගලයින් තම ආයතනවලට බඳවා ගැනීම ඔවුන්ගේ අරමුණයි. මෙම ප්‍රවණතාව පෞද්ගලික ආයතන වල මෙන්ම රාජ්‍යය ආයතනවල ද දැකිය හැකිය. මෙම ආයතන ඉංග්‍රිසි දැනුමට අමතරව තොරතුරු තාක්ෂණික(පරිගණක) දැනුම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරයි. තොරතුරු තාක්ෂණික විෂයන් පිළිබඳව හොඳ දැනුමක් තිබීම රැකියාවක් තෝරා ගැනීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වන අතරම ඉහළ වැටුප් තලයක් සහිත රැකියාවකට මූලික අඩිතාලම වේ. ආයතනයක කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා කාර්යාල කටයුතු වලදී ඉතා නිවැරදිතාවයකින් වැඩ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍යය මූලික දැනුම තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂය හැදෑරීමෙන් ඔබට ලැබෙනු ඇත.

**වැඩිහිටි පරිගණක සාක්ෂරතාවය**

පරිගණක සාක්ෂරතාවය ගැන විමසීමේදී වැඩිහිටි පරිගණක අධ්‍යාපනය කෙරෙහිද යොමු විය යුතුමය. වෙනත් විෂයක් මෙන් නොව, පරිගණක තාක්ෂණය දෙසට නව පරපුර වහා යොමුවන තරමටම වැඩිහිටි එමෙන්ම කාන්තාවන් නව තාක්ෂණයට ඇති බිය නිසාවෙන්දෝ පරිගණකයට සමීප වීමට මැළි කමක් දක්වන බවක් පෙනේ. එහෙත් පරිගණයේ එදිනෙදා භාවිතයේ අනිසි බලපෑම් වැලක්වීමට නම් වැඩිහිටියන්, විශේෂයෙන්ම කාන්තාවන්, මව්වරුන් පරිගණක භාවිතය පිළිබඳව දැනුවත් වීම ඉතා වැදගත්ය. ප්‍රාදේශීය පරිගණක මධයස්ථාන මගින් හෝ වැඩිහිටියන් හා කාන්තාවනටද මූලික පරිගණක දැනුමක් ලබාදීමට කටයුතු කළ හැකිනම් සුදුසු යැයි හැඟේ. මේ ආකාරයට විධිමත් පරිගණක අධ්‍යාපන ක්‍රියාවළියක් සඳහා අදාළ අංශවල ඉහළ සිටම ක්‍රියාත්මක විය යුතු උනත්, තම හැකියාවන් අනුව පාසැල් හා අනිකුත් පරිගණක මධ්‍යස්ථාන ප්‍රධානීන් හා ආචාර්යවරුන් තිබෙන සම්පත් වලින් උපරිම ඵල නෙලා ගැනීමටත්, එසේම අදාළ අංශවල ඉහලම තලයේ සිට මෙම කරුණු පිළිබඳවද අවධානය යොමු කරමින් සුදුසු පරිගණක අධ්‍යාපන ක්‍රියාවලියක් මෙන්ම සම්පත් බෙදා හැරීමේ හා කළමනාකරණය කිරීමේ පිළිවෙතක්ද ක්‍රියාත්මක කළහැකි නම් ඉතා අගනේය.

මේ කාලය වන විට ලෝකයේ ප්‍රකට ලේඛකයන් පත්‍රකලාවේදීන්ගේ සියලූ ලේඛන කටයුතු සිදුවන්නේ පරිගණකය ඔස්සේ ය. ශ්‍රී ලංකාවේ කීර්තිමත් භික්ෂුවක වූ බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියෝ සිය අවසන් කාල පරිච්ඡේදය තුළදී පරිගණක පුහුණුවක් ලැබූහ. ඒ උන්වහන්සේ එහි අගය දන්නා නිසාය.

පරිගණකය තුළ මුළු ලෝකයම හකුළුවා ඇතැයි කියනු ලැබේ. එහි අනෙක් විස්මය වන්නේ මේ මෙවලම ප්‍රතිභා සම්පන්න මොළ ගෙඩියක් සේ අලුත් දෑ තැනීමට යෙදවිය හැකි බැවිනි. කුමක් වුව පරිගණකයෙන් තොර ලෝකයක් ගැන සිතාගත නොහැකි ය. ලෝකයේ දියුණු රටවල් පරිගණක අධ්‍යාපනය සඳහා සුවිශේෂ උනන්දුවක් දක්වති. ශ්‍රී ලංකාව යනු මධ්‍යම ප්‍රමාණයේ ආදායම් ලබන රාජ්‍යයෙකි. අප මෙතැන් සිට ඉහළ ආදායම් ලබන රාජ්‍යයක් වෙත යා යුතුය. ඒ ගමනේදී අවශ්‍යයෙන්ම භාවිත කළ යුතු මෙවලම පරිගණකය යි. ඒ පිළිබඳ විවිධ සුදුසුකම් සපුරා තිබීම අපට ඇති ආයෝජනයක් සේ සැලැකිය හැකි ය.

**විශ්ලේෂණය**

ශ්‍රී ලංකාවේ අවසන් වරට 2015 පරිගණක සාක්ෂරතා සමීක්ෂණ දත්ත මගින් මෙරට පරිගණක අධ්‍යාපනයේ ප්‍රගතියක් ලබා තිබෙන බව පෙන්නුම් කරයි. මෙම දෙපාර්තමේන්තුව මඟින් 2015 වර්ෂයේ පළමු මාස 6 සඳහා ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතා සංඛ්‍යා වාර්තාව නිකුත් කර ඇත. මෙම සමීක්ෂණයේ දත්ත රැස් කිරීම 2015 වසරේ මාස 12 තුළදීම පැවැත්වූ අතර, ශ්‍රී ලංකාව පුරා විසිරුණු ගෘහ කාණ්ඩ 25,000ක අවුරුදු 5-69 වයස් කාණ්ඩයේ පුද්ගලයන්ගේ තොරතුරු රැස් කර තිබේ. මෙම සමීක්ෂණය සඳහා පරිගණක සාක්ෂරතාවය ලෙස නිර්වචනය කර ඇත්තේ පරිගණකයක් භාවිත කරමින් කුමක් හෝ කාර්යයක් ඉටු කර ගැනීමට ඇති හැකියාවයි.

මෙම සමීක්ෂණ වාර්තාවට අනුව නාගරික, ග්‍රාමීය හා වතු අංශ අතරින් ඉහළ පරිගණක සාක්ෂරතා අනුපාතය සියයට 39.2 ක් ලෙස නාගරික අංශයෙන් වාර්තාවේ. ග්‍රාමීය හා වතු අංශවල එය පිළිවෙලින් 25.5% ක් සහ 9% ක් ලෙස වාර්තා වන බව එම දෙපාර්තමේන්තුව පෙන්වාදෙයි.

ප්‍රස්තාරය 1: අංශ අනුව පරිගණක සාක්ෂරතාව




මූලාශය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

මෙම සමීක්ෂණය මගින් ශ්‍රී ලංකාවේ ගෘහ කාණ්ඩවලින් 24.6%කට අවම වශයෙන් එක් පරිගණකයක් හෝ සතු බව හෙළිවී ඇත. මෙරට ගෘහකාණ්ඩ සතු පරිගණකවලින් 67%ක් පමණ සිය පළමු පරිගණකය ලබා ගෙන ඇත්තේ 2010-2014 කාල පරිච්ඡේදය තුළ බවද වාර්තා වී ඇත.

වගුව 1: අංශ අනුව පරිගණක ඇති කුටුම්භ ප්‍රතිශතය

| අංශ | Desktop ප්‍රතිශතය | | | | | Desktop or Laptop ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2004 | 2006 | 2009 | 2014 | 2015 | 2009 | 2014 | 2015 |
| **ශ්‍රී ලංකාව** | **3.8** | **8.2** | **10.6** | **16.6** | **15.4** | **11.4** | **22.4** | **24.6** |
| නාගරික | 10.5 | 17.8 | 23.6 | 25.8 | 23.2 | 26.3 | 35.8 | 42 |
| ග්‍රාමීය | 3.1 | 6.9 | 9.2 | 15.3 | 14.4 | 9.8 | 20.4 | 22 |
| වතු | 0.3 | 1.1 | 3.1 | 2.7 | 3.9 | 3.3 | 4.6 | 5.4 |

මූලාශයඃ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

එමෙන්ම මෙරට නාගරික අංශයේ මෙන්ම ග්‍රාමීය අංශයේ ද ගෘහකාණ්ඩ 4කින් එක් ගෘහ කාණ්ඩයක් සතුව පරිගණකයක් පවතින බවට සමීක්ෂණයෙන් අනාවරණය වී ඇත. වගු අංක 4.1ට අනුව ශ්‍රී ලංකාවේ 2009ට සාපේක්ෂව ඩෙස්ක්ටොප් පරිගණකයක් ඇති නිවාස ගණනෙහි 4.8%ක වර්ධනයක් 2015 වන විට පෙන්නුම් කරන අතර එම වසර 6 ඇතුලත ඩෙස්ක්ටොප් හෝ ලැප්ටෝප් පරිගණකයක් සතු නිවාස ගණනෙහි 13.2%ක වර්ධනයක් පෙන්නුම් කරයි. පරිගණක භාවිත නිවාස ගනනෙහි නාගරික අංශයේ 42%ක ඉහල වර්ධනයක් පෙන්නුම් කරන අතර අඩුම අගයක් වතු අංශයේ වාර්තාවේ. එය 5.4%කි.

වගුව 2: පළාත් අනුව පරිගණක ඇති කුටුම්භ ප්‍රතිශතය

| පළාත් | Desktop ප්‍රතිශතය | | | | | Desktop or Laptop ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2004 | 2006 | 2009 | 2014 | 2015 | 2009 | 2014 | 2015 |
| **බස්නාහිර** | 8.4 | 16.4 | 19 | 24.5 | 23.3 | 20.7 | 33 | 38.7 |
| **මධ්‍යම** | 3.3 | 6.7 | 9.7 | 18 | 16.1 | 10.4 | 23.5 | 23 |
| **දකුණ** | 2.2 | 4.9 | 6.6 | 16 | 13.1 | 7.2 | 21 | 20 |
| **උතුර** | N.A | N.A | N.A | 10.8 | 8.6 | N.A | 19.5 | 19 |
| **නැගෙනහිර** | 1.2 | 3.7 | 5.8 | 9.6 | 8.1 | 5.9 | 14.7 | 12.8 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **වයඹ** | 3.1 | 4.8 | 6.9 | 14.5 | 13.8 | 7.1 | 20.1 | 21.7 |
| **උතුරු මැද** | 1.4 | 2.7 | 6.1 | 7.4 | 13 | 6.8 | 10.1 | 20.3 |
| **ඌව** | 0.4 | 2.7 | 4.6 | 9.2 | 6.9 | 4.9 | 11.1 | 10.9 |
| **සබරගමුව** | 2 | 3.3 | 7.3 | 13.7 | 12.8 | 7.5 | 16.6 | 18.1 |

මූලාශය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

ඉහත වගු අංක 2ට අනුව පරිගණක සාක්ෂරතාව වැඩිම පළාත බස්නාහිර පළාත ලෙස 38.7%ක් සහ අඩුම පළාත ඌව පළාත ලෙස 10.9%ක් වාර්තා වී ඇත. එනම් පරිගණකයක් සහිත ගෘහකාණ්ඩ වැඩි වශයෙන් පවතින්නේ බස්නාහිර පළාතේ වන අතර අඩුම සංඛ්‍යාවක් පවතින්නේ ඌව පළාතේ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වාදෙනු ලබයි.

වගුව 3: දිස්ත්‍රික අනුව පරිගණක සාක්ෂරතා අනුපාතය

| **දිස්ත්‍රික** | **සාක්ෂරතා අනුපාතය** | **දිස්ත්‍රික** | **සාක්ෂරතා අනුපාතය** | **දිස්ත්‍රික** | **සාක්ෂරතා අනුපාතය** |
|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **26.8** | හම්බන්තොට | 28.2 | කුරුණෑගල | 23.6 |
| කොළඹ | 47.1 | යාපනය | 21.7 | පුත්තලම | 25.4 |
| ගම්පහ | 32.8 | මන්නාරම | 11.5 | අනුරාධපුර | 22.3 |
| කළුතර | 32.3 | වව්නියාව | 26.9 | පොළොන්නරුව | 18.7 |
| නුවර | 32 | මුලතිව් | 8.9 | බදුල්ල | 15.2 |
| මාතර | 25.5 | කිලිනොච්චිය | 16 | මොනරාගල | 19.8 |
| නුවරඑළිය | 13.2 | මඩකලපුව | 13.8 | රත්නපුර | 21.1 |
| ගාල්ල | 26.8 | අම්පාර | 12.1 | කෑගල්ල | 20.2 |
| මාතර | 25.7 | ත්‍රිකුණාමලය | 12.4 | | |

මූලාශය: ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

වගු අංක 3ට අනුව දිස්ත්‍රික්ක වශයෙන් ගත් කළ, වැඩිම අගයක් ගන්නා කොළඹ දිස්ත්‍රික්කයේ පරිගණක සාක්ෂරතාවය සියයට 47.1කි. එසේම ගම්පහ, කළුතර සහ මහනුවර යන දිස්ත්‍රික්කවලද පරිගණක සාක්ෂරතාවය 30% ඉක්මවා ඇත. මුලතිව් දිස්ත්‍රික්කයෙන් අඩුම පරිගණක සාක්ෂරතාවය වාර්තා වන අතර, එය 8.9%කි.

2006 සහ 2007 වසර කාලසීමාවේ 162%ක් පමණ වූ මෙරට පරිගණක සාක්ෂරතාව 2015 වසර වනවිට 26.8% දක්වා ඉහළ ගොස් ඇති බව ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත මගින් පෙන්නුම් කරයි. එම දෙපාර්තමේන්තුව පරිගණක සාක්ෂරතාව පිළිබඳ නවතම සමීක්ෂණ වාර්තාවක් නිකුත් කරමින් වැඩිදුරටත් සඳහන් කරන්නේ පුරුෂයින්ගේ පරිගණක සාක්ෂරතාව 28.7% ක් ලෙස හඳුනාගෙන ඇති බවයි. එමෙන්ම කාන්තාවන්ගේ පරිගණක සාක්ෂරතාව සියයට 25.1% ක් ලෙස දැක්වේ. එනම් පුරුෂයින්ගේ පරිගණක සාක්ෂරතාවය ස්ත්‍රීන්ගේ පරිගණක සාක්ෂරතාවයට වඩා ඉහළ මට්ටමක ඇති බව තවදුරටත් පෙන්වාදෙයි.

ප්‍රස්තාරය 2: වයස අනූව පරිගණක සාක්ෂරතා අනුපාතය




මූලාශය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

වයස් කාණ්ඩ අනුව පරිගණක සාක්ෂරතාවය සැළකීමේ දී අවුරුදු 15-19 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයින්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ අගයක් ගන්නා අතර, එය 57.2%කි. වගු අංක 2ට අනුව 60-69ත් අතර වයස් කාණ්ඩයේ අඩුම අනුපාතයක් පෙන්නුම් කරයි. එනම් 6.0%කි. සමස්තයක් වශයෙන් 15-29ත් අතර වයස් කාණ්ඩයේ පුද්ගලයන්ගේ ඉහල සාක්ෂරතා අනුපාතයක් දැකිය හැකිය.

ප්‍රස්තාරය 3: අධ්‍යාපන තත්වය අනූව පරිගණක සාක්ෂරතා අනුපාතය




මූලාශය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

අධ්‍යාපන මට්ටම් අනුව ජනගහනය සැලකූ විට උසස් පෙළ සමත් හෝ ඊට වැඩි සුදුසුකම් ඇති කාණ්ඩයෙන් වැඩිම සාක්ෂරතා අනුපාතය 70.1%ක් ලෙස වාර්තා වී තිබේ. වගු අංක 4.1ට අනුව පාසල් නොගිය පුද්ගලයන්ගේ පරිගණක සාක්ෂරතා අනුපාතය 1.5%කි. එය වාර්තාවන අඩුම අගයද වේ. 6 ශ්‍රේණිය සමත් පුද්ගලයන්ගේ 10.1%ක්ද, 10 ශ්‍රේණිය සමත් පුද්ගලයන්ගේ 17.8%ක්ද, සාමාන්‍ය පෙළ සමත් පුද්ගලයන්ගේ 40.9%ක්ද වේ.

වගුව 4: වයස් කාණ්ඩ අනුව අන්තර්ජාලය හා විද්‍යුත් ලිපින භාවිතය

| **වයස් කාණ්ඩය** | **අන්තර්ජාලය (ප්‍රතිශතය)** | **විද්‍යුත් ලිපිනය (ප්‍රතිශතය)** |
|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **11.8** | **8.8** |
| 5 - 14 | 4.1 | 1.7 |
| 15 - 19 | 19.6 | 12.8 |
| 20 - 24 | 27.2 | 21.7 |
| 25 - 29 | 25.9 | 20.8 |
| 30 - 34 | 17.2 | 13.4 |
| 35 - 39 | 14.3 | 11.5 |
| 40 - 49 | 9.9 | 7.9 |
| 50 - 59 | 6.3 | 4.7 |
| 60 - 69 | 3.3 | 2.4 |

මූලාශය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

2015 වසරේ දී අවුරුදු 5-69 ත් අතර ජනගහනයෙන් සෑම පුද්ගලයන් සියදෙනෙකුගෙන් 12 දෙනෙකු අන්තර්ජාලය භාවිතා කර ඇති අතර, සෑම පුද්ගලයන් සියදෙනෙකුගෙන් 9 දෙනෙකු එක් වතාවක් හෝ විද්‍යුත් තැපෑල භාවිතා කර ඇති බව සඳහන් වේ.

එසේම අන්තර්ජාලය සහ ඊ-මේල් භාවිතය පිළිබඳව සැළකීමේදී, ඉහලම ස්ථානය හිමි කර ගෙන ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයයි. කොළඹ දිස්ත්‍රික්කයේ අන්තර්ජාලය භාවිතය, සියයට 27.6ක් වන අතර, ඊ-මේල් භාවිතය 21.2%ක් වන බව පෙනී යයි. රැකියා වියුක්තිකයන්ගෙන් වැඩිම පරිගණක සාක්ෂරතාවය, අවුරුදු 20-24 වයස් කාණ්ඩයෙන් වාර්තා වන අතර, එය 69.1%ක් වන බව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සතරසිංහ මහතා ප්‍රකාශ කරයි.

අන්තර්ජාලය භාවිතය අඩුම දිස්ත්‍රික්ය ලෙස මුලතිව් දිස්ත්‍රික්ය වාර්තාවේ. එය 2.6%කි. වව්නියාව, ගම්පහ, යාපනය, කළුතර, නුවර සහ ගාල්ල කොළඹට පසුව වැඩිම අන්තර්ජාලය භාවිතයක් දැකගත හැකිය. විද්‍යුත් ලිපින භාවිතය පිළිබඳ විමසීමේදී කොළඹට පසුව වැඩිම අගයක් ගම්පහ යාපනය සහ කළුතර දිස්ත්‍රික් වලින් වාර්තාවේ.

වගුව: 2.4.6 දිස්ත්‍රික අනුව අන්තර්ජාලය හා විද්‍යුත් ලිපින භාවිතය

| දිස්ත්‍රික්කය | අන්තර්ජාලය (ප්‍රතිශතය) | විද්‍යුත් ලිපිනය (ප්‍රතිශතය) | දිස්ත්‍රික්කය | අන්තර්ජාලය (ප්‍රතිශතය) | විද්‍යුත් ලිපිනය (ප්‍රතිශතය) |
|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **11.8** | **8.8** | මුලතිව් | 2.6 | 2.6 |
| කොළඹ | 27.6 | 21.2 | කිලිනොච්චිය | 5 | 6.5 |
| ගම්පහ | 18.1 | 13.6 | මඩකලපුව | 8.2 | 5.5 |
| කළුතර | 13.3 | 10.5 | අම්පාර | 6.8 | 4.4 |
| නුවර | 11.5 | 9.7 | ත්‍රිකුණාමලය | 6.5 | 5.6 |
| මාතර | 7.8 | 6 | කුරුණෑගල | 8.2 | 6.2 |
| නුවරඑළිය | 2.9 | 3 | පුත්තලම | 14 | 8.4 |
| ගාල්ල | 10.3 | 6.8 | අනුරාධපුර | 8 | 4.2 |
| මාතර | 6.8 | 5.2 | පොළොන්නරුව | 4.8 | 3.8 |
| හම්බන්තොට | 6 | 3.5 | බදුල්ල | 2.9 | 2.9 |
| යාපනය | 16.9 | 11.5 | මොනරාගල | 4.2 | 2.1 |
| මන්නාරම | 9 | 7.3 | රත්නපුර | 5.8 | 5.3 |
| වව්නියාව | 18.3 | 7.4 | කෑගල්ල | 5.6 | 4.2 |

මූලාශය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(2015)

**සාරාංශය**

මෙරට පරිගණක සාක්ෂරතාව පසුගිය වසර 10ක කාලය තුළ 11%ක ඉහළයාමක් පෙන්නුම් කරන බව ඉහත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දත්ත පෙන්වාදෙයි. 2006/2007 වසරවල 16.1%ක් වූ පරිගණක සාක්ෂරතාව 2015 වසර වන විට 26.8% ක් දක්වා ඉහළ ගොස් ඇති බව නවතම සමීක්ෂණයෙන් අනාවරණය වේ. නාගරික, ග්‍රාමීය හා වතු අංශ අතරින් වැඩිම පරිගණක

සාක්ෂරතාවක් නාගරික අංශයෙන් පෙන්නුම් කරන අතර ස්ත්‍රී පුරුෂභාවය සැලකිල්ලට ගත්විට පුරුෂ පක්ෂයේ පරිගණක සාක්ෂරතාව ඉහළ අගයක් ගන්නා බව සඳහන්ය. වයස් කාණ්ඩ සැලිකිල්ලට ගැනීමේ දී වැඩිම පරිගණක සාක්ෂරතාවක් පෙන්නුම් කරන්නේ අවුරුදු 15-19 අතර වයස් කාණ්ඩයෙන් වේ. එමෙන්ම මෙරට නාගරික අංශයේ මෙන්ම ග්‍රාමීය අංශයේ ද ගෘහ බාණ්ඩ 4කින් එක් ගෘහ කාණ්ඩයක් සතුව පරිගණකයක් පවතින බව මෙමගින් අනාවරණය වී ඇත. පරිගණකයක් සහිත ගෘහ කාණ්ඩ වැඩි වශයෙන් පවතින්නේ බස්නාහිර පළාතේ වන අතර අඩුම සංඛ්‍යාවක් පවතින්නේ ඌව පළාතේ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තවදුරටත් පෙන්වාදෙයි. අන්තර්ජාලය භාවිත කරන ජනගහණයෙන් වැඩිම ප්‍රතිශතය කොළඹ දිස්ත්‍රික්කයෙන් සහ අඩුම ප්‍රතිශතය මුලතිව් දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර සෑම පුද්ගලයින් සිය දෙනෙකුගෙන්ම 9 දෙනෙකු එක් වතාවක් හෝ විද්‍යුත් තැපැල භාවිත කර ඇති බවට අනාවරණය වී ඇත.

සංඛයාත්මකව මෙසේ දැක්විය හැකි වෙතත් ප්‍රායෝගික මට්ටමින් සලකා බැලීමේදී පරිගණක භාවිතය මෙන්ම පරිගණක අධ්‍යාපනයද නාගරික ප්‍රදේශ වලටම සිමාවී ඇති ආකාරයක් මනාව නිරීක්ෂණය කළ හැකි නමුත් අනාගතයේදී දිනෙන් දින ඉහළ යන පරිගණක සාක්ෂරතාවය පිළිබද සැලකීමේදී නගරෙයේ සේම ගමටද පරිගණක දැනුම ව්‍යාප්ත වෙමින් මීටත් වඩා ඉහළ පරිගණක සාක්ෂරතාවයක් ගනු ඇතැයි පෙනේ එනම් තව වැඩිකල් නොයාම ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 75%කට පමණ පරිගණක සාක්ෂරතාව ලැබෙන බව පිළිගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2009), *පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන වාර්තාව*, 12, ජූනි, 2016 Retrieved From file:///D:/Computer%20Literacy%20artic/BuletinComputerLiteracy_2009.pdf

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2014), *පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන වාර්තාව*, 20, ජූනි, 2016 Retrieved From file:///D:/Computer%20Literacy%20artic/BuletinComputerLiteracy.pdf

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2014), පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන වාර්තාව, 13, ජූනි, 2016 Retrieved From file:///D:/ABSTRACT/NCASSR%202016/ARTI/ComputerLiteracy-2015Q1-Q2-final%20.pdf

ශ්‍රී ලංකා මහ බැංකුව. (2015), *මහ බැංකු වාර්ෂික වාර්තාව*, කොළඹ 01, ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය. (2007), *සියවස් ප්‍රකාශනය* iii කාණ්ඩය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

ගුණරත්න, ආර්. (2009), *පාසලට පරිගණක*, 10, පෙබරවාරි, 2016 Retrieved From http://digit.lk/old/pasalatapariganaka_march2009

Satharasinghe.A, (2004). *Highlights Map On Computer Literacy*, 10, September, 2016 Retrieved From http://www.statistics.gov.lk/cls/

# Workplace stress in nursing: a literature review

W.V.P.M.Nayomi[1]

**Abstract**

A world-wide shortage of nurses, a significant challenge facing the healthcare sector in many developed and developing countries. Health development (growth) is an important fact for Sri Lanka as a developing country. It gives free health system to its people around the clock. Nurses play an important role in this field to uplift the health development. Accordingly to Key social indicators Nurses per 10,000 persons 15.4 in Sri Lanka. Similarly statistics at present qualified nurses 32,272 employed in Sri Lanka and a nurse for every 650 persons. The government allocates a large amount of money for health within a one year. The aspiration of these expenditures is well progress of health sector. When nurses are doing their dignity correctly, it is a massive strength to improvement of health sector. The purpose of this study to review the knowledge on workplace stress in nursing. Stress in nurses has been linked to reduce physical and psychological health, reduce job satisfaction, increase sickness absence, increase staff turnover, and poorer job commitment. A literature search from January 2000 to 2014 was conducted using the key words nursing, stress, workplace stress, stress management and review 20 article according to above key words. Poor working relationship between nurses and doctors and other health care professionals, demanding communication and relationships with patients and relatives, emergency cases, high workload, under staffing and lack of support or positive feedback from senior nursing staff have been main source of stress for nurses.

Key word: nursing, stress. Workplace stress, stress management

## Introduction

The “mother” of modern nursing throughout the world, Florence Nightingale. Nursing is more than just a job; it is a professional career requiring commitment. Nursing encompasses autonomous and

[1]Department of Economics, University of Kelaniya wickramasinghe.mahesha@yahoo.com

collaborative care of individuals of all ages, families, group and communities, sick or well and in all settings. Nursing includes the promotion of health, prevention of illness, and the care of ill, disabled and dying people. Advocacy, promotion of a safe environment, research, participation in shaping health policy and in patient and health systems management, and education are also key nursing roles (ICN, 2002).

Every profession has work stresses. In organizational psychology, for example, stress is understood as a long-lasting and harmful emotional and somatic response to stressors when the requirements of work do not accord with employees' capabilities, expectations, and needs (Ahmed,2000). This working stress can be changed according to the job environment. Among the various occupation present in the hospital industry, the researchers interests lies in the nursing profession , simply because medicine/ caring profession such as nursing is ranked as the second most stressful among the various profession (USA job bank,2006). Nursing is working with the risky background. The hospital must foster a caring, sharing and supportive work environment to build and retain a committed, trusting, satisfied, and equally a supportive work force. As well nursing is respectably and a risky one. When the risky is increasing, working stress is increasing. The course of stress for nurses has found to be related to the nature of the profession, Included in these stressors are an intense work hours, weekends, night and holidays (Jayewardene, 2013). Nursing as a first stressful job among 40 stressful professions as many stressful factors were identified in this profession (Mojdeh, et.al, 2008).

**Important of studying workplace stress in nursing**

Mccain & Smith (1994 cited in Moideh et al. 2008), Considered occupational stress as the most important occupational hazard in modern era. Reason being, every year health care system charged zoo billion dollars on it. It results in decreasing productivity, absence of work, staff rotation in wards and a high expense of health care staffs.

Kane (2009) stated that it is important to identity the extent and sources of stress in a healthcare organization to find stress management strategies to help the individual and the environment. Stress in nurses affects their health and increases absenteeism, attrition rate, injury claims, infection rates, and

errors in treating patents. Unless the healthcare setups acknowledge the problem and take preemptive steps to tackle the growing menace of chronic stress, personnel costs will keep rising and add to the already soaring costs of care. Nurses' absenteeism, turnover, and sickness significantly increase the cost of employment in healthcare units.

Kawano (2008) stated that chronic job related stress factors affect physical and mental health, risk of cardiovascular disease, medical costs and work performance. Thus reducing work stress factors is important to prevent the development of stress related diseases and to promote workers health. Nursing being a highly stressful occupation, chronic environmental job related stress factors among nurses are associated with job satisfaction and musculoskeletal disorders, but not with risk indicators for cardiovascular disease, such stress factors are also associated with the mental and physical health of nurses is important for the quality of nursing care.

**Concept of job stress**

Stress can be described as feeling tense, anxious, or worried (Gibson et al, 2009). Whereas Luthans (2008) defined stress as "an adaptive response to an external situation that results in physical, psychological, and/or behavioral deviations for an organizational participant". According to Luthans (2008), stress means the physical, psychological and behavioral deviations in the general behavior of individual in response to any external events or situations. According to Robbins (2003) Stress is dynamic condition in which individual is confronted with an opportunity, constraint, or demand related to what he or she desires and for which the outcomes is perceived to be both uncertain and important.

Job stress is known as work stress or occupational stress. It is defined as the experience of negative emotional situation. Occupational stress is a very subjective concept, affecting every individual differently. In the area of organizational psychology, job dissatisfaction, workload dissatisfaction, work/non work conflict, absenteeism, reduced job performance, reduced life satisfaction and increased turnover intentions (Siu, 2003). Greenberg and baron (2003) identified stress is the pattern of emotional states and physiological reactions occurring in response to demands from

within or outside an organization. There are several factors effect to the nurse's job stress. Some of factors are discussed here.

**Factor responsible for nurse's job stress**

The working environment of the nurses include and enclosed atmosphere, time pressures, excessive noise or undue quiet, sudden swings of them intense to mundane tasks, no second chance, unpleasant sights and sounds, and long standing hours. In spite of the fact that nurses are trained nurses are to deal with these factors like home stress, conflict at work, inadequate staffing, poor teamwork, inadequate training, and poor supervision. Stress is known to cause emotional exhaustion in nurses and lead to negative feeling towards those in their cure (Kane, 2009). From the above research findings, quite evidently the most frequent causes of stress are role conflict and ambiguity, workload, responsibility for the others, poor relationships with others, job conditions, career planning and development. Role ambiguity arises out of being given inadequate information to perform a job properly (Al- omar, 2003).

According to Konstantinos and Christina (2008), research studies carried out on stress in nursing have identified a variety of stressors that depend upon the clinical specialty, although, some common stressors across nursing specialties include poor working relationship between nurses and doctors and other health care professionals, demanding communication and relationships with patients and relatives, emergency cases, high workload, under staffing and lack of support or positive feedback from senior nursing staff.

In her study carried out about stress in different types of psychiatric nurses, Trygstad (1986), as cited in Konstantinos and Christina (2008), found that problems with patients accounted for 13% of overall stressors, relationships between nurses and physicians accounted for only 91% of the stressors (when the former ignored nurse's input and made unilateral decisions), 17% involved the ward sister's poor supervisory attitudes and practices (when there is insufficient positive reinforcement or support for staff, and lack of clinical or administrative expertise) and she concluded that the relationship between staff nurses and their ward sister and their ability to work together was an important determinant of the work stress experienced

by psychiatric nurses, and the most important determinants of stress experienced by these nurses was the difficulties in relationships among staff nurses and their ability to work together. Among other stressors that psychiatric nurses experienced were related with working relationship with co-workers and other unit staff, and the problems arose involving ineffective communication and in- fighting between individuals and group, in the unit.

**Consequences of work stress**

The consequences of these conditions can have a significant impact on individual nurses and the ability to accomplish tasks; specifically, poor decision making, lack of concentration, apathy, decreased motivation, and anxiety may impair job performance, possibly resulting in lethal threats to patient safety. In addition, absenteeism due to stress-related problems requires the administrative use of unplanned and expensive replacement staff from agencies, or mandatory overtime for staff nurses, which further contributes toward an environment of stress and burnout. Interpersonal difficulties commonly stemming from stressful situations may compromise group cohesion, thus impacting the efficient functioning of the complex work units within the health care organization, and ultimately adding work to the already over-burdened middle and senior management teams. The bottom line for nursing administrators is that employee stress and burnout incur significant financial obligations to agencies; specifically, estimates, nationally, based on government, industry, and health groups, place the cost of stress at approximately $250 to $300 billion annually (Jones, Tanigawa, & Weisse, 2003). This includes estimates of the dollar effects of reductions in operating effectiveness, poor decision making, medical expenses, and attrition resulting from stress.

Kamau et al, (2014) stated, Occupational stress is a serious problem affecting nurses, and research shows that this is connected with absence from work and intentions to quit a hospital.  According to Hsien Ho, (2009) research studies carried out on stress in nursing have identified, job rotation among nurses could have an effect on their job satisfaction; job rotation could have an effect on organizational commitment; job satisfaction could have a positive effect on organizational commitment; role stress among

nurses could have a negative effect on their job satisfaction; and role stress could have a negative effect on their organizational commitment. There have several consequences of job stress for their organization, Social and individual.

## Conclusion

Nurses work with physicians and other medical staff in a wide variety of medical and community settings. They provide preventive, primary, acute and chronic care for sick and injured patients with health information, restorative care, medication administration and emergency care. Nurses work different work climate than other profession. Especially, the nurses working at hospitals not only implement independent and professional nursing activities in accordance with doctors' advice, but take responsibility for any immediate threat to patients' lives as well. Thus, the importance of nurses is undeniable, and the influence of nurses' qualities and capabilities on medical care quality can never be ignored. A literature review shows that workload, professional conflict and the emotional burden of caring, pay, and shift work are the major work stressors in the nursing profession. Occupational stress is a serious problem affecting nurses, and literature review shows that this is connected with absence from work and intentions to quit a hospital. Consequently more research into identifying the most effective way of detecting when individuals are experiencing early difficulties, and of improving their stress management techniques so as to prevent the transition to severe stress.

## List of References

Al- Omar, B.A, 2003. *Source of work stress among hospital –s staff at the Savdi MoH, [Online]* vol 17. No 1. PP 3-16, Available at king savd university faculty member’s website http:// faculty.ksu.edu.sa/ al-omar/ documents/ source/ 20 0f 20 work stress.pdf [accessed on 17 June 2011].

Caroline Kamau, Asta Medisauskaite & Barbara Lopes (2015) Inductions Buffer Nurses ‘Job Stress, Health, and Organizational Commitment, *journal of Archives of Environmental & Occupational Health*, 70:6, 305-308, Received 29 October 2013, Accepted 27 January 2014

Gibson, James.L., Ivancevich, john, M .,Donnelly.john H & Konopaske Robrt., (2009), *organizational behavior structure processes*. (13th ed.pp. 183-197). Irwin,McGraw—Hill.

Jayawardana,C.D.C.P., *Factors responsible for work stress among nurse's.* (Master dissertation , University of kelaniya).

Greenberg Jerald & Baron.A. Robert 2006), *Behavior in organization*, ($8^{th}$ Ed.), India, prentice-hall.

Kane, P.P., 2009. Stress causing psychosomatic illness among nurses. *Indian journal of occupational and environmental medicine*, [online] vol 13, no 1, Availble at: Bioline International http;//bioline.org.br/journals. [Accessed 14 August 2011]

Konstantinos,N.,& Christina,O.(2008).”Factors Influencing Stress and Job Satisfaction of Nurses Working in Psychiatric Units, “*Health Science Journal*, VOL.2, Issue 4 (2008).

Luthans, F. (2008). *Organizational behavior*. ($11^{th}$ ed.pp.245-251). New York, McGraw- hill.

Mojdeh, s.et.al, 2008. Relationship of nurse's stress with environmental occupational factors. *Iranian journal of Nursing and midwifery research*, [online] vol 13, No 1, Available at: scientific information database http://www.sid.ir/En/index.asp.[Accessed 12csept 2011].

Robbins, P.92003). *Organizational Behavior*. ($10^{th}$. pp.576-579).India, prentice hall.

Siu, O (2003). Job stress and job performance among employees in Hong Kong: The role of Chinese work values and organizational commitment. *International Journal of Psychology*, 38, 337-247.

Wen-Hsien Ho, Ching Sheng Chang, Ying-Ling Shih and Rong Da Liang, Published: 12 January 2009, *BMC Health Services Research* 2009, 9:8.

# විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන සාර්ථකත්වය කෙරෙහි සේවානියුක්තියේ බලපෑම (කැලණිය විශ්ව විද්‍යාලය ඇසුරින්)

ඩී. එම්. එච්. දසනායක[1]

**සංක්ෂේපය**

රජය විසින් අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වෙන් කරනු ලබන අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ද සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා රජය විසින් මහපොළ, ශිෂ්‍යාධාර වැනි මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. එවැනි මුදල් ප්‍රතිපාදන විද්‍යාර්ථයින් සඳහා වෙන් කළද ඔවුන්ගේ වියදම් අංශය ක්‍රමයෙන් ඉහළ යයි. ඒ අනුව විද්‍යාර්ථයින් තම අධ්‍යයන අවශ්‍යතා වෙනුවෙන් මුදල් උපයා ගැනීම සඳහා විවිධ රැකියාවන්හි නියුක්ත වනු ලැබේ. මෙසේ රැකියාවන්හි නියුක්ත වීම තුළින් අධ්‍යයන සාර්ථකත්වය සඳහා කෙබඳු බලපෑමක් ඇති කරන්නේද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත. විද්‍යාර්ථයින්, අධ්‍යයන සාර්ථකත්වය, ශ්‍රේණි ලකුණු සාමාන්‍යය, සේවා නියුක්තිය යන මුඛ්‍ය පද භාවිත කරමින් මීට පෙර කරන ලද අධ්‍යයනයන් සොයා ගන්නා ලදී. එම අධ්‍යයනයන් ඇසුරු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදුකොට ඇති අතර ඒ සඳහා අධ්‍යයනයන් පහක් පමණ යොදාගෙන ඇත. මෙහිදී ද්විතීක දත්තයන් පමණක් උපයෝගී කර ගනිමින් මෙම අධ්‍යයනය සිදුකොට ඇත. මෙහිදී සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය මිනිය හැකි සුදුසුතම මිනුම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය(ශ්‍රේ) වන බැවින් ඒ පිළිබඳව මෙම අධ්‍යයනයන් වලදී අවධානය යොමු කරන ලදී. මෙම අධ්‍යයනය මඟින් හෙළි වූයේ සතියකට වැඩි පැය ගණනක් අධ්‍යාපන කටයුතුවල නිරත වන සිසුන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ඉහළ අගයක් ගන්නා බවත් සේවා වියුක්ත විද්‍යාර්ථයින්ට වඩා සේවානියුක්ත විද්‍යාර්ථයින්ගෙන් 75 පමණ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ඉහළ අගයක් ගන්නා බවත් අනාවරණය විය.

මුඛ්‍ය පද- විද්‍යාර්ථයින්, අධ්‍යයන සාර්ථකත්වය, ශ්‍රේණි ලකුණු සාමාන්‍යය, සේවා නියුක්තිය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. harshanidasanayake1991@gmail.com

## හැඳින්වීම

රටක සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කරන විට එම සංවර්ධනය සඳහා වැදගත් සාධක බවට පත් වන්නේ ඒක පුද්ගල ආදායම, දළ ජාතික නිෂ්පාදිතය, ආදායම් ව්‍යාප්තිය හා උද්ධමනය යන කරුණුය. නමුත් හුදෙක් ආර්ථික සාධක වර්ධනය කිරීම තුළින් පමණක් චිරස්ථායි සමාජ ආර්ථික සංවර්ධනයක් කරා ළඟා කරගත නොහැකිය(ආර්ථික විමසුම,1997). ඒ අනුව ආර්ථික හා සමාජ සංවර්ධනය ඉහළ නැංවීමෙහිලා බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ අධ්‍යාපනයයි. රටක අධ්‍යාපන අංශය යනු දැනුම පදනම් කරගත් ආර්ථිකයක තිරසාර ඉහළ වර්ධන වේගයක් පවත්වා ගැනීමට අවශ්‍ය දැනුම ඇති හා ශ්‍රම වෙළඳපොළෙහි ගතික අවශ්‍යතා සමග ගැටිය හැකි හැකියාව ඇති ඵලදායි මානව ප්‍රාග්ධන පදනමක් සකස් කිරීමේ පදනමයි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011).

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳව විමසා බැලීමේදී ගම්‍ය වන කරුණක් වන්නේ එය විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඉලක්ක කර ගනිමින් නිර්මාණය කර ඇති බවයි. වර්තමානය වන විට බොහෝ පාසල් අධ්‍යාපනය ලබන සිසුන්ගේ මූලික අභිලාශය වී තිබෙන්නේ කෙසේ හෝ විශ්වවිද්‍යාලයකට ප්‍රවිශ්ට වීමටය. නමුත් මේ සුවිශේෂී අවස්ථාව හිමි වන්නේ සිසුන් අතලොස්සකට පමණි. ඒ අනුව සෑම වසරක ම පවත්වන ලද අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා විශාල සිසුන් පිරිසක් පෙනී සිටින අතර ඉන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන්නේ ඉතා සුළු පිරිසකි. ඒ අනුව 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා පැවැත්වූ උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කෙරුණේ 17%ක් එනම් සිසුන් 25,624ක් පමණි (ශ්‍රී ලංකා මහ බැංකුව,2015). මේ අනුව ලාංකික විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් වාර්ෂිකව ඇතුළත් වේ.

රජය විසින් ලාංකීය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා විශාල මුදලක් වැය කරන අතර එය රටේ දළ ජාතික නිෂ්පාදනයෙන් 1.9% කි (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව,2014). එයින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ද විශාල මුදලක් වෙන් කරනු ලබයි. මෙසේ රජය විසින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කළද විද්‍යාර්ථයින්ගේ වියදම් ක්‍රමයෙන් ඉහළ යන ස්වභාවයක් දැකිය හැකිය. ඒ අනුව විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා මහපොළ, ශිෂ්‍යාධාර වැනි ශිෂ්‍යත්ව ලබා දුන්නද ඔවුන්ගේ වියදම් ප්‍රමාණය ඉහළ යන බැවින් පූර්ණකාලීන හෝ අර්ධ කාලීන රැකියා කිරීමට පෙළඹේ. මෙසේ රැකියා කිරීම තුළින් ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා කෙබඳු බලපෑමක් සිදු කරන්නේද යන්න විමසා බැලීම කාලීන අවශ්‍යතාවයකි.

## අධ්‍යාපනය සංකල්පය අර්ථ දැක්වීම

අධ්‍යාපනය යනු වියුක්ත සංකල්පයකි. එහෙයින් අධ්‍යාපනය යනු කුමක් දැයි අර්ථ විවරණය කිරීම සඳහා විශ්ව සාධාරණ නිගමනයක් දැක්විය නොහැකි වුවද අධ්‍යාපනය යන්නෙන් මූලික වශයෙන් ප්‍රකාශ වන්නේ කුමක්ද යන්න පිළිබඳව

සිතා ගැනීම අපහසු නොවේ. ණිදැනීම, අවබෝධය නොහොත් අවබෝධය පාදක වූ දැනීම ආත්මීකරණය කිරීම අධ්‍යාපනය විසින් විවරණය කරන ප්‍රධානතම අර්ථයයි (වීරසිංහ 1983). zEducareZ යන ලතින් වචනයෙන් බිඳී ආ මෙම 'Education' යන්නෙහි නිරුක්ති අර්ථය ඉවතට ගෙනයාම නැතහොත් පිටතට මතුකර දීමයි.

මානව පරිණාමයේ මූලාරම්භය දක්වා විහිදෙන ඉතිහාසය තුළ යුග ගණනාවක් තිස්සේ මිනිසා ඉදිරියට කැදවාගෙන පැමිණි සාධකය වූයේ අධ්‍යාපනයයි .එහෙයින් මානව වර්ගයාගේ සෑම ක්‍රියාවක් මෙන්ම සෑම හැසිරීමක්ම තීරණය කරන සාධකය වන්නේ අධ්‍යාපනයයි. එබැවින් මානව වර්ගයාගේ පැවැත්ම තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ අධ්‍යාපනයයි.

උපතේ සිට මරණය තෙක්ම සමාජය ආශ්‍රයෙන් ජීවත් වීමටත් ඊට හැඩ ගැසීමටත් සිදුවේ. එම හැඩගැසීම අධ්‍යාපනය වශයෙන් සැලකිය හැක. අධ්‍යාපනය යනු කෙනෙකු මව් කුසේ සිට මරණය දක්වා ලබන අත්දැකීම් රාශියයි. උත්සාහයෙන් මෙන්ම උත්සහයක් නැතිවත් සවිඥනිකව මෙන්ම අවිඥනිකව ජීවිතයේ සෑම අවස්ථාවකමත් පුද්ගලයෙක් ජීවිතය මුළුල්ලේම අධ්‍යාපනය ලබයි(ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය, 2007). මිනිසා යනු අධ්‍යාපනයකින් තොරව කිසිවක් ඉටුකරගත නොහැකි සත්වයෙකි. කාරියවසම් ප්‍රකාශ කරන පරිදි නවීන අධ්‍යාපනයේ පුරෝගාමියා ලෙස සැලකෙන ආමෝස් කොමේනියස් ගුණවත් නැණවත් මිනිසා රටක ධන නිධානය බවත් එමගින් අධ්‍යාපනය සමාජීය හා සම්බන්ධ වීමේදී පැවතිය යුතු ගුණාත්මකභාවය අවධාරණය කරයි (2010).

ඉහත නිර්වචන සියල්ල විමසා බලනවිට අධ්‍යාපනය යනු නිශ්චිත වශයෙන් ම මග පෙන්වමින් හා පුහුණුවක් ලබාදෙන මාධ්‍යයක් වශයෙන් ඉස්මතු වේ. මේ අනුව අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්නට සරල පිළිතුරක් දීම අසීරු බව පෙනේ.එයට හේතුව අධ්‍යාපනය යන්න පටු ක්ෂේත්‍රයක් නිරූපණය කිරීමයි.

**අධ්‍යයන සාර්ථකත්වය සඳහා බලපාන සාධක**

අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි බලපාන එක් සාධකයක් පමණක් නොව සාධක රාශියක් බලපාන බව මෙතෙක් සිදුකළ පර්යේෂණවලින් අනාවරණය කරගෙන ඇත. ඒ අනුව විවිධ පර්යේෂණවලින් අනාවරණය කරගෙන තිබෙන අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සාධක කිහිපයක් පහත ආකාරයට අවබෝධ කරගත හැක.

**පවුලේ ආදායම**

පවුලේ පවතින ආර්ථික ශක්‍යතාවය සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය කෙරෙහි බෙහෙවින් බලපායි. සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වැය කරන මුදල් ප්‍රමාණය තීරණය වන්නේ පවුලේ පවතින ආදායම අනුවය. පවුලේ පවතින ආදායම් මට්ටම ඉහළ අගයක් ගනී නම් සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වැය කරන මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින අතර එම සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ද උසස් තතත්වයක් පෙන්නුම් කරයි. මෙලෙස පවුලේ ආර්ථික තත්ත්වයන් හිතකර අන්දමින් පැවතීම නිසා කායික මානසික සුවයෙන් මෙන්ම චිත්ත ධෛර්යයෙන් ද පූර්ණ වූ පරිසරයක් ලෙස ක්‍රියා කිරීමට හැකි වේ. එම වාතාවරණය තුළ වැඩුණු සිසුන්ගේ අධ්‍යයන සාධන මට්ටම ද උසස් තත්ත්වයකට පත්ව තිබිණි. මෙලෙස පවුලේ ආර්ථික තත්ත්වය හිතකර අන්දමින් පැවතීම සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය සඳහා බලපාන බව ටැන්ස්ලි හා ගිල්ෂර්ඩ්ගේ මතයයි( ආරියරත්න, 1986)

**පවුලේ සාමාජික සංඛ්‍යාව**

සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය සඳහා පවුලේ සාමාජික සංඛ්‍යාව බලපාන බව විවිධ පර්යේෂණ තුළින් හෙළි වී ඇත. පවුලේ සාමාජික සංඛ්‍යාව සහ අධ්‍යයන සාර්ථකත්වය අතර සෘණ සහසම්බන්ධයක් පවතින බව Teale විසින් 1986 කරන ලද පර්යේෂණයකින් හෙළි වී ඇත. පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි වන විට දරුවන්ගේ අධ්‍යයන සාර්ථකත්වය අඩු වන බව පවසයි. පවුලේ දරුවන් සංඛ්‍යාව වැඩි වන විටඑක් දරුවෙකු වෙනුවෙන් අධ්‍යාපනය සඳහා වැය කරන මුදල් ප්‍රමාණය අඩු අගයක් ගැනීම සහ දරුවන් වෙනුවෙන් යොමු කරන අවධානය අඩු වේ(රත්නාවතී,2003). විශේෂයෙන්ම කම්කරු පන්තියේ දරුවන් වැඩියෙන් සිටීම අධ්‍යාපනික වශයෙන් අවාසිදායක බව ඩග්ලස්ගේ පර්යේෂණවලින් හෙළි වී ඇත. එම පවුල්වල සාමාජික සංඛ්‍යාව වැඩිවීම අධ්‍යාපනික සාධනයේ පසුබෑසීමක් පෙන්නුම් කරන අතර අවශ්‍ය ප්‍රමාණයට සැලකිලි දැක්වීමද අඩුවේ(ආරියරත්න, 1986).

**දෙමාපියන්ගේ සේවා නියුක්තිය**

පියා සහ මව රැකියාවන්හි නියුක්ත වීමත් එය කවරාකාරයකින් සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය කෙරෙහි බලපාන්නේ දැයි යන්නත් සොයා බැලීම සඳහා විවිධ පර්යේෂණ සිදුකොට ඇත. කාර්යාලීය රැකියා සහ කාර්යාලීය නොවන රැකියා ලෙස පියාගේ රැකියා මට්ටම පදනම් කොටගෙන මෙම පර්යේෂණ සිදුවිය. මෙම තත්ත්වය ප්‍රාථමික පාඨමාලා අවධියේදී 16:10 අනුපාතයෙන් සිදු වුවද උසස් අධ්‍යාපනය කරා ශිෂ්‍යයා යොමු වන සෑම විටම මෙම තත්ත්වය වෙනස් වේ. 12 වන ශ්‍රේණි මට්ටමේදී සහ විශ්වවිද්‍යාල මට්ටමේදී 620:10 විය. මේ පිළිබඳව කරුණු දක්වන මිලර් කාර්යාලීය රැකියාවල නියුතු දෙමව්පියන්ගේ

දරුවන් සාධන පරීක්‍ෂණවලදී විශේෂ දස්කම් පෙන්වන අතර අන්අය අඩු සාධනයක් පෙන්වීමටත් දෙමව්පියන්ගේ රැකියා බලපෑමක් කරන බව පෙන්වා දෙයි(ආරියරත්න, 1986).

**අධ්‍යයන කටයුතු සඳහා වැය කරන කාලය**

විශ්වවිද්‍යාලය තුළදී දේශනවලදී ලබන අධ්‍යාපනයට අමතරව දේශනවලින් පරිබාහිරව සිදුකරන අධ්‍යාපනික කටයුතුද සිසුන්ගේ අධ්‍යාපනික සාර්ථකත්වය සඳහා වැදගත් වේ. එසේම දිනපතා දේශනවලට සහභාගිවීමද අධ්‍යාපන කටයුතු නිදහස් මානසිකත්වයෙන් සිදුකර ගැනීම සඳහා ඊට සුදුසු ස්ථානයක් තිබීමද වැදගත් වේ.

**සේවා නියුක්තිය මගින් අධ්‍යාපනික සාර්ථකත්වය සඳහා වන බලපෑම**

අධ්‍යයන කටයුතු කරන අතරතුර රැකියාවන්හි නියුක්ත වීම තුළින් අධ්‍යාපනික කටයුතු සඳහා යම් බලපෑමක් සිදු වේ. රැකියාවන්හි නිරත වීම තුළින් දිනපතා දේශන සඳහා සහභාගිවීමට නොහැකි වන අතරම එමගින් අධ්‍යාපනික කටයුතු සඳහා බලපෑමක් ඇති වේ. එමෙන්ම අධ්‍යාපනික කටයුතු සඳහා වැය කරන කාලයද ඉතා සීමා සහිත වේ. එනිසා විද්‍යාර්ථයින්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය සඳහා බලපෑමක් ඇති වේ.

වර්තමානය වනවිට බොහෝ විද්‍යාර්ථයින් තම අධ්‍යයන කටයුතු කරන අතරතුර විවිධ වූ රැකියාවන්හි නිරත වන බව විවිධ වූ පර්යේෂණයන්ගෙන් හෙළි වී ඇත. ඒ අනුව ඔවුන් ඉතා සීමිත කාලයක් තම අධ්‍යයන කටයුතුවල නිරත වන බවත් වැඩි කාල පරිච්ජේදයක් රැකියාවන්හි නිරත වීම සඳහා යොදා ගන්නා අතර සමහර විද්‍යාර්ථයින් මුළු කාලයම රැකියාවන්හි නිරත වේ(Smart, Kelley,Conant,1999). මෙම අධ්‍යයනයේදී ඔවුන් අධ්‍යයන කටයුතු සඳහා කාලය ගත කිරීමත් අධ්‍යයන සාර්ථකත්වයට එයින් ඇතිවන බලපෑමත් අධ්‍යයනය කරනු ලබයි.

බොහෝ පර්යේෂණවලින් හෙළි වී ඇත්තේ සේවා නියුක්ත වීම මගින් විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කුසලතාව කෙරෙහි සෘණාත්මක ලෙස බලපාන බවයි. ඒ සඳහා බලපාන ප්‍රධාන සාධකය වන්නේ සේවා නියුක්ත වන කාලසීමාවයි. එනම් සේවයේ නියුක්ත වන කාලසීමාව වැඩි වනවිට විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කුසලතාව කෙරෙහි ඇති කරන බලපෑමද ඉහළ යයි. එමෙන්ම සේවයේ නියුක්ත වන කාලසීමාව අඩු වනවිට විද්‍යාර්ථයින් විශිෂ්ට සාමාර්ථ(''A'') ලබා ගැනීමේ භව්‍යතාවයද ඉහළ යයි( Watanabe & Jasinski, 2005) Furr සහ Elling ට (2000) අනුව සිසුන්ගෙන් 29% සතියකට පැය 30-39 අතර ප්‍රමාණයක් වැඩ කරන අතර 39 පූර්ණ කාලීන රැකියාවන්හි නිරත වන බවත් මේ නිසා ඔවුන්ගේ අධ්‍යාපනික වෘද්ධිය කෙරෙහි අහිතකර සහ ප්‍රබල අයුරින් බලපානු ලබයි. පහළ පන්තිවල

සිසුන්ට සාපේක්ෂව ඉහළ පන්තිවල සිසුන් වැඩි කාලසීමාවක් සේවයේ නියුක්ත වන බවත් ඒ අනුව ඉහළ පන්තිවල සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන බවත් පෙන්වා දෙයි( (Hongyu Wang, 2010) Furr & Elling, 2000). පූර්ණකාලීන ලෙස සේවයේ නියුක්ත වීම තුළින් ප්‍රබල ලෙස අධ්‍යයන සාර්ථකත්වය කෙරෙහි බලපාන බවත් ඔවුන් පැය 40ක් හෝ ඊට වැඩි කාලසීමාවක් සේවයේ නියුක්ත වන අතර එමගින් ඔවුන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය(GPA) සඳහා සෘණාත්මක අයුරින් බලපාන බවත් එය උපාධිය සාර්ථකව නිම කිරීම සඳහාද ප්‍රබල බලපෑමක් එල්ල කරනු ලැබේ(Astin,1993).

**සාරාංශය**

මෙම තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ අධ්‍යාපන සාර්ථකත්වය සදහා විද්‍යාර්ථයින් සේවා නියුක්ත වීම බලපාන බවයි . විද්‍යාර්ථයින් රැකියා කිරීම සදහා පවුලේ අදායම් තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපාන බවත් රැකියා කිරීම සඳහා උපාධිධාරී රැකියා වියුක්තිය බලපාන බවත් අනාවරණය විය,

**ආශ්‍රිත ග්‍රන්ථ**


ආරියරත්න කේ.ඒ.වී. (1986). අධ්‍යාපනික සාධනයෙහිලා සිසුන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්. *අප්‍රකාශිත මුද්‍රණය.* කොළඹ විශ්වවිද්‍යාලය.

රත්නාවතී, ඩබ්. ඩී. (2003). කුටුම්භ ආදායම දරුවන්ගේ අධ්‍යාපන වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම. *අප්‍රකාශිත මුද්‍රණය.* කැලණිය විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා මහ බැංකුව(2011). *වාර්ෂික වාර්තාව.* කොළඹ ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව(2015). *වාර්ෂික වාර්තාව.* කොළඹ ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය, 2007

Wang,H., Kong,M., Shan,W, & Sou Kuan Vong. (2010). The effects of doing part-time jobs on college student academic performance and social life in a Chinese society. *Journal Of Education And Wok.*

Watanabe, L. E. (2006). The Effects of College Student Employment on Academic Achievement. *The University Of Central FLORIDA Undergraduate Research Journal*

# ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජීය , ආර්ථික සාධකඃ ආනුභාවික අධ්‍යයනයක් ඇසුරින්

එම්.පී.ඒ.ඩබ්ලිව්.පතිරාජ[1]

**සංක්ෂේපය**

නිදන්ගත වකුගඩු රෝගය ලෝක ව්‍යාප්ත ප්‍රධාන සෞඛ්‍යය ගැටළුවක්ව පවතියි. මෙම රෝගයට නිශ්චිත හේතුවක් සොයා ගැනීමට නොහැකි වූ හෙයින් නොදන්නා හේතුවක් නිසා හටගත් නිදන්ගත වකුගඩු රෝගය ලෙස හඳුන්වනු ලැබේ. ක්‍රමක්‍රමයෙන් වකුගඩුවල ක්‍රියාකාරීත්වය පිරිහෙන අතර කාලයත් සමග මෙම අත්දැකීම රෝගියාට පමණක් නොව පවුල්වල සාමාජිකයන්ට ද විශාල වශයෙන් බලපෑමක් සිදු කිරීමට සමත් වී ඇත. මෙම රෝගයට ප්‍රතිකාර ලෙස වකුගඩු බද්ධ කිරීම හා රුධිර කාන්දුකරණය සිදුකරන අතර මේ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවී ඇත. නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පසුගිය දශක කිහිපය තුළ පවතින ප්‍රධාන සෞඛ්‍යය ගැටළුවක් බවට පත්ව ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වන්නේ, නිදන්ගත වකුගඩු රෝගය උතුරු මැද පළාතේ ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජීය ආර්ථික සාධක මොනවාද යන්න හඳුනා ගැනීමය.

අධ්‍යයනයේ අරමුණ වන්නේ, වකුගඩු රොගයේ ව්‍යාප්තිය සඳහා බලපාන ප්‍රධාන සාධක රාශියක් පවතින බව පෙන්වා දීමය. මෙහිදී අධ්‍යයනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පර්යේෂකයා විසින් යෝග්‍යය පර්යේෂණ ක්‍රමවේදයන් අනුගමනය කල හැක. මෙහිදී සරළ සසම්භාවීව තෝරා ගන්නා ලද රෝගීන් ඇසුරින් පර්යේෂණය බොහොමයක් සිදු කර ඇත. මෙහිදී හරස්කඩ දත්ත අධ්‍යයනය සඳහා යොදා ගත් අවස්ථා දක්නට ලැබේ. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් වන ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය අනුගමනය කරමින් දත්ත රැස් කිරීමද, SPSS මෘදුකාංගය මඟින් දත්ත විශ්ලේෂණය කිරීමද, ඒ සඳහා බහුගුණ ප්‍රවර්ධන ප්‍රතිපායන (Multivariate logistic regression) ක්‍රමවේදයන් භාවිතා කිරීම බොහොමයක් පර්යේෂණය වල දක්නට ලැබුනි.

දියුණු රටවල නිදන්ගත වකුගඩු රෝගය සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස ස්ථුලතාවය , අධික රුධිර පීඩනය, දියවැඩියාව වැනි සාධක හඳුනාගෙන ඇති අතර ලංකාවේ මෙම රෝගය ව්‍යාප්තියට බලපාන සාධක වෙනත් මුහුණුවරක් ගනු ලබයි. මන්දයත්, ලංකාව තුළ කෘෂිකාර්මික ආර්ථික රටාවක් පවතින බැවින්, කෘෂිකාර්මික ක්‍රියාකලාපයන්ගේ ප්‍රතිඵලයක් ලෙස රෝගයේ ව්‍යාප්තිය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. ayeshani128@gmail.com

සිදුවී ඇති බව පර්යේෂකයාගේ අදහසයි. බොහොමයක් පර්යේෂණ වලින් මෙම රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සාධක හඳුනාගෙන ඇත. ඒ තුළින් අනාවරණය වන්නේ, කෘමිනාශක භාවිතය, ෆ්ලෝරයිඩ් අඩංගු ජලය පානය කිරීම, බැරලෝහ ශරීරගත වීම, පොහොර භාවිතය, ආසනික්, විජලනය, මධ්‍යයසාර භාවිතය, දුම් පානය කිරීම වැනි සාධක රෝගයේ ව්‍යාප්තියට බලපාන ප්‍රබල සාධක වශයෙන් හඳුනාගෙන ඇත. මෙහි අවසාන ප්‍රතිඵලය ලෙස ස්ත්‍රී පුරුෂ බව, සමාජීය සාධක, ආර්ථික සාධක, ආහාර රටා, ජීවන රටා, ජල මූලාශ්‍ර යන කරුණු මෙම රෝගයට හේතු සාධක වන බව පෙන්වා දිය හැකිය.

**හැඳින්වීම**

**නිදන්ගත වකුගඩු රෝගය (Chronic Kidney Disease) යන්න,**

නිදන්ගත වකුගඩු රෝගය ලෝකය පුරා ව්‍යාප්ත ප්‍රධාන සෞඛ්‍ය ගැටලුවක්ව පවතී. (Wanigasooriya et.al, 2012) ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු විවිධ පර්යේෂණ කණ්ඩායම් විසින් මෙම රෝගයට නිශ්චිත හේතුවක් සෙවීම සඳහා ගත් උත්සහයන්ගෙන් පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොවූ බැවින් මෙයට නොදන්නා හේතුවකින් හටගන්නා "හඳුනා නොගත් වකුගඩු රෝගය" Chronic Kidney Disease (CKD) ලෙස නම් කර ඇත. ( World Health Organization & Ministry of Healthcare and Nutrition,Epidemiology Unit,Sri Lanka et.al , 2009)

නිදන්ගත වකුගඩු රෝගය තුළින් වකුගඩු හානියට පත්කරමින් මිනිස් ශරීරයද අකර්මන්‍යතාවයට පත් කරයි. එමෙන්ම වකුගඩු රෝගය උත්සන්න වීමෙන් රුධිරය දැඩි ලෙස අපවිත්‍ර කරමින් මිනිස් සිරුර රෝගී තත්ත්වයට පත්කරයි. (National Kidney Foundation et . al, 2016) නිදන්ගත වකුගඩු රෝගය ලොව ව්‍යාප්ත වීමට බලපාන ප්‍රධාන සාධක ලෙස හඳුනාගෙන ඇත්තේ දියවැඩියාව සහ අධික රුධිර පීඩනය යන රෝගී තත්ත්වයන්ය. (Vela et . al, 2012) නමුත් කෘෂිකාර්මි ආර්ථිකයක් ඇති ලාංකේය සමාජය තුළ මෙම රෝගය ව්‍යාප්ත වන්නේ වෙනත් මුහුණුවරකිනි. (Yolanthika et . al, 2016)

වකුගඩු රෝගය ශාරීරික රෝගයක් ලෙස හඳුනාගත්තද නිශ්චිත ප්‍රතිකාර ක්‍රමයක් අද වන තුරුම සොයා ගෙන නැත. (World Health Organization et.al, 2009) නමුත් නිදන්ගත වකුගඩු රෝගය වලක්වා ගතහැකි ප්‍රතිකර්ම ලෙස වර්තමානයේ රුධිර කාන්දුකරණය (Hemodialysis) හා වකුගඩු බද්ද කිරීම යන ප්‍රතිකාර ක්‍රමයන් සිදු කරයි. (HSU et. al, 2007) වකුගඩු රෝගය පැවැතීම තුලින් ක්‍රමක්‍රමයෙන් ශරීරයේ පැවැත්ම තීරණය කරන්නාවූ වැදගත් අවයවයක් සේ සැලකෙන වකුගඩු අකර්මන්‍යතාවයට පත්කරමින් ශරීරයේ සමතුලිතතාවයන්ට හානි පමුණවයි. (National Kidney Foundation et .al, 2016)

**නිදන්ගත වකුගඩු රෝගය (CKD) ලෝකයේ සහ ලංකාවේ ව්‍යාප්තිය**

නිදන්ගත වකුගඩු රෝගය ලෝක ජනගහනයෙන් 10% ට බලපෑම් කිරීමට මෙන්ම අවුරුද්දකට ලෝක ජනගහනයෙන් මිලියනයකටත් වඩා වැඩි මරණ සංඛ්‍යාවක් වාර්තා කරන්නට සමත්කම් දැක්වූ ප්‍රබලම සෞඛ්‍ය ගැටලුව ලෙස පෙන්වාදිය හැකිය. (Torreset et . al, 2010)

ලෝක ජනගහනයෙන් 50% ට වැඩි ප්‍රමාණයක් සංවර්ධිත රටවලින් වාර්තා වන අතර වර්තමානය වන විට මේ හේතුව නිසාවෙන් ධනවත් රටවල් මෙම රෝගය සඳහා විශාල වියදමක් දරන්නට සිදුවීම විශාල ගැටලුවක්ව පවතී. (World Health Organization et. al, 2009) සංවර්ධිත රටවල් අතර ප්‍රබලයා බවට පත්ව සිටින ඇමරිකාව මිලියන 48 ක් ඉක්මවා යන මූල්‍යම වියදමක් වකුගඩු රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා වෙන්කරයි. එමෙන්ම චීනය, ඔස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රටවල්ද මෙම රෝගය නිසා පීඩා විඳින ප්‍රබල පංතියේ රටවල් ලෙස පෙන්වාදිය හැකිය. (Nobel et.al, 2014) වකුගඩු රෝගයේ ව්‍යාප්තිය සඳහා බලපාන සාම්ප්‍රධායික සාධක ලෙස දියවැඩියාව සහ අධික ආතතියද, කෘෂිකර්මාන්තයේ නියලෙන ගොවියාට මෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන භාවිතා කරන සාමාන්‍ය ජනයාටද කෘමිනාශක භාවිතය, රසායනික පොහොර භාවිතය වැනි හේතූන්ද හඳුනාගත හැකිය. (Vela, henriquenz, Celo et. Al, 2012) තරබාරු බව ෆෝරලොරයිඩ්, ආසනික් වැනි බැර ලෝහ ශරීරගත වීම, දුම්පානය, මධ්‍යසාර භාවිය යනාදී සාධකද වකුගඩු රෝගය ව්‍යාප්තවීමට බලපාන සාධක ලෙස ලෝකය හමුවේ අනාවරණය වී ඇත. (Subasingha et. al, 2014)

සංවර්ධිත රටවල් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවලද වකුගඩු රෝගයට ප්‍රතිකාර ලෙස වකුගඩු බද්ධ කිරීම හා රුධිර කාන්දුකරණය (Hemodialysis) ප්‍රතිකාර ක්‍රමයන් සිදුකරයි. ඒ සඳහා අති විශාල මූල්‍ය වියදමක් දරන්නට සිදුවේ. සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම වියදම දැරීමට නොහැකි වීමෙන් වර්ෂයකට මිලියනයකට වැඩි ප්‍රමාණයක් වකුගඩු රෝගයෙන් මියයන බවද වාර්තා වේ. (Dor et.al,2007) දළ වශයෙන් ලෝකයේ වකුගඩු රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා වියදම බිලියන 70 – 75 අතර ප්‍රමාණයකි. (Joneset.al,2005) (Muntneret.al,2005)

නිදන්ගත වකුගඩු රෝගය ලෝකයේ මෙන්ම ලංකාවේද සමාජයීය, ආර්ථික මෙන්ම පාරිසරික වශයෙන්ද සම්බන්ධිත අතිවිශාල මානවවාදී ඛේදවාචකයක් බවට පත්වී ඇත. වකුගඩු රෝගය පළමු අනාවරණය වශයෙන් 1990 වර්ෂයට පෙර වියළි කලාපයේ උතුරුමැද පළාතේ කෘෂිකාර්මික දිස්ත්‍රික්ක වන අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලද ඒ අවට ප්‍රදේශයේද මෙම රෝගය පවතින බවයි. නමුත් වර්තමානයේ අසල්වැසි දිස්ත්‍රික්ක වලටද වයඹ, ඌව මෙන්ම

මධ්‍යම, උතුරු යන පළාත්වලටද මෙම රෝගය පැතිරෙමින් පවතී. ආසන්න වශයෙන් මෙම රෝගය පැතිර තිබෙන ප්‍රදේශ 17000 km පමණ වන අතර එහි ජනගහනය මිලියන 2.5 වේ. ( Chandrajith et. al, 2011)

වකුගඩු රෝගය විශාල ලෙස ව්‍යාප්ත වූයේ කෘෂිකර්මාන්තයේ නිරතවන වයස අවු : 40 - 60 අතර පිරිමි ගොවීන් හට වුවද පසුව කාන්තාවන්ට මෙන්ම දරුවන් අතරද මෙම රෝගය ව්‍යාප්ත වීම සිදුවිය. (Centre for Science and environment et. al, 2012) (Wanigasooriya et . al, 2012) ශ්‍රී ලංකාවේ වෛද්‍යවරු කණ්ඩායමකගේ ඇස්තමේන්තුගත කිරීම අනුව උතුරුමැද පළාතේ පමණක් ලක්ෂ 04ට අධික මිනිසුන් ප්‍රමාණයකට වකුගඩු රෝගයෙන් බලපෑම් සිදුවී ඇත. (Perera et. al, 2012) ප්‍රමාණාත්මකව ලබාගත් තොරතුරු මත 17000 km පදිංචිව සිටින මිලියන 2.5 ක ජනගහනයෙන් 95% ට වඩා වැඩි පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන්නන් බවත් ඔවුන් අතරින් සැලකිය යුතු පිරිසක් වකුගඩු රෝගීන් වුවද මෙම රෝගය වසංගතයක් ලෙස ගෙයින් ගෙට පැතිරයාමක් සිදුව නොමැත. (Chandrajith et. al, 2011) පසුගිය දශක දෙකකදී 22,000 ට ආසන්න මිනිසුන් සංඛ්‍යාවක් වකුගඩු රෝගය හේතුවෙන් මියගොස් ඇති අතර, උතුරුමැද පළාතේ මිනිසුන් 100 අතරින් මිනිසුන් 5, 6 දෙනෙකුට හෝ වකුගඩු රෝගය බලපෑම්කර ඇත. (Gunawardhana et.al, 2012)

වකුගඩු රෝගය වැළදීමට ප්‍රධානතම හේතුව වනුයේ පානීය ජලය හා කෘමිනාශක භාවිතයේදී බැර ලෝහ කැටායන ශරීරගත වීමයි. (Silva et. al, 2013) සමහර පර්යේෂකයන්ගේ නිගමන අනුව රජරට ප්‍රද්ශයේ "පානීය ජලයේ අතිවිශිෂ්ට ජල රසායන" වකුගඩු රෝගයට ප්‍රධාන හේතුව වී ඇති බවයි.(Chandrajith et.al,2011) විද්‍යාත්මක මතය වන්නේ ශ්‍රී ලංකාවේද මාරාන්තික වකුගඩු රෝගය සඳහා දියවැඩියාව, අධික ආතතිය, ස්ථූල බව මෙන්ම සර්ප විෂ ශරීරගත වීමද බලපාන බවයි. (World Health Organization et. al, 2009) එමෙන්ම විජලනය, මත්පැන් පානය, දුම්වැටි භාවිතය මෙම රෝගයට හේතුවන අනෙකුත් සාධක වේ. (Wanigasooriya et.al, 2012)

ලෝකයේ අනෙකුත් රටවල් මෙන්ම ලංකාවේද වකුගඩු රෝගීන් උදෙසා පායන පැවැත්වීම මඟින් රෝගය හඳුනාගනිමින් වකුගඩු බද්ධ කිරීම හා කාන්දු පෙරීම (dialysis) ප්‍රතිකාර ක්‍රමයන් මඟින් රෝගීන්ට ප්‍රතිකාර කිරීම සිදුකරයි. (Chandrajith et. al, 2011)දිලිඳු ගොවිතැනෙහි මූලික අවශ්‍යතාවන වෛද්‍ය සහභාගීත්වය, සීමා සහිත වූ කෘමිනාශක හා වල් නාශක භාවිතය, සෞඛ්‍ය ආරක්ෂිත ආහාර ක්‍රම, සුරක්ෂිත ජල පරිහරණය මෙන්ම ගලා නොයන ජලය භාවිතයේදී සැලකිලිමත් වීම ආදී මූලික මිනිස් අවශ්‍යතා සපුරාලීම තුළින් වකුගඩු රෝගය ව්‍යාප්තිය පාලනය කරගත හැකිය. (Meister et. al, 2011)

**නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්තියට බලපාන සාධක හා එහි බලපෑම**

**ව්‍යාප්තියට බලපාන සාධක**

කෘෂි රසායනික භාවිතය නිසා අධිසාන්ද්‍රණයෙන් එක්ව ඇති බැර ලෝහ සහිත අපිරිසිදු ජලය පානය හේතු කොටගෙන ලංකාවේ උතුරුමැද පළාත ප්‍රමුඛ පළාත් කිහිපයක සීඝ්‍රයෙන් පැතිර යන වකුගඩු රෝගය නිදන්ගත වකුගඩු රෝගය ලෙස හඳුන්වනු ලැබේ. (World Health Organization et. al, 2009)බෝ නොවන රෝගයක් ලෙස සැලකෙන නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්තවීම සඳහා බලපාන සාධක බොහෝමයක් හඳුනාගෙන ඇත.

ලෝකයේ මෙන්ම ලාංකේය සමාජය තුළ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්තවීමට බලපාන ප්‍රධාන හේතු සාධක ලෙස දියවැඩියාව සහ අධික ආතතිය හඳුනාගෙන ඇත. (Celo,Vela et. al, 2012) නමුත් මධ්‍යම ආර්ථික රටාවක් පවත්නා ලංකාව වැනි රටවල නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තියට බලපාන සාධක වෙනත් මුහුණුවරක් ගන්නා බව පෙන්වාදිය හැකිය. (Yolanthika et. al, 2016)

1970න් පසු කාලවකවානුව තුළ කාර්මීකරණයත් සමඟ ගෝලීයකරණය වීම හේතුවෙන් ඔරොත්තු දිය නොහැකි තරම් ආර්ථික සංවර්ධනයක් සිදුවිය. එහි ප්‍රතිඵල ලෙස සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය, කාර්මික කෘෂිකර්මාන්තයක් බවට පත්විය. (Sim et. al, 1989) එහි ප්‍රතිඵල ලෙස කෘෂි අංශයෙහි වර්ධනය සඳහා පොහොර භාවිතය හා කෘෂි රසායනික ද්‍රව්‍ය කෘමි නාශක භාවිතය ලොව ව්‍යාප්ත විය. (Sim et. al, 1989)

ලාංකේය ජන ජීවිතයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය විය. උතුරුමැද පළාත කේන්ද්‍ර කරගනිමින් ව්‍යාප්තවී ඇති නිදන්ගත වකුගඩු රෝගය වැඩි වශයෙන් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවියා ගොදුරු කරගන්නාවූ වසංගතයක් ලෙස වියළි කලාපය තුළ ව්‍යාප්තව පවතී. (Jayasumana et. Al, 2015)වී ගොවියා විසින් රසායනික පොහොර භාවිතය හා කෘමි නාශක භාවිතයත් ඒවාට නිරාවරණය වීම හේතුවෙන් වකුගඩු රෝගය වැළඳී ඇති බව හඳුනාගෙන ඇත. (Subasingha et. al, 2014) මේ අනුව නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්තියට බලපාන ප්‍රබල සාධකය ලෙස කාර්මික කෘෂිකර්මාන්තයේ ප්‍රතිඵල ලෙස පෙන්වාදිය හැකිය. (Bandara et.al, 2015) පර්යේෂකයන් පෙන්වා දෙන්නේ සමාජ පංතිය හා වයස යන සාධකද (Mendis et.al, 2011) දරිද්‍රතාවය, උණුසුම් හා තෙතමනය සහිත පරිසර, ප්‍රමාණයෙන් නොසෑහෙන සෞඛ්‍ය පහසුකම් හා සනීපාරක්ෂාව යන සාධක නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තිය සඳහා බලපාන ප්‍රබල සාධක අතර වේ. (Yakiub et. al, 2014)

නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන තවත් සාධකයක් ලෙස කෘමිනාශක වැඩිපුර භාවිතා කරන (එළවළු, පළතුරු) ප්‍රමිතියක් නැති ආහාර වර්ග පරිභෝජනයට ගැනීමෙත් ෆ්ලෝරයිඩ් අඩංගු කුඹුරු ආශ්‍රිත ජලය පානය කිරීම හා මුළුතැන්ගෙයි කටයුතු වැනි එදිනෙදා අවශ්‍යතා සඳහා යොදා ගැනීම මඟින් වකුගඩු රෝගය වැළඳීමට මෙන්ම ව්‍යාප්තියට බලපාන බව පෙන්වාදිය හැකිය. (Sunil et. al, 2014)

තවද ආහාර පිසීම සඳහා ඇලුමිනියම් භාජන යොදා ගැනීම හේතුවෙන් ෆ්ලෝරයිඩ් ශරීරගත වීම තුළින්ද රෝගය ව්‍යාප්තිය සිදුවන බව හඳුනාගෙන ඇත. මෙහිදී ඉවුම් පිහුම් කටයුතු සඳහා මැටි භාජන යෝග්‍ය බව වෛද්‍යවරු පවා නිර්දේෂ කර ඇත. (Subasingha et. al, 2014)

කාමිනාශක හා රසායනික පොහොර භාවිතයේදී මෙන්ම ජල කළමනාකරණය සහ ජල සම්පාදන ක්‍රමයන්ගේ අක්‍රමවත් බව නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තියට හේතු වී ඇත. (Silva & Amarasiri et.al, 2013) කාමිනාශක හා රසායනික පොහොර භාවිතා කළ කුඹුරුවල සිට වාරි ඇලවල් හරහා වැව් අමුණුවලට මිශ්‍රවන විෂ රසායනික මිනිසා මෙන්ම සතුන්ද පරිභෝජනය කරයි. මෙහිදී මෙම ප්‍රදේශවල ආහාරයට ගන්නා "තිලාපියා" වැනි මත්ස්‍ය වර්ග ආහාරයට ගැනීමේදී මෙම විෂ ශරීරගත වීම තුළින් නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තිය සඳහා වාරි කර්මාන්තවල බලපෑමද ඇති බව පෙන්වාදිය හැකිය. (Subasingha et. al, 2014)

නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තියට බලපාන ප්‍රබල පාරිසරික සාධකයක් ලෙස බැර ලෝහ කර්මාන්තයේ (ආසනික්, කැඩ්මියම්, ඊයම්, රසදිය හා ක්රෝමියම්) බලපෑම පවතින බව මෙන්ම වකුගඩු රෝගයට හේතු සාධක වන බව පෙන්වාදිය හැකිය. වියළි කලාපයේ බොහෝමයක් ජනතාව නළ ළිං, ජලය පානය කිරීම සඳහා යොදා ගන්නා අතර නළ ළිං ජලයෙහි ආසනික් තැන්පත්ව ඇති බැවින් ඒවා ශරීරගත වීමෙන් වකුගඩු රෝගය වැළඳීමට හේතු සාධක වේ. (Gunathilaka et. al, 2012)

දීර්ඝ කාලවකවානුවක පටන් සිදුකෙරෙන ආයුර්වේද ප්‍රතිකාර ක්‍රමයන්ද නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තියට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස පෙන්වාදිය හැකිය. (Wanigasooriya et. al, 2012) ආයුර්වේද ප්‍රතිකාර සඳහා යොදාගන්නා දේශීය ඖෂධයක් වන "සත්සඳ" වකුගඩු රෝගය සඳහා රෝග කාරකයක් වන බව පර්යේෂණ වලින් තහවුරුවී ඇත. (Sunil et. al,2011) තායිවානය, ඉන්දියාව, බංගලාදේශය වැනි රටවලින් වාර්තා වන්නේද ඖෂධ වර්ග (පෙනඩෝල්) වකුගඩු රෝගය වැළඳීමට බලපාන බවය.(Gunathilaka et. al,2012) මුත්‍රා රෝග, ගුජ්ජිකාව ආශ්‍රිත රෝග, (World Health Organization et. al) මී උණ, මැලේරියාව පද්ධතිමය ආශ්‍රිත අධි රුධිර පීඩනය, පද්ධතිමය රෝග, කහ උණ, (Gunathilaka & Sunathra

et.al,2012) හෘදවාහිනී රෝග (vela et. al, 2012) වකුගඩු ආශ්‍රිත බාහිර තුවාල (වකුගඩුවට තියුණු පහරක් වැදීම) යනාදී රෝග තත්ත්වයන් වකුගඩු රෝගයේ ව්‍යාප්තියට බලපාන බව පර්යේෂණ වලින් තහවුරුවී ඇත. (Gunathilaka & Sunathra et. al,2012)

නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තියට බලපාන සමාජමය වශයෙන් වර්තමානයේ ප්‍රබල ගැටලුවක්ව පවතින මිනිස් ශරීරය අඩපණ කරන මත්පැන්, මත්ද්‍රව්‍ය (හෙරෝයින්, කොකේන්) (Gunathilaka & Sunathra et.al,2012) දුම්වැටි භාවිතය හේතුවෙන්ද, (vela et. al, 2012) සර්පයන් දෂ්ඨ කිරීම (Subasingha et.al,2014), තරබාරු බව (Liyanage et.al,2009) වකුගඩු රෝගය වැළඳීමට මෙන්ම ව්‍යාප්ත වීමට හේතු සාධක වේ.

**බලපෑම**

**සමාජයීය බලපෑම**

ලාංකේය සමාජයේ ප්‍රධාන සෞඛ්‍ය ගැටලුවක්ව පවතින නිදන්ගත වකුගඩු රෝගය වියළි කලාපයේ උතුරුමැද, ඌව, වයඹ යන පළාත්වල ගොවි ජනතාවගේ ජන ජීවිත වලට විශාල බලපෑමක් කර ඇත. (Chandrajith et. al,2010) ආර්ථික වශයෙන් ශක්තිමත් නොමැති සෞඛ්‍ය පහසුකම් අවම ළමුන්, කාන්තා, පිරිමි යනාදී සමාජයේ විවිධ කණ්ඩායම් සඳහා ඍජුව හෝ වක්‍ර වශයෙන් බලපෑම් කරන්නට වකුගඩු රෝගය මේ වන විටත් සමත් වී ඇත. (Subasingha et.al,2014)

සමාජයේ පවතින වසංගත රෝග පිළිබඳ අධ්‍යාපනයේදී නිදන්ගත වකුගඩු රෝගය සඳහා ස්ත්‍රී පුරුෂ බව, වයස, ජන වර්ගය සහ සමාජ පන්තිය යන සාධකද බලපාන බව හඳුනාගෙන ඇත. (Liyanage et.al,2009) එමෙන්ම නිදන්ගත වකුගඩු රෝගීන් සාමාන්‍ය ජනගහනයෙන් 15% ට වඩා වැඩි ප්‍රමාණයක් අවු : 15 -70 අතර වයස් ඛාණ්ඩයේ සිටින රෝගීන් වේ. (Mendis et.al,2011)

1997 සිට 2007 කාල සීමාව තුළ සලකා බැලීමේදී වකුගඩු රෝගය හේතුවෙන් රෝහල් ගතකරන රෝගීන් ප්‍රමාණය දෙගුණ වී ඇති බව වාර්තා වේ. (CSE et.al,2014|) සමස්තයක් ලෙස ලංකාවේද අවුරුද්දකට මෙම රෝගයෙන් මිය යන ප්‍රමාණය 1400ක් පමණ බව වාර්තාවල සඳහන් වේ. (Athuruliya, Abesekara, Amarasingha, Kumarasiri, Disanayake et.al, 2009)

නිදන්ගත වකුගඩු රෝගය වැළඳීමට බලපාන ප්‍රධාන සාධක ලෙස දියවැඩියාව හා අධික ආතතිය පොදුවේ ලොව හඳුනාගත් කරුණකි. (Elledge et.al,2014)

(Jary,Jory et.al,2000) නමුත් ලාංකේය සමාජයේ නිදන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තිය වියළි කලාපයේ කෘෂි බිම් ආශ්‍රිතව වැඩි වශයෙන් පැතිරෙන්නකි. (Subasingha et.al,2014) එනම් මෙම රෝගය පුළුල්ව පැතිරීමට බලපෑම් කර ඇත්තේ කෘෂිකර්මාන්තය කාර්මීකරණය වීමත් සමග පොහොර හා කෘමිනාශක ග්‍රාමීය ගොවි ජනතාව භාවිතයට ගැනීමත් සමගය. (Sim et.al,1989) පොහොර හා කෘෂි රසායන මෙන්ම කෘමිනාශක දීර්ඝ කාලයක සිට භාවිතයේ ප්‍රතිඵල ලෙස වර්තමානයේ රටට බත සපයන ගොවියාගේ ප්‍රධාන ජීවනෝපාය කඩාකප්පල් කරමින් දිවිපෙවෙත විනාශ කරන්නාවූ සදාචාරාත්මක ලෙස වසංගතයක් බවට නිදන්ගත වකුගඩු රෝගය පත්වී ඇත. (Athuruliya et.al,2009)

Socioeconomic status have significant impact on cancer which are highlighted that many researchers in their study. Among those socio economic status, gender, occupation, family background and education are very important. Furthermore race, geographical, environmental factors especially food consumption habits are related for cancer incidence as well as the final result cancer effect on economically, individually, family, society, globally.

However, there is rare, studies about socio economic factors affected on cancer situation in Sri Lanka and how socio economic factors differ in cancer incidence in Sri Lankan society. Therefore further studies are needed to confirm these findings in other health and social welfare strategies in Sri Lanka.

**List of References**


Cancer_Incidence_Data_2009.pdf. (n.d.).

Cancer, N., Programme, C., Mawatha, E., Lanka, S., & Registry, C. (2005). *Cancer Incidence Data : Sri Lanka Year 2001-2005 National Cancer Control Programme*.

Céilleachair, A. Ó., Costello, L., Finn, C., Timmons, A., Fitzpatrick, P., Kapur, K., … Sharp, L. (2012). Inter-relationships between the economic and emotional consequences of colorectal cancer for patients and their families : a qualitative study.

Data, C. I., & Lanka, S. (2007). Cancer Incidence Data , Sri Lanka Cancer Incidence Data : Sri Lanka Year 2007.

Hebert, J. R., Hurley, T. G., Olendzki, B. C., Teas, J., Ma, Y., & Hampl, J. S. (1998). Nutritional and Socioeconomic Factors in Relation to Prostate Cancer Mortality : a Cross-National Study, *90*(21), 1637–1647.

Hemminki, K., Zhang, H., & Czene, K. (2003). Socioeconomic factors in cancer in Sweden. *International Journal of Cancer. Journal International Du Cancer*, *105*(January), 692–700. http://doi.org/10.1002/ijc.11150

Individual-, D., Effects, C., Robert, S. A., Strombom, I., Trentham-dietz, A., Hampton, J. M., … Remington, P. L. (2004). Socioeconomic Risk Factors for Breast Cancer, *15*(4), 442–450. http://doi.org/10.1097/01.ede.0000129512.61698.03

Ma, X., & Yu, H. (2006). Global Burden of Cancer, *79*, 85–94.

Profile, C. M., Trends, A. C. M., & Incidence, C. (2014). Sri Lanka, 6–7.

Pukkala, E., & Weiderpass, E. (2002). Socio-economic differences in incidence rates of cancers of the male genital organs in Finland, 1971-95. *International Journal of Cancer*, *102*(6), 643–648. http://doi.org/10.1002/ijc.10749

Singh, G. K., Williams, S. D., Siahpush, M., & Mulhollen, A. (2011). Socioeconomic, rural-urban, and racial inequalities in US cancer mortality: Part I-All cancers and lung cancer and part II-Colorectal, prostate, breast, and cervical cancers. *Journal of Cancer Epidemiology*, *2011*. http://doi.org/10.1155/2011/107497

Stare, S. M., & Jozefowicz, J. J. (2008). The Effects of Environmental Factors on Cancer Prevalence Rates and Specific Cancer Mortality Rates in a Sample of OECD Developed Countries. *International Journal of Applied Economics*, *5*(September), 92–115.

The American Cancer Society, & LiveStrong. (2010). The Global Economic Cost of Cancer, 1–14.

Ward, E., Jemal, A., Cokkinides, V., Singh, G. K., Cardinez, C., Ghafoor, A., & Thun, M. (2010). Cancer disparities by race/ethnicity and socioeconomic status. *CA: A Cancer Journal for Clinicians*, *54*(2), 78–93. http://doi.org/10.3322/canjclin.54.2.78

Yabroff, K. R., Lund, J., Kepka, D., & Mariotto, A. (2011). Economic burden of cancer in the United States: estimates, projections, and future research. *Cancer Epidemiol Biomarkers Prev.*, *20*(10), 2006–14. http://doi.org/10.1158/1055-9965.EPI-11-0650

# ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම් සඳහා බලපාන සාධක පිලිබඳ ආනුභවික අධ්‍යයනයක්

පී.එස්. මධුභාෂිණී[1]

**සංක්ෂේපය**

ඉංග්‍රීසි බසින් " Suicide " යන පදයට පර්යාස වශයෙන් සිංහල භාෂාවෙහි සියදිවි නසා ගැනීම ආත්ම ඝාතනය ආත්ම ගුණය යනාදි වශයෙන් ව්‍යවහාරයත් රාශියක්ම සමාජ ගතව පවති. වර්තමානය වන විට දල වශයෙන් ලෝකයේ මිනිසුන් ලක්‍ෂ 8 - 10 ත් අතර සංඛ්‍යාවක් සියදිවි නසා ගැනීම නිසා ජීවිතය නැතිකර ගන්නා අතර එය 100,000 ට 11.4 ක් වේ. ශ්‍රී ලංකාවේ වාර්තා වන ප්‍රමාණය 2012 වර්ෂය වන විට 100,000 ට 28.8 පමණ වේ. මෙසේ සිය දිවි නසා ගැනීමේ ලෝක තත්ත්වය අනුව ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයෙන් වාර්තා වේ. නමුත් ලංකාව තුල සියදිවි නසා ගන්නා සංඛ්‍යාව වසරින් වසරට අඩුවෙමින් පවතී. එනම් 1995 වසරේදී 8500 ක් පමණ සියදිවි නසාගෙන තිබූ අතර එය 2014 වන විට 3140 දක්වාද පහල බැස ඇත.

**ක්‍රමවේදය**

සසම්භාවීව තෝරා ගනු ලැබූ ශ්‍රී ලංකාවේ සියදිවිනසා ගැනීම සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ වාර්ථා 20 ක් හා ශ්‍රී ලංකා පොලිස් වාර්ථාව අධ්‍යයනය කරන ලදී.

**හැඳින්වීම**

සියලු සත්වයන් මෙන්ම මිනිසාද දීර්ඝ කාලීන ජීවිතාපේක්‍ෂාව ඇත්තෝ වෙති. මිනිසාගේ ස්වභාවය වන්නේ වැඩිම කාලයක් සතුටින් ජීවත් වීමට ජීවන අරගලයෙහි යෙදීමයි. ''මිනිසා සෑම තප්පරයකම උත්සාහ ගනු ලබන්නේ ජීවත් වීම සඳහාය.'' යනුවෙන් ෂොපන් හ්වර් නම් බටහිර දාර්ශනිකයා, විසින් වරක් පවසා ඇත්තේ එබැවිනි.

නමුත් මානව ශිෂ්ටාචාරයේ ඉතිහාසය කොතෙක් වේද? ඒ හා දිගු ඉතිහාසයක් සියදිවි නසා ගැනීමට ද ඇති බව ඊට අදාලව සිදු කෙරී ඇති අධ්‍යයනයක් තුලින් හා ඊට අදාලව ලිය වී ඇති සාහිත්‍ය පරිශීලනය කිරීම තුලින් ප්‍රත්‍යක්‍ෂ වේ. ''මිනිස් සංහතියේ ආරම්භය තෙක් දිවයන සියදිවි නසා ගැනීම, මිනීමැරීම් හා ස්වභාවික මරණ තරමටම ඉපැරණි සමාජ සංසිද්ධියක් (Socal Phenomenon) ලෙසින් එමිල් ඩුර්ක් හයිම්ගේ'' "Suicide " කෘතිය ජෝර්ජ් සිල්බර්ග් විසින්

---

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. madupalliyaguru@gmail.com

හැඳින්වීම සපයා දී ඇති ආකාරනේම එය සනාථ වේ. මිනිසා වානර යුගයේ සිට (Homo Niendathal ) රංචු ගැසීම, කැරලි ගැසීම, කලහ කිරීම ආදී ප්‍රකාශිත චර්යාවන් කෙරෙහි යොමු වූයේ යම්සේද එසේම සිරිතක් වශයෙන් තියුණු ගල් ගුහා භාවිතයෙන් හෝ වස විස පානයෙන් සිවි දිවි නසා ගැනීම සිදුකර ඇති බවට සාක්ෂි ඇත. (පෙරේරා , 2004 , පිටු , 87 - 88)

ඉංග්‍රීසි බසින් " Suicide " යන පදයට පර්යාස වශයෙන් සිංහල භාෂාවෙහි සියදිවි නසා ගැනීම ආත්ම ඝාතනය ආත්ම ගුණය යනාදි වශයෙන් ව්‍යවහාරයත් රාශියක්ම සමාජ ගතව පවතී.

යම් සරල සමාජයක් නූතන සංකීර්ණ සමාජ ප්‍රවාහයක් බවට පරිවර්තනය වීමේදී එම විකාශයේ අනපේක්ෂිත විෂමතා හේතුවෙන් සියදිවි නසාගැනීමේ අනුපාතය ඉතා ඉහළ අගයක් ගැනීම කැපී පෙනන තත්ත්වයකි. යම් සමාජයක පවතින සියදිවි නසා ගැනීමේ අගයන්හි ප්‍රමාණාත්මකභාවය, උච්චාවචනය වීමේ සීග්‍රතාවය එම සමාජයේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය තීරණය කිරීමේ නිර්ණායකයක් ලෙසද හඳුනා ගත හැකිය. යම් සමාජයක සියදිවි නසා ගැනීම පහළ අගයක් ගන්නේද නොඑසේනම් එය අදාල ප්‍රජාව තුල සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇත්තේද යන්න තීරණය කිරීම සඳහා Robert J. Havighurst විසින් හඳුන්වා දී ඇති මිනුම් දණ්ඩට අනුව, කවර හෝ ජන සමාජයක ජනගහනයෙන් 100,000 : 05 ක සියදිවි නසාගැනීමේ අනුපාතයක් ඇතොත් එය පහල සියදිවි නසා ගැනීම් අගයක් වෙයි. නමුත් එය අනුපාතය 100,000 : 15 ක් නම් එය ඉතා විශාල අගයක් ලෙස සලකයි.

ලොව වැඩිම සියදිවි නසාගැනීම් සංඛ්‍යාවක් වාර්තා වූ රට ලෙස අතීතයේ පිලිගනු ලැබුවේ හංගේරියාව වන අතර එය 100,000 : 52 ක් වේ. 1985 - 89 අතර කාලය තුල ශ්‍රී ලංකාවේ 100,000 : 49.6ක් වශයෙන් සියදිවි නසාගැනීම් වාර්තා වේ. එමෙන්ම ග්‍රීසිය (2.9), ස්පාඤ්ඤය (4.1) ද ලෙස අඩුම සියදිවි නසා ගැනීම් වාර්තා වූ රටවල් ලෙස දක්වා තිබේ. (බණ්ඩාරනායක : 1999, පිටු 10 - 11) නමුත් වර්තමානය වන විට දල වශයෙන් ලෝකයේ මිනිසුන් ලක්ෂ 8 - 10 ත් අතර සංඛ්‍යාවක් සියදිවි නසා ගැනීම නිසා ජීවිතය නැතිකර ගන්නා අතර එය 100,000 ට 11.4 ක් වේ.(World Health Organization, 2014) ශ්‍රී ලංකාවේ වාර්තා වන ප්‍රමාණය 2012 වර්ෂය වන විට 100,000 ට 28.8 පමණ වේ.(World Health Organization, 2014) මෙසේ සිය දිවි නසා ගැනීමේ ලෝක තත්ත්වය අනුව ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයෙන් වාර්තා වේ.

නමුත් ලංකාව තුල සියදිවි නසා ගන්නා සංඛ්‍යාව වසරින් වසරට අඩුවෙමින් පවතී. එනම් 1995 වසරේදේ 8500 ක් පමණ සියදිවි නසාගෙන තිබූ අතර එය 2005 වන මිට 4740 දක්වාත් 2014 වන විට 3140 දක්වාද පහල බැස ඇත. (Sri Lnka Police Statistions Department)

**මානව ලක්ෂණ අනුව සියදිවි නසා ගැනීම් වෙනස් වන ආකාරය**

පුද්ගලයන්ගේ වයස, ස්ත්‍රී පුරුෂභාවය, ආගම, ජාතිය ආදී මානව ලක්ෂණ සිය දිවි නසා ගැනීම සඳහා කෙතෙක් දුරට බලපාන්නේද යන්න විවිධ පර්යේෂණ මගින් විශ්ලේෂණය කර ඇත. ඒ අනුව ලංකාවේ ස්ත්‍රී පුරුෂභාවය අනුව සියදිවි නසා ගැනීම අධ්‍යයනයේදී පැහැදිලි වන ප්‍රධානම කාරණය නම් සෑම වර්ෂයකම ස්ත්‍රීන්ට වඩා සියදිවි නසා ගැනීමට පෙළඹෙන්නේ පුරුෂයින් සංඛ්‍යාව ඉහල අගයක් ගන්නා බවයි. ඒ අනුව 1980 සිට 1995 කාල පරාසය තුල ලංකාවේ වැඩිම සියදිවි නසා ගැනීම් ප්‍රමාණයක් වාර්තා වේ. පුරුෂ සියදිවි නසා ගැනීම් ප්‍රමාණය 68 / 100,000 ක් ලෙස උපරිම අගයක් වේ. එනම් 1995 වර්ෂයේය. එම වර්ෂයේම ස්ත්‍රී සියදිවිනසා ගැනීම් ප්‍රමාණයේ ද ඉහල අගය වාර්තා වේ. එනම් 27/ 200,000 ට වශයෙන් (Knipe et al., 2014) වේ. ආකාරයට 2005 සිට 2014 වර්ෂය දක්වා පොලිස් වාර්තාව තුලින් විශේලේෂණය කර ඇති ආකාරයට එම වසර දහය තුල ලංකාවේ මුළු සියදිවි නසා ගැනීම්වල එකතුව 39368 ක් වන අතර ස්ත්‍රී මුළු සියදිවි නසා ගැනීම් සංඛ්‍යාව 87.03 (23%) ක් හා පුරුෂ මුළු සියදිවි නසා ගැනිම් සංඛ්‍යාව 30 665 (77%). ඒ අනුව එම කාලය තුල ලංකාවේ සියදිවි නසා ගැනීම් පුරුෂ ස්ත්‍රි අනුපාතය 3 : 1 වේ.(Balasooriya & Kularathne, 2016) 1995 සිට 2011 දක්වා ලංකාව තුල සියදිවි නසා ගැනිම් විශ්ලේෂණය කිරීමේදී 1995 වර්ෂයේ 47.0 100,000 ක් සහ 2009 වර්ෂය වන විට එය 19.6 / 1000,000 දක්වා අඩු වී ඇති අතර 2011 වර්ෂයේ පුරුෂ සියදිවි නසා ගැනීම් ප්‍රමාණය 34.8 / 100,000 ට සහ ස්ත්‍රී සියදිවි නසා ගැනීම් සංඛ්‍යාව 9.24 / 100,00 ක් ලෙස දැක්වේ. ඒ අනුව පුරුෂ ස්ත්‍රී අනුපාතය එම වර්ෂයේ 3,76 : 1 වේ.(V. A. De Silva, Senanayake, Dias, & Hanwella, 2012) තවද 2011 වර්ෂය වන විට 34.8 හා 9.24 (1000,000) වන විට 34.8 හා 9.24 :100,000) දක්වා පිළිවලින් පුරුෂ හා ස්ත්‍රී සියදිවි නසා ගැනීම් අවම වී ඇත්තේ 1995 වර්ෂයේ 89 94/ 100,000 හා 30.79/100,000 වශයෙන් නැවත පුරුෂ හා ස්ත්‍රී සියදිවි නසා ගැනීම් ප්‍රමාණය වීම විශේෂයකි.(V. A. De Silva et al., 2012)

ස්ත්‍රී පුරුෂභාවය අනුව මෙන්ම, සියදිවි නසා ගන්නා ප්‍රමාණය හා සියදිවි නගා ගන්නා ආකාරය වයස් ව්‍යුහය අනුව ද වෙනස් වේ. ඒ අනුව පුරුෂයන් වයස අවුරුදු 60 ට වැඩි වයස් කණ්ඩයේ සියදිවි නසා ගැනීම් ප්‍රමාණය අනෙක් වයස් කණ්ඩවලට සාපේක්ෂව සෑම වසරවල ඉහල අගයක් ගෙන ඇත. වයස් කාණ්ඩ අනුව සැලකීමේදී අවුරුදු 10 සිට 24 වයස් කාණ්ඩය අඩුම සියදිවි නසා ගැනීම් ප්‍රමාණයක් දැක්වේ. එමෙන්ම ස්ත්‍රීන්ගෙද 2001 සිට වැඩිම සියදිවි නසා ගැනීම් ප්‍රමාණයක් දැක්වෙන්නේ 10 සිට 24 වයස් කාණ්ඩයේය.("Suicide Trends In Sri Lanka 1880- 2006 ; Social , Demographic And Geographical Variations," 2006) එමෙන්ම අඩුම සියදිවි නසා ගැනීම් ප්‍රමාණයක් සිදු වන්නේ 40 සිට 59 වයස් කාණ්ඩයේ පසුවනන්ගේය. (Thalagala, 2009) ඒ අනුව වයස් කාණ්ඩ අනුව සිදුවන සියදිවි නසා ගැනීම් ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් වේ. 2005 සිට

2014 අතර කලා පරාසය තුල සියදිවිනසා ගැනීම් සිදුවන ප්‍රමාණය ළමා, තරුණ, මැදි වයස, වැඩිහිටි, වයෝවෘද්ධ (08 සිට 16), (17 සිට 30) (31 සිට 45), (46 සිට 55) (56 ට වැඩි) ලෙස වර්ගකර විශේලේෂණය කල පසු වැඩිම සියදිවි නසා ගැනීම් ප්‍රමාණයක් තරුණ වයස් කාණ්ඩයෙන් දැක්වේ. (Balasooriya & Kularathne, 2016) තවද 2005 සිට 2014 දක්වා අඩුම සියදිවි නසා ගැනීම් ප්‍රමාණයක් ළමා (08 සිට 16) වයස් කාණ්ඩයෙන් සිදුවී ඇත. එනම් වර්ෂයකට 100 සිට 200 අතර සංඛ්‍යාවකින් (Balasooriya & Kularathne, 2016)

1995 සිට 2011 දක්වා සියදිවි නසා ගැනීම් විශ්ලේෂණය කිරීමේදී ද වයස් ව්‍යුහය පිළිබඳ අවධානය යොමුකර ඇත. ඒ අනුව ස්ත්‍රී සියදිවි නසාගැනීම් එම වයස 15 තුලම වයස අවුරුදු 20 සිට 29 වයස් කාණ්ඩයේ පසුවන්නන් වැඩි වශයෙන් යොමු වී ඇති බැව් පැහැදිලිය. අඩුම සියදිවිනසා ගැනීම් ප්‍රමාණයක් අවු : 40 සිට 59 වයස් කාණ්ඩයෙන් වාර්තා වේ.(V. De Silva, Hanwella, & Senanayake, 2012) එම පර්යේෂණයටම අනුව පුරුෂ සියදිවි නසා ගැනීම්වල ව්‍යාප්තිය ඊට වෙනස් වේ. ඒ අනුව සාපේක්ෂව වැඩිම සියදිවිනසා ගැනීම් ප්‍රමාණයක් 40 සිට 59 හා 60 ට වැඩි යනු වයස් කාණ්ඩයෙන් වාර්තා වන අතර අඩුම සියදිවිනසා ගැනීම් සංඛ්‍යාව වසර 15 තුලම 10 සිට 19 වයස් කාණ්ඩයෙන් හඳුනාගැනීමට හැකිවීම විශේෂත්වයකි.(V. De Silva et al., 2012) මෙම පර්යේෂණය මගින් විශ්ලේෂණය කර ඇති වයස් කාණ්ඩ අනුව 1995, 2000 2005, 2011 යන ර්යේෂයන්හි සියදිවි නසා ගැනීම් වල වෙනස් වීම අධ්‍යයනය කිරීමේදී දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් නම් 1995 වසරේ සිට 2011 වර්ෂය වන විට ස්ත්‍රී සියදිවි නසා ගැනීම් ක්‍රමයෙන් අඩුවෙමින් පැවතුන අතර, ඊට සාපේක්ෂව පුරුෂ සියදිවිනසා ගැනීම් සෑම වයස් කාණ්ඩයකම වැඩිවීමක් දක්නට ලැබීමයි. (V. De Silva et al., 2012) තවද 1975 සිට 2012 වර්ෂයන්හි පොලිස් වාර්ථාව මගින් ද සියදිවි නසා ගැනීම් වෙනස්වන ආකාරය විශ්ලේෂණය කර ඇත. ඒ අනුව 1975 සිට 2012 දක්වා සෑම වර්ෂයකම වැඩිම ස්ත්‍රී සියදිවි නසා ගැනීම් සංඛ්‍යාවක් වයස අවුරුදු 17 සිට 25 වයස් කාණ්ඩයෙන් සිදුවන අතර අඩුම ස්ත්‍රී සියදිවිනසා ගැනීම් අවු. 36 සිට 55 සහ 55 ට වැඩි වයස් කාණ්ඩ තුල සිදුවේ. නමුත් පුරුෂ වැඩිම සියදිවි නසා ගැනීම් සංඛ්‍යාවක් 1992 වර්ෂයේ සිටම වාර්තා වන්නේ අවු. 55 ට වැඩි වයස් කාණ්ඩයෙනි. එලෙසම අඩුව සියදිවිනසා ගැනීම් සංඛ්‍යාව 17 සිට 25 වයස් කාණ්ඩයන් දැක්වේ. (Knipe et al., 2014)

2002 වර්ෂයේ සියදිවිනසා ගැනීම් විශ්ලේෂණය මඟින් දැක්වෙන පර්ය්ෂණ වාර්තාවේද දැක්වෙන ආකාරයට එම වර්ෂයේ වැඩිම පුරුෂ සියදිවි නසා ගැනීම් ප්‍රමාණය වයස අවුරුදු 60 සිට 64 වයස් කාණ්ඩයෙන් වාර්තා වන අතර අඩුව සියදිවි නසා ගැනීම් ප්‍රමාණය 10 සිට 14 වයස් කාණ්ඩයෙන් හඳුනාගත හැකිය. නමුත් ස්ත්‍රී වැඩිම සියදිවි නසාගැනීම් සංඛ්‍යාව 20 සිට 29 සහ 40 සිට 44 වයස් කාණ්ඩයන්ගෙන් දැක්වේ. අවම ස්ත්‍රී සියදිවි නසා ගැනීම සංඛ්‍යාව අවුරුදු 70 ට වැඩි හා 65 සිට 69 වයස් කාණ්ඩයෙන් දැක්වේ. (Desapriya, 2004)

ඒ අනුව වයස් ව්‍යුහය අනුව සියදිවිනසා ගැනීම් අධ්‍යයනය කිරිමේදී පර්යේෂණ වාර්තා සියල්ලක්ම එක හා සමාන අදහසක් ඉදිරිපත් කරන බව පැහැදිලිව හඳුනාගත හැකිය.

ස්ත්‍රී පුරුෂභාවය, වයස් කාණ්ඩ අනුව මෙන්ම ජාතීන් වශයෙන්ද සියදිවි නසා ගැනීටම යොමු වීමෙහි විශේෂත්වයක් ඇති බව Thalagala විසින් 1986 සිට 2006 දක්වා ශ්‍රී ලංකාවේ දත්ත මගින් විශ්ලේෂණය කර ඇත. ඒ අනුව 1986 වර්ෂයේ ලංකාවේ වැඩිම සියදිවි නසා ගැනීම් සඳහා යොමු වූ ජාතිය වනුයේ සිංහලය. එනම් 49/1000,000 වශයෙනි. එම වර්ෂයේම සියදිවි නසා ගැනීම් සඳහා අඩුවෙන්ම යොමු වී ඇත්තේ මුස්ලිම් ජාතිකයන් වන අතර එය 10/100,000 වේ. (Paper, 2008) නමුත් 1996 වර්ෂය වන විට එම තත්ත්වය ක්‍රමයෙන් වෙනස්වූවද වැඩිම සියදිවිනසා ගැනීම සංඛ්‍යාවක් දැක්වෙන්නේ සිංහල ජාතිකයන් අතරය. එය 44/100,000 නමුත් අඩුම සියදිවි නසාගැනීම් සංඛ්‍යාව මුස්ලිම් ජාතිකයන් අතරින් නොව ඉන්දීය දෙමළ ජාතිකයන් අතරින් වාර්තා වේ. එය 2/1000,000 තරම් අවම ප්‍රතිශතයකි. නැවත 2006 වර්ෂය වන විට එම තත්ත්වයන්ද ක්‍රමයෙන් වෙනස් වී ශ්‍රී ලංකාව දෙමළ ජාතිකයින්ගේ සියදිවිනසා ගැනීම් ප්‍රතිශතය ඉහල ගොස් ඇත. එමෙන්ම 2006 වර්ෂය වන විට නැවත මුස්ලිම් ජාතිකයන් අවම සියදිවිනසා ගැනීම් සඳහා යොමුවනු ජාතිය බවට පත්වී ඇත. ශ්‍රී ලංකාවේද සියදිවි නසා ගැනීම ප්‍රතිශතයක් ආගම් අනුවද වෙනස් වි ඇති ආකාරය තලගල විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවෙහි දැක්වේ. ඒ අනුව 1986 සිට 2001 දක්වා වර්ෂ සියල්ලෙහිම වැඩිම සයදිවි නසා ගැනීම අනුපාතයක් දැක්වෙන්නේ බෞද්ධාගමිකයන් තුළය. එමෙන්ම ශ්‍රී ලංකාවේද අඩුම සියදිවිනසා ගැනීම් ප්‍රතිශතයක් දැක්වෙන්නේ ඉස්ලාම් ආගමිකයන් තුළයි. (Knipe et al., 2014) මේ ආකාරයට අධ්‍යාපන කිරීමේදී පැහැදිලි වන්නේ බෞද්ධාගමිකයන් සියදිවි නසා ගැනීමට නැඹුරු වන ප්‍රතිශතය ලංකාවේ මෙන්ම ලෝකයේද ඉහල අගයක් ගන්නා බවයි.

ලෝකයේ සියදිවි නසා ගැනීම් සඳහා බලපාන නැතිනම් සියදිවි නසා ගැනීම්වල ප්‍රතිශතය වෙනස් වීමට බලපාන තවත් ප්‍රධාන සාධකයක් ලෙස භූගෝලීය ප්‍රදේශය වැදගත් වේ. ශ්‍රී ලංකාවේ 1997 සිට 2004 දක්වා සියදිවි නසා ගැනීම් සම්බන්ධ දත්ත අධ්‍යනයේදී සියදිවි නසා ගැනීම් 59 සිට 83/100,000 සහ ස්ත්‍රී 10/100, 000 ට වශයෙන් දැක්වෙන දිස්ත්‍රික්ක කිහිපයක් අධ්‍යයනය කල හැකිය. එනම් වව්නියාව, පොලොන්නරුව, අනුරාධපුරය, කුරුණෑගල, මාතලේ, කෑගල්ල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක වන අතර අඩුම සියදිවිනසා ගැනීම් ප්‍රතිශතයක් දැක්වෙන දිස්ත්‍රික්ක ලෙස ත්‍රිකුණාමලය, අම්පාර, නුවර, නුවර එළිය, කොළඹ, කළුතර, ගම්පහ සහ මාතර යන දිස්ත්‍රික්ක දක්වා ඇත. එනම් 22 සිට 40 /100,000 වශයෙනි. (Knipe et al., 2014)

**සියදිවි නසා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයන්,**

සියදිවි නසා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයක් විවිධාකාර වේ. ඒ අනුව ඉහළ ආදායම් ලබන රටවල් 50% ක් ම සියදිවිනසා ගැනීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය එල්ලීමැරීම වන අතර දෙවන ක්‍රමවේදය ලෙස ගිනි අවි භාවිතයෙන් සියදිවා නසා ගැනීම කැපී පෙනේ. ඃWorld Health Organization, 2014). නමුත් 1990 සිට 2007 කාල සීමාවේ සියදිවිනසා ගැනීම් සඳහා භාවිතා කරන ප්‍රධානම ක්‍රමය කෘමිනාශක විස ශරීරගත කර ගැනීම වේ (Knipe et al., 2014) ශ්‍රී ලංකාවේ 1975 සිට 2010 දක්වා සියදිවි නසා ගැනීම් සඳහා භාවිතා කර ඇති ක්‍රමවේදයක් අධ්‍යයනය කිරිමේදී ඉහත කාල සීමාව කාලපරිච්ඡේද වශයෙන් වෙන්කර අධ්‍යයනය කල හැකිය. ඒ අනුව 1975 සිට 1996 කාලය තුළ ලංකාවේ වඩාත් ප්‍රසිද්ධම (වැඩි වශයෙන් භාවිතා කරන ලද) ක්‍රමවේදය වූයේ විෂ පානය කිරීම වන අතර ඉන් පසු පිලිවෙලින් එල්ලී මැරීම, දුම්රියට පැන මැරීම, දියෙහි ගිලී මැරීම, පිලිස්සී මැරීම වැනි ක්‍රමවේදයන් ජනප්‍රිය විය. 1997 සිට 2001 කාල සීමාව තුල එල්ලී මැරීම ප්‍රධානම ක්‍රමවේදය විය. අනතුරුව දියෙහි ගිලීම දුම්රියට පැනීම, වෙඩි තපාගෙන මැරීම, යන ක්‍රමවේදයන් බහුලව භාවිතා විය. නැවත 2002 සිට 2010 කාල සීමාවේද එල්ලී මැරීම ප්‍රධානම ක්‍රමවේදය වී ඇත. (Duleek et.al. 2014 ). තවද ලංකාවේම 2006 වර්ෂයේ නියැදියක් අධ්‍යනයන මගින් සියදිවිනසා ගැන්ම සඳහා භාවිතා කරන ලද ක්‍රමෝපායන් කිහිපයක් හඳුනාගෙන ඇත. එනම්, වස පානය, පුළුස්සා ගැනීම, එල්ලී මැරීම, දුම්රිය පැන මැරීම, දියෙහි ගිලී මැරීම වශයෙනි. මේ අනුව සොයාගත ඇති ආකාරයට විෂ පානය මගින් මැරෙන ප්‍රතිශතය 44% ක් වන අතර එයින් 70% ක් කෘමිනාශක ද්‍රව්‍ය පානය කර සියදිවිහානි කරගෙන ඇත. ඉන් අනතුරුව සියදිවි නසාගැනීමට භාවිතා කරන ප්‍රධානම ක්‍රමවේදය ලෙස හඳුනාගෙන ඇතතේ පුළුස්සා ගැනීම වන අතර එම ප්‍රතිශතය 34% වේ. (Knipe et al., 2014)

1995 සිට 2011 සියදිවි නසාගැනීම් පිළිබඳ පොලිස් වාර්තා විශ්ලේෂණය මගින් කරන ලද පර්යේෂණයකට අනුව විවිධ කාලපරිච්ඡේද අනුව ලංකාවේ සියදිවිනසා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයන්හි සිදුව ඇති වෙනස්කම් දක්වා ඇත. ඒ අනුව 1960 වර්ෂයට පෙර සියදිවිනසා ගැනීම සඳහා බහුල වශයෙන්ම භාවිතා කරන ලද ක්‍රමවේදය එල්ලී මැරීම විය. නමුත් 1960 පමණ වි විට ආම්ලික ද්‍රව්‍ය අධිග්‍රහනය කැපී පෙනෙන්නට විය. පසුව 1980 පමණ වන විට කෘමිනාශක භාවිතයත් ඒ අතර Carbamate සහ Orgonophoshate භාවිතයන් මගින් සියදිවි නසාගැනීම කැපී පෙනින. ඊට අමතරව පිලිස්සී මැරීම, දියෙහි ගිලීම වැනි ක්‍රමයන්ද වර්ධනය වන්නට විය. 1946 සිට 2008 කාල සීමාව වන විට විෂ ශරීරගත කර ගැනීම මගින් සියදිවි හානි කරගැනීම කැපී පෙනෙන අතර ඒ සඳහා paracetamol සහ medicinal deugs භාවිතය කැපී පෙනේ. (Knipe et al., 2014)

ශ්‍රී ලංකාවේ 2005 සිට 2014 දක්වා කාල පරාසය තුල සියදිවිනසා ගැනීම් අධ්‍යනය කිරීම මගින් මේ සඳහා බලපාන ප්‍රධාන සාධක 14 ක් ගොනුකර ඇත. එ අනුව ලංකාවේ වැඩිම පිරිසක් සියදිවිනසා ගැනීම සඳහා යොමු වීමට බලපාන ප්‍රධාන සාධක ලෙස, 1. පවුල තුළින් ඇතිවන වදහිංසා (ස්වාමි /භාරය ගැටළු) 2. කායික දුබලතා, 3. මානසික ආබාධ, 4. ආර්ථික ප්‍රශ්න යනාදිය ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. ඒ අනුව පවුල් ප්‍රශ්න හේතුකොටගෙන ලංකාවේ සියදිවිනසා ගන්නා ස්ත්‍රී හා පුරුෂ ප්‍රතිශතයක් පිළිවෙවින් 33% ස 24% වේ.(Balasooriya & Kularathne, 2016) එම පර්යේෂණ වාර්තාවල තවදුරටත් වයස් කාණ්ඩ අනුව පුද්ගලයා සියදිවිනසා ගැනීම සඳහා යොමු වීමට බලපාන සාධක වෙනස්වී ඇති ආකාරය විස්තර කර ඇත. ඒ අනුව වයස (8 සිට 16) ළමා ජන සංඛ්‍යාව සියදිවිනසා ගැනීම සඳහා පෙළඹෙන ප්‍රධානම සාධකය වැඩිහිටියන් විසින් ඇති කරන ප්‍රශ්න හා ආදර සම්බන්ධතා යන්න වේ. එමෙන්ම වයස (17 සිට 30) තරුණ පිරිස සඳහාද ආදර සබඳතා මෙන්ම පවුල් ප්‍රශ්න, බලපා ඇත. නමුත් වයස අවුරුදු 56 ට වැඩි පුද්ගලයන් සඳහා ''කායික දුබලතා'' සියදිවිනසා ගැනීම සඳහා වැඩි වශයෙන් බලපා ඇත(Balasooriya & Kularathne, 2016) සියදිවිනසා ගැනීම සඳහා බලපාන සාධක පිළිබඳ කරන ලද තවත් අධ්‍යයනයකට අනුව ඒ සඳහා බලපාන සාධක ලෙස ආර්ථික පරිහානිය, ප්‍රේම සබඳතා බිඳ වැටීම, මානසික ලෝක තත්ත්වයන්, වයස්ගත භාවය යන කරුණු හඳුනාගෙන ඇත. (ශෂිකලා , 2014). 2006 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සියදිවිනසාගත් 151 ක නියැදියක් අධ්‍යාපනයට භාජනය කිරීම තුලින් ලැබුනු දත්ත අනුව සියදිවිනසා ගැනීම සඳහා බලපාන ප්‍රධාන සාධක කිහිපයක් හඳුනාගෙන ඇත. මෙහිදීද ප්‍රධාන සාධක ලෙස ස්වාමිභාර්යා ගැටළු හඳුනාගෙන ඇති අතර මෙය ප්‍රතිශතයක් ලෙස 30% ක් වේ. තවද මූල්‍යම ගැටලු, මනෝචිකිත්සාව, ප්‍රේම සබඳා ආදියද සියදිවි නසා ගැනීමට හේතු වී ඇත. (Ravinda , 2007). තවද සියදිවි නසාගැනීම සඳහා බලාපන සාධක ප්‍රධාන වශයන් වර්ග කර දැක්විය හැකිය.

1. ජන විකාශන සාධක : - ස්ත්‍රී පුරුෂ
   වයස
   විවාහය
   අධ්‍යාපනය
2. මනෝමිතික සාධක
3. සිතෙහි ඇතිවන කම්පනය හා යුධමය සාධක
4. වෙනත්

මේ ආකාරයට සියදිවි නසා ගැනීමට බලපාන සාධක ප්‍රධාන කොටස් කිහපයකට වෙන්කල හැකිය. (Department of Census and Statistics, 2006) ශ්‍රී ලංකාවේ සියදිවිනසා ගැනීම් පිළිබඳ කරන ලද තවත් අධ්‍යාපයයනයකට අනුව ඒ සඳහා බලපාන සාධක ලෙස නොගැලපෙන සබඳතා, පවුල් ආතිතිය, රැකියා අරගය, කාන්සිය (තනිකම) අධ්‍යාපන අඩු වීම හා සෘණාත්මකව පවුල් ජීවිත වල බලපෑම ආදී සාධක දක්වා ඇත.(Rajapakse, Griffiths, Christensen, & Cotton, 2014)

1971 සිට 2005 දක්වා කාල පරාසය තුල ජන සංගණය දත්ත හා ශ්‍රම බලකා සමීක්ෂණ දත්ත ආශ්‍රයෙන් කරන ලද විශ්ලේෂණයකට අනුව සියදිවි නසාගැනීම් වැඩිවීම සඳහ බලපාන සාධක ලෙස විරැකියාව, දික්කසාද වැඩිවීම හා මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවීම නිසා ලෙඩ රෝග වලින් බිඳීම සඳහා සියදිවිනසා ගැනීම කැපී පෙනේ. (Knipe et al., 2014)

සියදිවිනසාගැනීම සඳහා බලපාන සමාජ පාරිසරික සාධක පිළිබඳ විග්‍රහ කිරීමේදී ආදායම, රැකියාවේ ස්වභාවය, පවුලේ ආරක්ෂිතභාවය හා සම්බන්ධතාවය, ආගම, ජීවත්වන ප්‍රදේශ, මත්ද්‍රව්‍ය භාවිතය ආදී සාධක මේ සඳහා බලපාන බව හඳුනාගත යුතුය. (Hilner et.a., 2005).

සියදිවිනසා ගැනීම පිළිබඳ ඉහත විමර්ශණය කරන්නට යෙදුනු සාහිත්‍ය විමර්ෂණ වලට අනුව වර්තමාන ලෝකයේ ප්‍රධාන ගැටලුවක් බවට සියදිවිනසා ගැනීම පත්ව ඇතිබව පැහැදිලිය. තවද මේ සඳහා යොමුවන ස්ත්‍රී ජන සංඛ්‍යාවට සාපේක්ෂව පුරුෂ ජනසංඛ්‍යාව ඉහල අගයක් ගන්නා බව පැහැදිලිය.  තවද මේ සඳහා යොමුවන ස්ත්‍රී ජන සංඛ්‍යාවට සාපේක්ෂව පුරුෂ ජනසංඛ්‍යාව ඉහල අගයක් ගන්නා බව පැහැදිලිය. එනම් 1 : 3 වශයෙනි. මේ ආකාරයට සියදිවි නසා ගැනීම් සඳහා මිනිසාට විවිධාකාර සාධක බලපාන අතර එම සාධක හේතු කොටගෙන විවිධ ක්‍රමවේදයන් යොදාගනිමින් සියදිවිසනා ගැනීමට යොමු වී ඇත.

**සාරාංශය**

මෙම පර්යේෂණයට අනුව  වර්තමානය වන විට දල වශයෙන් ලෝකයේ මිනිසුන් ලක්ෂ 8 - 10 ත් අතර සංඛ්‍යාවක් සියදිවි නසා ගැනීම නිසා ජීවිතය නැතිකර ගන්නා අතර එය 100,000 ට 11.4 ක් වේ.  ශ්‍රී ලංකාවේ වාර්තා වන ප්‍රමාණය 2012 වර්ෂය වන විට 100,000 ට 28.8 පමණ වේ.ඒ අනුව ලංකාව සිවුවන ස්ථානයෙන් වාර්ථා වේ. තවද ශ්‍රී ලංකාවේ මේ සදහා භාවිත වන ක්‍රමවේදයන් කලින් කලට වෙනස් වි ඇති අතර සියදිවි නසා ගැනීම සදහා බලපාන සාධක කිහිපයක් හදුනාගත හැකිය.ඒ අතර පවුල් ආරවුල් ප්‍රධාන සාධකය ලෙස දැක්වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

බණ්ඩාරණායක අභය 1999, *සියදිවිනසා ගැනීම මනෝ විද්‍යාත්මක විග්‍රහයක්*, සාර ප්‍රකාශකයෝ හා මුද්‍රණ ශිල්පියෝ- කොට්ටාව

පෙරේරා ස්වර්ණලතා එම්.සී. 2004, *සමාජ ප්‍රශ්න*, s and s ප්‍රින්ටර්ස් කොළඹ

Balasooriya, N. N., & Kularathne, M. G. (2016). *Trends of risk factors of completed suicide by gender and age*, *8*(July), 115–120.

http://doi.org/10.5897/JPHE2016.0814

Department of Census and Statistics. (2006). *Sri Lanka Demographic and Health Survey* 2006-07, 201.

Desapriya, E. B. R. (2004). Demographic risk factors in pesticide related suicides in Sri Lanka. *Injury Prevention*, *10*(2), 125–125. http://doi.org/10.1136/ip.2003.004283

Knipe, D. W., Metcalfe, C., Fernando, R., Pearson, M., Konradsen, F., Eddleston, M., & Gunnell, D. (2014). Suicide in Sri Lanka 1975 – 2012 : age , period and cohort analysis of police and hospital data, 1–13.

Paper, O. (2008). Psychological autopsy study of suicide in three rural and semi-rural districts of Sri Lanka, 280–285. http://doi.org/10.1007/s00127-008-0307-3

Rajapakse, T., Griffiths, K., Christensen, H., & Cotton, S. (2014). A comparison of non-fatal self-poisoning among males and females , in Sri Lanka. http://doi.org/10.1186/s12888-014-0221-z

Silva, V. A. De, Senanayake, S. M., Dias, P., & Hanwella, R. (2012). From pesticides to medicinal drugs : time series analyses of methods of self-harm in Sri Lanka, (September 2011), 40–46. http://doi.org/10.2471/BLT.11.091785

Silva, V. De, Hanwella, R., & Senanayake, M. (2012). Original article Age and sex specific suicide rates in Sri Lanka from, *3*(December), 7–11.

SUICIDE TRENDS IN SRI LANKA 1880- 2006 ; SOCIAL , DEMOGRAPHIC AND GEOGRAPHICAL VARIATIONS. (2006).

World Health Organization. (2014). *Preventing suicide: A global Imperative*. http://doi.org/ISBN: 978 92 4 156477 9

# ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ වත්මන් ප්‍රවණතා හඳුනා ගැනීම

කේ. පී. එල්. මධුභාෂිණී[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ තේ වල රසය හා සුවඳ සඳහා ලෝකයේ දක්නට ලැබෙන්නේ ඉතා ඉහළ පිළිගැනීමකි. ශතවර්ෂයකට අධික කාලයක සිට තේ කර්මාන්තය රැකියා, අපනයන ආදායම, රජයේ ආදායම් සම්බන්ධයෙන් විශාලතම සැපයුම්කරු බවට පත්ව තිබේ. කෙසේ වෙතත් කෙන්යාව වැනි නැගී එන නිෂ්පාදකයන් නිසා වෙනත් රටවලට සිය තත්වය පවත්වා ගැනීමේදී දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වී තිබේ. මෙම අධ්‍යයනය තුළින් තේ වගාවේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම, ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ තේ අපනයනය, ශ්‍රී ලංකාවේ තේ මිල හා ද්විතික දත්ත භාවිතයෙන් ඒවායේ වෙනස් වීම් සම්බන්ධව විශ්ලේෂණයක් ද සිදු කොට තිබේ. තවද දත්ත විශ්ලෙෂණය මගින් පැහැදිලි වන්නේ තේ කිලෝවක් සඳහා ගොවියෙක් සඳහා ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් තේ කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන බවයි. එමෙන්ම තේ නිෂ්පාදනය සඳහා ගෙවන මිල විශාල ලෙස වැඩි වීමක් පෙන්නුම් කළ ද එයට සාපේක්ෂව තේ නිෂ්පාදනය එතරම් වර්ධනයක් පෙන්නුම් නොකරයි.

**මුඛ්‍ය පදඃ තේ නිෂ්පාදනය, අපනයනය, මිල**

## හැඳින්වීම

තේ ගසෙහි උද්භිත විද්‍යාත්මක නාමය කැමිලියා සිනෙන්සිස් වේ. මෙම ශාකය 3m ට වඩා උසට වැඩෙයි. සුදු පැහැති කුඩා මල් හටගන්නා අතර තේ ඇට කොල පැහැයකින් යුක්ත වේ. තේ වගාවේදී මෙම ගස වඩා උස් වීමට ඉඩ නොතබන අතර එය කප්පපාදු කිරීමකට ලක් කරනු ලැබේ. කප්පාදු කිරීම කරනු ලැබෙන්නේ වඩාත් දළු ලබා ගැනීමේ පරමාර්ථයෙනි. තේ පඳුරක් වර්ධනය වීම පිණිස 1250mm අවම වර්ෂාපතනයක් අවශ්‍ය වේ. උෂ්ණත්වය මෙන්ම පින්න සහිත පරිසරය ද ඊට සුදුසු පසක් තිබීමද අත්‍යාවශ්‍යය සාධක වේ.

ලෝකයේ තේ වගාවේ ආරම්භය පිළිබඳව කරුණු සොයා බැලීමේදී තේ ගස නැගෙනහිර ඉන්දියාවේ , උතුරු තායිලන්තයේ හා දකුණු චීනයේ කඳුකර

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය kplmadhubhashini@gmail.com

කැළෑ ප්‍රදේශ වල ඉබේ හටගත් පැල විශේෂයකි. තේ කර්මාන්තය වේගවත්ව සංවර්ධනය වූයේ චීනයෙන් හා ජපානයෙනි. චීනයෙන් ජපානයට තේ ප්‍රචලිත වූයේ ක්‍රි. ව. 1000 දීය. මෙම රටවල තේ පාන උත්සව ආදී විවිධ සංස්කෘතික අංග තේ පානය ආශ්‍රිතව පවත්වා තිබේ. යුරෝපීය ජනයා විසින් චීනයේ තේ පඳුරු දැක ඔවුන්ගේ රටවලට ද රැගෙන ගොස් වගා කරනු ලැබූහ.

ලන්දේසි නැගෙනහිර ඉන්දියා සමාගම ක්‍රි. ව. 1602 දී තේ ආනයනය කරනු ලැබූවේ පෝලන්තයෙනි. එය ප්‍රථමයෙන් තේ අපනයනය කල යුරෝපීය දේශයයි. 17 වන සියවස මැද භාගය වන විට පෝලන්තය විසින් තේ පැළය එංගලන්තයට හඳුන්වා දෙනු ලැබීය. මින් වසර පනහකට පමණ පසුව තේ වගාවෙන් ලාභ ඉපයීමේ අරමුණින් බ්‍රිතාන්‍යන් විසින් සිය යටත් විජිත අධිරාජ්‍ය වූ ඉන්දියාවට හා ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දෙනු ලැබුවේය (සිල්වා, 2005).

ශ්‍රී ලංකාවට මුලින්ම තේ පැළය හඳුන්වා දුන්නේ ලන්දේසින් බවට මතයක් වෙතත් එහි සත්‍ය අසත්‍යතාවය වඩාත් පැහැදිලි නොවේ. 1839 දී මුල්වරට තේ පැළය මෙරටට හඳුන්වා දී තිබේ. පේරාදෙණිය උද්භිත උද්‍යානයේ අධ්‍යක්ෂකවරයෙක්ව සිටි එච්. ට්‍රීමන් 1886 වර්ෂයේ පරිපාලන වාර්තාවක මේ බව කරුණු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවට මුල් වරට 1839 දී ඇසෑම් වර්ගයේ තේ හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ ඉන්දියානු උද්භිත විද්‍යා විශේෂඥයකු වන ආචාර්ය වොලික්ටය. මුල් වරට ඇට තේ පේරාදෙණිය උද්භිත උද්‍යානයේ සිටවනු ලැබුවේය ( සිල්වා, 2005).

තේ වගාව හඳුන්වා දුන් මුල්ම යුගයේ සිටවූ බීජ තේ පැළවල ආර්ථික ආයු කාලය වසර 60-70 හෝ ඊට වැඩි කාලයක් බව කියැවේ. බීජ තේ වගාවෙන් රිකිලි තේ වගාවට යොමු වූ අතර රිකිලි තේ වගාවක ආර්ථික ආයු කාලය දිවයිනේ තේ වගා කරන විවිධ ප්‍රදේශ අනුව වසර 30-35 ක් වන බවට අනුමාන කෙරිණි. අද වුවද පහතරට කලාපයේ ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වතුවල වසර 30 කට ආසන්න එලදායී රිකිලි තේ වගාවන් පවතී (මහින්දපාල, 2012). භූමියේ පිහිටීම, දේශගුණික සාධක අනුව ප්‍රධාන තේ වගාවන් තුනකි. එනම් උඩරට තේ, මැදරට තේ, පහතරට තේ වශයෙනි.

එක් එක් අංශයන්ට සුවිශේෂ වූ යම් යම් ලක්ෂණ සැලකිල්ලට ගත්තද පහතරට ප්‍රදේශයේ කුඩා තේ වගාවක් වසර 20-25 ක් වත් පවත්වා ගත යුතු බවට අපේක්ෂා කල හැකිය. තත්වය එසේ වුවත් මෑත කාලීනව නැවත වගාවට යොමු කරන ලද සැලකිය යුතු කුඩා තේ ඉඩම් ප්‍රමාණයක් එසේ යොමුව ඇත්තේ සිටුවා වසර 12-14 ක් ගත වීමෙන් පසුව බව පෙනී ගොස් තිබේ. එනම් මෙම තේ වගාවල ආර්ථික ආයු කාලය 12-14 කට පමණ අඩු වී ඇත. පහතරට තේ වගාවේ වැඩිම අස්වනු දෙන කාල සීමාව වන්නේ වසර 9-12 ත් අතර කාලයයි. නමුත් දැන් සිදුවන බේදවාචකය නම් උපරිම අස්වැන්නක්

ලැබිය යුතු කාල සීමාවක තේ වගාව ගලවා නැවත වගා කිරීමට සිදු වීමයි. එනම් ආයු කාලය අඩු වීමයි. තේ පැළයක ආයු කාලය අඩු වීම සඳහා බලපාන හේතු සාධක රාශියකි (මහින්දපාල, 2012).

ලංකාවේ වගා කර ඇති බෝග වර්ගය අනුව වැඩිම වතු සංඛ්‍යාවක් වන 4909 ක් වගා කර ඇත්තේ පොල් ය. දෙවනුව තේ වගාව යටතේ වතු 2222 ක් ද , තෙවනුව රබර් වගාව යටතේ වතු 1990 ක් ද වගා කර ඇත. 2002 සංගණන වර්ෂය සමඟ සසඳන විට පොල් වතු සංඛ්‍යාව 767 කින්ද රබර් වතු සංඛ්‍යාව 659 කින්ද තේ වතු සංඛ්‍යාව 482 කින්ද වැඩි වී තිබේ. එසේ වුවද 2002 සංගණන වර්ෂය හා සැසඳීමේදී වගා කරන ලද බිම් ප්‍රමාණය අනුව (ක්‍රමවත් හා විසිරි වගාව යටතේ ) පොල් හා රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය වැඩි වී තිබුණද තේ වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 293938 සිට 234124 දක්වා අක්කර 59814 කින් අඩු වී තිබේ. එම අඩුවීම ප්‍රතිශතයක් ලෙස 20.3% කි. ( ආර්ථික සංගණනය 2013/2014 )

තවද කලක් ශ්‍රී ලංකාව ලොව ප්‍රධානම තේ අපනයනකරු වීමේ ගෞරවයද 2016 වනවිට ලොව ප්‍රධානම අපනයනකරුවන් අතර සිව්වන ස්ථානය හිමි කර ගැනීමත් වැදගත් කරුණු වේ.

වගුව 01: ලෝකයේ ප්‍රධාන තේ අපනයන කරුවන්

| **රට** | **තේ නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් )** | **ලෝකයේ තේ අපනයනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|
| චීනය | 1924457 | 36% |
| ඉන්දියාව | 1208780 | 22.6% |
| කෙන්යාව | 432400 | 8% |
| ශ්‍රී ලංකාව | 340230 | 6.3% |

මූලාශ්‍රය: https://top5ofanything.com/list/d0fb35cf/Tea-producing countries-2016-06-22

දැනට මුලු තේ නිෂ්පාදනයෙන් 72% ක් පමණ නිපදවන්නේ කුඩා තේ වතු ආශ්‍රිතව ලබා ගන්නා තේ දළු වලිනි. ඉතිරිය නිපදවන්නේ වතු සමාගම් වලින් පාලනය වන විශාල වතු වලිනි ( Ministri of plantation industries, 2013 ). බිම් සංවර්ධනයේ සිට පැළ සිටුවීම, නඩත්තුව, දළු නෙලීම සහ තේ දළු සැපයීම දක්වා වූ දීර්ඝ ක්‍රියාවලියකට කුඩා තේ වතු හිමියන් විශාල කාර්යය භාර්යයක් ඉටු කරයි. ඉහල යන කෘෂි රසායන මිල, යෙදවුම් මිල, අයහපත්

දේශගුණික සාධක ප්‍රධාන වශයෙන් මොවුන් මුහුණපාන ගැටලු වේ. ලබන ආදායම අඩු වීමෙන් ළමයින් සහ තරුණ පරම්පරාව කර්මාන්තයෙන් ඉවත් වී නගරයට සංක්‍රමණය වීම සිදු වෙයි. මෙය කම්කරු හිඟයට තදින්ම හේතු වී ඇත. තවද බොහෝ ගොවීන්ගේ තේ වගාව සම්බන්ධයෙන් විද්‍යානුකූල දැනුම ඉතා පහත් මට්ටමක මෙන්ම සාම්ප්‍රධායික මට්ටමක පවතී.

නමුත් ක්ෂණික මුදල් උපයන්නන් විසින් නීති විරෝධී ලෙස රසායන ද්‍රව්‍ය එකතු කිරීම, විනාශ කල යුතු, යල් පැන ගිය, මිනිස් පරිභෝජනයට නුසුදුසු තේ තොග වලින් බාල තේ නිපදවීම, හොර රහසේම අනියම් ක්‍රම ඔස්සේ විදේශයන්ට අපනයනය කිරීම මඟින් සිලෝන් තේ නාමයට විශාල කැළලක් සිදු වී ඇත (සමරවීර, 2011/05/13).

තේ කර්මාන්තය යනු ශ්‍රී ලංකාව තුල කතාබහට ලක්වන වැදගත් මාතෘකාවකි. වැවිලි කර්මාන්තය තුළ තේ කර්මාන්තය වැදගත් වනවා මෙන්ම වර්තමානය වන විට තේ කර්මාන්තය තුළද කුඩා තේ වතු අංශයේ දායකත්වය වැදගත් වෙයි. එම නිසා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ වැවිලි කර්මාන්ත අංශයේ දායකත්වය පුළුල් කිරීම සඳහා තව දුරටත් කුඩා තේ වතු අංශයේ දායකත්වය පුළුල් කිරීම වැදගත් වෙයි.

### ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය ගතහොත් ඉන් 61% ක් පහත් බිම් ආශ්‍රිතවත් 22% ක් උස් බිම් ආශ්‍රිතවත් 17% බිම් ආශ්‍රිතවත් නිපදවනු ලැබේ. මුළු තේ නිෂ්පාදනය අනුව 72% ක් කුඩා තේ වතු හිමියන්ද 28% ක් වතු හිමියන් විසින් ද නිෂ්පාදනය කරනු ලැබේ. ( Ministri of plantation industries, 2013 )

වගුව 02: ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය, භූමි ප්‍රමාණය හා නිෂ්පාදන පිරිවැය

| වර්ෂය | නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලියන) | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | නිෂ්පාදන පිරිවැය (RS/Kg) |
|---|---|---|---|
| 2005 | 317.2 | 211780 | 149.13 |
| 2006 | 310.8 | 215579 | 161.98 |
| 2007 | 304.6 | 210244 | 210.75 |
| 2008 | 318.6 | 211876 | 231.49 |
| 2009 | 291.1 | 208633 | 269.01 |
| 2010 | 331.4 | 204619 | 313.17 |
| 2011 | 327.5 | 206104 | 355.02 |
| 2012 | 328.4 | 203020 | 390.89 |
| 2013 | 340.0 | 202408 | 422.67 |

මූලාශ්‍රය: Ministri of plantation industries (2013 )

තේ නිෂ්පාදන ප්‍රමාණය වසරෙන් වසර ඉහළ ගිය බවක් පෙන්නුම් කරන ලද අතර නිෂ්පාදන පිරිවැයද ක්‍රමක්‍රමයෙන් ඉහළ යන බවක් පෙන්නුම් කරයි. 2005 වර්ෂය වනවිට නිෂ්පාදන පිරිවැය 149.13 ක් වුව ද එය 2013 වන විට 422.67 දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබේ. එමෙන්ම වගා කරන ලද භූමි ප්‍රමාණයද 2013 වන විට අඩු වීමක් දැක ගත හැකිය.

ප්‍රස්ථාරය 01: තේ නිෂ්පාදන ප්‍රමාණය හා පිරිවැය




මූලාශ්‍රය: Ministri of plantation industries (2013 )

වසර 2005 සිට 2013 දක්වාම තේ නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩි වීමක් දක්නට නොලැබේ. එනම් සැලකිය හැකි වෙනස් වීමක් දක්නට නොලැබෙන අතර සුළු වෙනස් වීමක් පමණක් දැක ගත හැකි වේ. නමුත් තේ කිලෝවක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය සීඝ්‍ර ලෙස වැඩි වීමක් දැකගත හැකි වේ. 2005 දී රුපියල් 149.13 ක්ව පැවති තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය 2013 වන විට රුපියල් 422.67 ක් ලෙෂ සීඝ්‍ර වැඩි වීමක් දැක ගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය අතීතයේ අපනයන අතින් විශාල ප්‍රමාණයක් හිමි කර ගත්තද වර්තමානය වන විට එසේ නොවේ. වර්තමානය වන විට විශාලතම අපනයන කර්මාන්තය වන්නේ ඇඟළුම් කර්මාන්තයයි. නමුත් රටේ දේශපාලනිකව වැදගත්ම අපනයන කර්මාන්තය වන්නේ තේ කර්මාන්තයයි. තේ කර්මාන්තයෙන් සෘජුව හා වක්‍රව ජීවිකාව සපයා ගන්නා ප්‍රමාණය නිමි ඇඳුම් කර්මාන්තයට වඩා වැඩිය. එපමණක්ද නොව ලංකාව වෙත බලපෑම් එල්ල කිරීමට බටහිර රටවල් වලට නිමි ඇඳුම් කර්මාන්තයනැති කර දැමීමට හැකි වුවද තේ කර්මාන්තයට එම රටවලට බලපෑම් කල නොහැක. මේ නිසා යම් හෙයකින් නිමි ඇඳුම් කර්මාන්තය බටහිර රටවල් විසින් විනාශ කරනු ලැබුවත් එයින් රැකියා අහිමි වන ජනගහනයට පිහිටට ඇත්තේ ද තේ ඇතුළු වෙනත් වැවිලි බෝග කර්මාන්තයයි. මේ නිසා තේ කර්මාන්තය රැකබලා

ගැනීම ආර්ථික මෙන්ම දේශපාලන වැදගත් කමකින්ද යුක්තය. ලෝකයේ මිල වැඩිම තේ ලංකාවේ තේ වන නිසා බොහෝ රටවල් ලංකාවේ තේ භාවිතය අඩුකර මිල අඩු තේ පානය කිරීමේ ප්‍රවණතාවයක් පවතී ( චන්ද්‍රප්‍රේම, 2012/04/23).

වර්තමානය වන විට අපනයන අතින් තේ නිෂ්පාදනයෙන් හතර වන ස්ථානයේ සිටින ශ්‍රී ලංකාව 2004 වසරේදී තේ අපනයනය අතින් හිමි කර ගත්තේ දෙවන ස්ථානයයි. නමුත් කෙන්යාව, ඉන්දියාව, චීනය වැනි රටවල් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම, දියුණු තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, පර්යේෂණ සිදු කිරීම මගින් ප්‍රමිතියෙන් ඉහළ ප්‍රමාණාත්මකව වැඩි වශයෙන් තේ නිෂ්පාදනය කිරීමෙන් සාම්ප්‍රදායික ක්‍රම වලට හුරු වී සිටින අපේ කර්මාන්තයේ නියැලෙන්නන් දැඩි ව්‍යාකූල තත්වයකට පත් වී හමාරය. කෙසේ වුවද මේ තත්වයෙන් ගොඩ ඒම සඳහා විවිධ අංශ විවිධ ක්‍රියා මාර්ග ගනිමින් සිටී. විශේෂයෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මේ සඳහා විවිධ වැඩපිළිවෙළවල් දියත් කර තිබේ (සමරවීර, 2011/05/13).

### ශ්‍රී ලංකාවේ තේ අපනයනය

තේ පැළ සිටුවීමේදී දැරීමට සිදු වී ඇති පිරිවැය අධික විම, හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්නේ වැඩිවීමක් අපේක්ෂා කළ නොහැකි වීම, රුපියල අවප්‍රමාණය විම යන කරුණු හේතුවෙන් ශ්‍රී ලංකාව ලොව විශාලතම තේ අපනයනකරුව සිට සිව්වන ස්ථානය දක්වා පසු බැසීමකට ලක් වී තිබේ.

ප්‍රස්ථාරය 02: ශ්‍රී ලංකාවේ තේ අපනයනය




මූලාශ්‍රය: Ministri of plantation industries (2013 )

ශ්‍රී ලංකාවේ තේ අපනයනය 2000 වර්ෂයේ සිට දළ වශයෙන් සුළු වැඩි වීමක් දැකගත හැකි නමුත් එය යම් යම් උච්චාවචණයන්ට ලක් වී තිබේ. 2000

වර්ෂයේ අපනයනය කිලෝ ග්‍රෑෆම් මිලියන 281.4 කි. එය 2013 වර්ෂය වන විට කිලෝ ග්‍රෑෆම් මිලියන 306.0 ක් ලෙස වැඩි වී තිබුනද එය සැලකිය යුතු ප්‍රමාණයේ වැඩි වීමක් පෙන්නුම් නොකරයි. ඉහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් ද ඒ බව පැහැදිලි වේ.

## ශ්‍රී ලංකාවේ තේ මිල

ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන් සඳහා සාමාන්‍ය තේ දළු මිල 2013 වර්ෂය වන විට ඌව උස් බිම් ආශ්‍රිතව කි.ග්‍රෑ. එකක් රුපියල් 55.61 ක් ලෙසත්, බටහිර උස් බිම් ආශ්‍රිතව එය රුපියල් 61.41 ක් ලෙසත්, බටහිර මැදි බිම් වල රුපියල් 58.72 ක් ලෙසත් ඌව මැදි බිම් වල රුපියල් 60.44 ක් ලෙසත් පහත් බිම් ආශ්‍රිත තේ සඳහා රුපියල් 69.05 ක් ලෙසත් සඳහන් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ වැඩිම මිලක් හිමි වන්නේ පහතරට තේ සඳහාය ( Ministri of plantation industries, 2013 ).

ප්‍රස්ථාරය 03: ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන් සඳහා තේ දළු මිල




මූලාශ්‍රය: Ministry of plantation industries (2013 )

කොළඹ තේ වෙන්දේසියෙහි 2002 වර්ෂයේ කිලෝ ග්‍රෑෆම් එකක් රුපියල් 150.28 කි. එය ක්‍රමක්‍රමයෙන් වැඩිවෙමින් 2013 වන විට රුපියල් 444.42 ක් දක්වා වැඩි වී තිබේ.

මෙම අධික මිලට හේතු වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම විශාල වතු වල අඩු නිෂ්පාදනයයි. කුඩා තේ වතු හිමියන් වතු වලට වඩා දෙගුණයකටත් වඩා අස්වැන්නක් ලබා ගනියි. වැඩි අස්වැන්නක් ලැබීම සඳහා වතු හිමියන් කල යුත්තේ කුඩා තේ වතු හිමියන් අනුගමනය කර ඇති ක්‍රියා පිළිවෙතයි. එනම් වැඩි අස්වැන්නක් ලබා දෙන වීපී තේ වගා කිරීම, නිසිකලට පොහොර දැමීම,

පසෙහි ආම්ලික ගතිය පාලනය කිරිම පමණි. නිසි සාත්තුවක් නොකර තියෙන දෙය පමණක් පරිභෝජනය කිරීමේ මානසිකත්වය නිසා තේ නිෂ්පාදනයට වතු හිමියන් කරන්නේ අසාධාරණයකි. ඉහත දක්වූ සුළු පියවර කිහිපය ගන්නේ නම් තේ කිලෝවක මිල සාධාරණමට්ටමකට පහළ වැටෙනු ඇත. එවැන්නක් නොකොට කෙටි කාලීන විසඳුමක් සොයමින් පිට රටින් ලාභ තේ ගෙන්වා මිශ්‍ර කොට අපනයනය කිරීමෙන් මුළු තේ කර්මාන්තයම විනාශ වීමට ඉඩ තිබේ. එමෙන්ම ලංකාවේ වෙළඳනාම පිටරට ප්‍රචලිත කිරීමයි. අපට වඩා නිෂ්පාදන වියදම අඩු රටවල් වලට වඩා අඩු මිලට ලංකාවෙන් තේ අපනයනය කල හැකියැයි සිතීම අතහැරදමා අඩු මිල මත නොව භාණ්ඩයේ ප්‍රමිතිය මත නව වෙළඳපොළවල් සොයා යෑම අනිවාර්යෙන් කල යුතු දෙයකි ( චන්ද්‍රප්‍රේම, 2012/04/23).

**සාරාංශය**

තේ කර්මාන්තය යනු ශ්‍රී ලංකාව තුල කතාබහට ලක්වන වැදගත් මාතෘකාවකි. වැවිලි කර්මාන්තය තුළ තේ කර්මාන්තය වැදගත් වනවා මෙන්ම වර්තමානය වන විට තේ කර්මාන්තය තුළද කුඩා තේ වතු අංශයේ දායකත්වය වැදගත් වෙයි. එම නිසා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ වැවිලි කර්මාන්ත අංශයේ දායකත්වය පුළුල් කිරීම සඳහා තව දුරටත් කුඩා තේ වතු අංශයේ දායකත්වය පුළුල් කිරීම වැදගත් වෙයි. දැනට මුලු තේ නිෂ්පාදනයෙන් 72% ක් පමණ නිපදවන්නේ කුඩා තේ වතු ආශ්‍රිතව ලබා ගන්නා තේ දළු වලිනි. ඉතිරිය නිපදවන්නේ වතු සමාගම් වලින් පාලනය වන විශාල වතු වලිනි. බිම් සංවර්ධනයේ සිට පැළ සිටුවීම, නඩත්තුව, දළු නෙලීම සහ තේ දළු සැපයීම දක්වා වූ දීර්ඝ ක්‍රියාවලියකට කුඩා තේ වතු හිමියන් විශාල කාර්යය භාර්යයක් ඉටු කරයි. ඉහල යන කෘෂි රසායන මිල, යෙදවුම් මිල, අයහපත් දේශගුණික සාධක ප්‍රධාන වශයෙන් මොවුන් මුහුණපාන ගැටලු වේ. ලබන ආදායම අඩු වීමෙන් ළමයින් සහ තරුණ පරම්පරාව කර්මාන්තයෙන් ඉවත් වී නගරයට සංක්‍රමණය වීම සිදු වෙයි. මෙය කම්කරු හිඟයට තදින්ම හේතු වී ඇත. තේ නිෂ්පාදන ප්‍රමාණය වසරෙන් වසර ඉහළ ගිය බවක් පෙන්නුම් කලද නිෂ්පාදන පිරිවැය ක්‍රමක්‍රමයෙන් ඉහළ යන බවක් පෙන්නුම් කරයි. ලෝකයේ මිල වැඩිම තේ ලංකාවේ තේ වන නිසා බොහෝ රටවල් ලංකාවේ තේ භාවිතය අඩුකර මිල අඩු තේ පානය කිරීමේ ප්‍රවණතාවයක් පවතී. වර්තමානය වන විට අපනයන අතින් තේ නිෂ්පාදනයෙන් හතර වන ස්ථානයේ සිටින ශ්‍රී ලංකාව 2004 වසරේදී තේ අපනයනය අතින් හිමි කර ගත්තේ දෙවන ස්ථානයයි. මේ අනුව තේ පැළ සිටුවීමේදී දැරීමට සිදු වී ඇති පිරිවැය අධික විම, හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්නේ වැඩිවීමක් අපේක්ෂා කළ නොහැකි වීම, රුපියල අවප්‍රමාණය විම යන කරුණු හේතුවෙන් ශ්‍රී ලංකාව ලොව විශාලතම තේ අපනයනකරුව සිට සිව්වන ස්ථානය දක්වා පසු බැසීමකට ලක් වී තිබේ. මෙම අධික මිලට හේතු වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම විශාල වතු වල අඩු නිෂ්පාදනයයි. අපට වඩා නිෂ්පාදන වියදම අඩු රටවල් වලට වඩා අඩු මිලට

ලංකාවෙන් තේ අපනයනය කල හැකියැයි සිතීම අතහැරදමා අඩු මිල මත නොව භාණ්ඩයේ ප්‍රමිතිය මත නව වෙළඳපොළවල් සොයා යෑම අනිවාර්යෙන් කල යුතු දෙයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


සිල්වා ආර්. (2005). *ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය.* රාජගිරියඃ කේ. එස්. යූ. ග්‍රැෆික්.

සේනානායක එස්. එම්. පී. (2008). *කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව.* මාලිගාවත්තඃ ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

චන්ද්‍රප්‍රේම. සී. ඒ (2012/04/23). *තේ කර්මන්තයේ අර්බුදයක්.* දිවයින.

සමරවීර. එම්. කේ. ( 2010/05/13). වළ පල්ලට යන තේ කර්මාන්තය. retrieved from E:\Tea indrusty thesis\TEA_files**වළ පල්ලට යන තේ කර්මාන්තය**_php.mht

Ministri of plantation industries. (2015). statistical information on plantation crops 2013. Sri lanka: department of government printing.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. (2015). ආර්ථික සංගණනය 2013/2014. කොළඹඃ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

ලෝක ආර්ථික අර්බුදය හමුවේ අපේ විදේශ වෙළඳාම. Retrieved from http://www.divaina.com/2009/12/10/feature01.html 2016-10-10

ජයසුන්දර. ඩී වී. වී. තේ කර්මාන්තය විනාශ කිරීමට පිඹුරුපත් හදලා අවසානයි. දිවයින. Retrieved from http://www.divaina.com/2016/02/19/provin02.html

රත්නවීර. ටී. ලංකාවේ හීන වනසන තේ කෝප්පයේ කුණාටුව. Retrieved from http://www.divaina.com/2015/05/17/nimna07.html

තේ කර්මාන්තය අනතුරේ. Retrieved from http://vigasapuwath.blogspot.com/2016/10/blog-post_289.html

# කර්තෘ නාමාවලිය


දසනායක. ඩී. එම්. එච්. .......... 54

පතිරාජ. එම්.පී.ඒ.ඩබ්ලිව්. .......... 60

පෙරේරා.එල්.ජී.ඩී. .......... 34

මධුභාෂිණී. කේ. පී. එල් .......... 100

මධුභාෂිණී. පී.එස්. .......... 91

රත්නායක.එච්. පී. එන්. එන් .......... 9

යසින්තා. එම්. එල්. සී. .......... 17

Madushani.H. D. P. .......... 26

Moragolla.U.R.G.D.A.K .......... 1

Nayomi.W.V.P.M. .......... 47

Senavirathne.K.B.R. .......... 82

Weerasinghe.M.W.A.S.M. .......... 73